දෑතේ යදම් හැර නැතිවීමට කිසිවක් නැත ! දිනාගැනීමට ලෝකයක් ඇත !
සකල දේශවාසී නිර්ධනයිනි එක්වව් !

# වර්ෂ 1984
# විප්ලවීය ජාත්‍යන්තර ව්‍යාපාරයේ ප්‍රකාශනය



Centrel Reorganisation Committee, Communist Party of India (Marxist-Leninist)
Ceylon Communist Party
Communist Collective of Agit/Prop [Italy]
Communist Committee of Trento [Italy]
Communist Party of Bangladesh (Marxist-Leninist) [BSD (M-L)]
Communist Party of Colombia (Marxist-Leninist), Mao Tsetung Regional Committee
Communist Party of Peru
Communist Party of Turkey/Marxist-Leninist
Haitian Revolutionary Internationalist Group
Nepal Communist Party (Marshal)
New Zealand Red Flag Group
Revolutionary Internationalist Contingent [Britain]
Proletarian Communist Organisation, Marxist-Leninist [Italy]
Proletarian Party of Purba Bangla (Bangladesh)
Revolutionary Communist Group of Colombia
Leading Committee, Revolutionary Communist Party, India
Revolutionary Communist Party, USA
Revolutionary Communist Union [Dominican Republic]
Union of Iranian Communists (Sarbedaran)

අද ලෝකය පවතින්නේ භාරදූර සිද්ධීන් වල එළිපත්ත මතය. අධිරාජ්‍යවාදී ක්‍රමයේ අර්බුදය, නව තුන්වන ලෝක යුද්ධයක් පැන නැගීමේ අනතුර ඉතා සීඝ්‍රයෙන් ගෙන එමින් තිබෙන්නාසේම, ලෝකය මුලුල්ලේම රටවල් විප්ලවය සඳහා වන පර්යාලෝකයක්ද ගෙන එමින් තිබේ. 1980 සරත් ඍතුවේදී පවත්වන ලද අපේ පළමුවන ජාත්‍යන්තර සම්මේලනයේ ඒකාබද්ධ ප්‍රකාශනයෙහි එල වන මෙම වචනවල විද්‍යාත්මක නිරවද්‍යතාවය ලෝකයේ මෑත කාලීන සංවර්ධනයන් විසින් සම්පූර්ණයෙන්ම පෙන්නුම් කරනු ලැබ තිබෙනවා පමණක් නොව, එම කාලයේ පටන් තව දුරටත් අවධාරණය කොට හා උග්‍ර කොට තිබේ.

මෙලෙස මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරය ඉදිරියට නිර්මාණය වෙමින් තිබෙන දැවැන්ත අභියෝගයක් හා භාරදූර සංග්‍රාමයන් සඳහා එහි බලමුළු තවදුරටත් එක්සත් කිරීමේ හා සූදනම් කිරීමේ අත්‍යන්තයෙන්ම බරපතල වගකීමකට මුහුණ දී සිටියි. නිර්ධන පංතියේ ඓතිහාසික දූත මෙහෙවර අන් කවරදකටත් වඩා හදිසිව හඬගාන්නේ සංවර්ධනයන්ගේ, විශේෂයෙන්ම ජාතික වර්ධනයන් ලෝක පරිමාණ වර්ධනයන් මගින් වඩා ගැඹුරු ලෙස බලපාමින් තිබෙන්නාවූ ද විප්ලව සඳහා පෙර නොවූ විරූ පර්යාලෝකයන් සැකසෙමින් තිබෙන්නාවූද මෙම වත්මන් සන්ධිස්ථානයේදී ඇතිවන හදිසි වෙනස්වීම් හා පිම් සඳහා සම්පූර්ණ සූදනමක් ඇති කර ගැනීමටය. අපගේ පංතිවල ප්‍රයෝජනද ලෝක නිර්ධන පංති විප්ලවය සඳහා අත්කර ගත හැකි ඉතාමත්ම දියුණු ස්ථාන ජය ගැනීමද සඳහා මෙම අවස්ථාවන් හැකි ඉතාම හොඳ ආකාරයෙන් උපයෝගී කරගනු පිණිස අපි අපේ විප්ලවීය සුපරීක්ෂාකාරීත්වය තියුණු කර ගත යුත්තෙමු. අපේ දේශපාලන, දෘෂ්ඨිමය, සංවිධානමය හා යුදමය සූදනම වර්ධනය කර ගත යුත්තෙමු.

මාක්ස්, එංගල්ස්, ලෙනින්. ස්ටාලින් හා මාඕ සේතුංගේ විද්‍යාත්මක ඉගැන්වීම් වලින් සන්නද්ධව සිටින අපි වත්මන් තත්ත්වය තුළ අපෙන් බලාපොරොත්තු වන කාර්යභාරයන් පිළිබඳ සම්පූර්ණයෙන්ම සවිඥානකව සිටින අතරම, මෙම ඓතිහාසික වගකීම පිළිගෙන ඒ අනුව ක්‍රියා කරන්නට ලැබීම ගැන ආඩම්බර වෙමු.

මාඕ සේතුංගේ මරණින් පසු චීනයේ ඇතිවූ ප්‍රතිගාමී කුදෙතාවෙන් ද (කුමන්ත්‍රණය) අන්වර් හෝජාගේ ද්‍රෝහී පාවාදීමෙන් ද පසු පෙරට පැමිණි ගැඹුරු හා බරපතල අර්බුදයකට මාක්ස් - ලෙනින්වාදී ව්‍යාපාරය දිගටම මුහුණදී සිටියි. කෙසේවුවද මේ ආපසුහැරීම් තිබියදී සියලුම මහද්වීප වල කොමියුනිස්ට්වාදය සඳහා අරගලය අත් හැරීම ප්‍රතික්ෂේප කර තිබෙන සැබෑ මාක්ස් - ලෙනින්වාදීහුද සිටිති.

ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය, තවදුරටත් තහවුරු කරන ලද එක්සත්භාවයේ ක්‍රියාවලිය ඔස්සේ සංවර්ධනය වෙමින්ද, මාක්ස් - ලෙනින්වාදයේ - මාඕ සේතුං චින්තනයේ විද්‍යාත්මක මූලධර්ම ඔස්සේ ඉදිරියට යමින් පවතියි. 1980 සිට අපි අපේ ශක්තිය සංවර්ධනය කරගෙන තිබෙන අතර, සංවර්ධනයන්ට බලපෑමේ හා ඒවා මෙහෙයවීමේ අපේ හැකියාව වර්ධනය කර ගෙන ඇත්තෙමු. අවාසිදයක හා දුෂ්කර තත්ත්වයෙන් තිබියදීත් සාර්ථකව පවත්වන ලද මාක්ස් ලෙනින්වාදී පක්ෂවල හා සංවිධානවල අපේ දෙවන ජාත්‍යන්තර සම්මේලනය අපේ ව්‍යාපාරයේ එක්සත්භාවයේ හා මුහුකුරා යාමේ ගුණාත්මක පිම්මක් නියෝජනය කරයි. කළ යුතුයයි හඬගා කියන කර්තව්‍යයන් මුදුන් පමුණුවා ගත හැක්කේ සංශෝධනවාදී හා ධනේශ්වර මතවාදයට එරෙහිව අනභිභවනීය බාධකයක් ඉදි කිරීම මගින්ය. විද්‍යාත්මක නායකත්වයක් සැපයීම හා නැගී ගෙන එන විප්ලවීය රැලි වල ඉදිරි පෙරමුණේම නැගී සිට ගැනීම මගින්ය. අපේ භාවිතයට මග පෙන්වන මාක්ස් - ලෙනින්වාදයේ, මාඕ සේතුං චින්තනයේ මූලධර්ම සංවිඥානක ලෙස ව්‍යවහාරයට නැගීම හා විප්ලවීය පංති අරගලයේ කෝවෙහි ලා අපේ අත්දැකීම් සම්පිණ්ඩනයට කර ගැනීම මගින්ය.

පහතින් එන ප්‍රකාශනය නිර්මාණය කෙරුණේ විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරය තැනූ මාක්ස් - ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන වල දෙවන ජාත්‍යන්තර සම්මේලනයේදී, නියෝජිතයන් හා නිරීක්ෂකයන් විසින් කරන ලද වෙහෙසකර, විස්තීරණ සාකච්ඡා හා මූලධර්ම මත පදනම් වූ අරගලය ඔස්සේය.

## ලෝක තත්ත්වය

ලෝක අධිරාජ්‍යවාදී ක්‍රමයේ සියලු ප්‍රධාන ප්‍රතිවිරෝධයන් එනම් විවිධ අධිරාජ්‍යවාදී බලවතුන් අතර ප්‍රතිවිරෝධය, අධිරාජ්‍යවාදයද පීඩිත ජනතාවන් හා ජාතීන්ද අතර ප්‍රතිවිරෝධය, අධිරාජ්‍යවාදී රටවල ධනේශ්වර ජාතිය හා නිර්ධන ජාතිය අතර ප්‍රතිවිරෝධය වේගයෙන් මතුවී එමින් පවතී. මේ සියලු ප්‍රතිවිරෝධයන්ට ධනේශ්වර නිෂ්පාදන මාදිලියන්හි ද එහි පදනම් ප්‍රතිවිරෝධයන්හි ද පොදු මූලයක් ඇත්තේය. පිළිවෙලින් එක්සත් ජනපදය හා එක්සත් සෝවියට් සමාජවාදී ජනපදය විසින් නායකත්වය දෙනු ලබන අධිරාජ්‍යය බලවතුන්ගේ කඳවුරු දෙක අතර සතුරුතාව විප්ලවය විසින් එය වලක්වා ලනු නොලැබුවහොත් යුද්ධය කරා මග පෑදීමට ඉරණම වී ඇති අතර මේ සතුරුතාවය ලෝක සිදුවීම් කෙරෙහි විශාල වශයෙන් ප්‍රතිවිපාක ගෙන දෙයි.

පශ්චාත් දෙවන ලෝක යුද්ධ ලෝකය කඩා වැටීම කරා සීඝ්‍රයෙන් ගමන් කරවයි. දෙවන ලෝක යුද්ධ සමයේ හා ඉන්පසු පිහිටුවා ගන්නා ලද ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන සබඳතා - "ලෝකය බෙදීම", තව දුරටත් විවිධ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ ලාභ අධිරාජ්‍යයන් , "සාමකාමීව", පළල් හා ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවයන්ට අනුරූපී නොවේ. අධිරාජ්‍යවාදීන් අතර ගැටුම් වල ප්‍රතිඵලයක් ලෙස හා විශේෂයෙන්ම විප්ලවීය

අරගලයේ ප්‍රථිඵලයක් ලෙස පශ්චාත් දෙවන ලෝක යුද්ධ ලෝකය වැදගත් වෙනස්වීම් ඔස්සේ ගමන් කර ඇති අතරම අද ප්‍රශ්නයට භාජනය වී ඇත්තේ මේ මුළු මහත් ආර්ථික, දේශපාලන හා යුධ සබඳතා ජාලයම ය. ලෝකයේ ජනතාවන්ගේ හා ජාතීන්ගේ සූරාකෑමට ගොදුරු කර ඇති අති බහුතරයේ රුධිරය හා දුක්ඛිතභාවය මත පදනම්ව ඇති ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවේගයන්ගේ සාපේක්ෂ ස්ථායීතාව හා රටවල් අතලොස්සක සමෘද්ධිමත්භාවය බිඳ වැටෙමින් පවතී. පීඩිත ජාතීන්ගේ හා ජනතාවගේ විප්ලවීය අරගල යළිත් නැගෙමින් තිබෙන අතර අධිරාජ්‍යවාදී ලෝක ක්‍රමයට නව ප්‍රහාරයන් එල්ල කෙරෙමින් තිබේ.

මාඕ සේතුං විසින් කරන ලද ප්‍රකාශයක් වන "එක්කෝ විප්ලවය යුද්ධය වළකනවා ඇත. නැතහොත්, යුද්ධය විප්ලවය නගා සිටුවනවා ඇත." යන්න වඩාත් පැහැදිලිව ඇසීමට ඉඩ ලැබී ඇත්තේ හා හදිසි වැදගත්කමක් අත්කර ගෙන ඇත්තේ මේ සන්දර්භය තුළය. අධිරාජ්‍යවාදී ක්‍රමයේ තර්කයම හා විප්ලවීය අරගල නව තත්ත්වයක් සූදනම් කරමින් තිබේ. අධිරාජ්‍යවාදී සතුරු කණ්ඩායම් අතර ප්‍රතිවිරෝධ, අධිරාජ්‍යවාදීන් හා පීඩිත ජාතීන් අතර, අධිරාජ්‍යවාදී රටවල නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර ප්‍රතිවිරෝධයන් සියල්ලම එළඹෙන කාල පරිච්ඡේදයේ දී පෙර නොවූ විරූ පරිමාණයක් මත ආයුධ බලය මගින් තමන්ම ප්‍රකාශයට පත් කර ගන්නවා ඇත. පළමු ලෝක යුද්ධය සම්බන්ධයෙන් ස්ටාලින් පැවසූ පරිදි උපයෝගී කරගැනීමට අසමත් වනු ඇත. ජාත්‍යන්තර ව්‍යාපාරය තුළ විප්ලවීය කොමියුනිස්ට් වාදය සඳහා සමස්ථ අරගලයෙන් වෙන්ව එක රටක් තුළ දැකීමේ ප්‍රවනතාවයන්ට එරෙහිව සටන්වැදිය යුතුය. ඇත්තේ සැබෑ ජාත්‍යන්තර වාදයේ ඒකක සහ එකම වර්ගයක් එනම් තමන්ගේම රටේ විප්ලවවාදී ව්‍යාපාරයේ හා විප්ලවීය අරගලය සංවර්ධනය සඳහා මුළු හදින්ම කටුයුතු කරන අතරම ව්‍යතිරේකයකින් තොරව සෑම රටකම මෙම අරගලයට ආධාර කිරීම (ප්‍රචාරය, සහයෝගය, හා ද්‍රව්‍යමය ආධාර මගින්) පමණි. "මෙය පමණක් එකම ක්‍රියාමාර්ගය වේ." යයි ලෙනින් පෙන්වා දුණි. නිර්ධන පංති විප්ලවවාදීන් ඔවුන්ගේ විප්ලවීය කටයුතු පිළිබඳ ප්‍රශ්නයට "මගේ" රටේ දෘෂ්ඨී කෝණයේ සිට නොව " සූදනම් වීමේ", ප්‍රචාරණයේ සහ ලෝක නිර්ධන පංති විප්ලවය වේගවත් කිරිමේ "මගේ කොටස" පිළිබඳ දෘෂ්ටි කෝණයේ සිට ප්‍රවේශ විය යුතු බව ලෙනින් අවධාරණය කළේය.

## ලෝක නිර්ධන පංති විප්ලවයේ සංයුක්ත කොටස් දෙක ගැන.

සංවර්ධිත ධනපති රටවල් අතලොස්සක් හා ලෙනින් බොහෝ කලකට ඉහතදී, අධිරාජ්‍යවාදීන් පරපෝෂිතමය වශයෙන් කොල්ලකෑ හා බලහත්කාර පරායත්ත භාවය හා පසුගාමීත්වය තුළ පවත්වාගත්, ලෝකයේ භූමි ප්‍රමාණයෙන් හා ජනගහණයෙන් විශාල කොටසකින් තැනුන පීඩිත ජාතීන් විශාල සංඛ්‍යාවක් අතර ලෝකය බෙදිතිබීම විශ්ලේෂණය කළේය. මෙම යථාර්ථය තුළින් ගලායන ලෙනින්වාදී මතය එනම් ලෝක නිර්ධන පංති විප්ලවය අත්‍යවශ්‍යමය ප්‍රවාහ දෙකකින් - අධිරාජ්‍යවාදී බලකොටුවල නිර්ධන පංතිය හා එහි මිතුරන් විසින් දියත් කරනු ලැබ ඇති නිර්ධන පංති සමාජවාදී විප්ලවය හා අධිරාජ්‍යවාදයට යටත්කර ඇති ජාතීන් හා ජනතාවන් විසින් දියත්කරනු ලැබ ඇති "ජාතික විමුක්තිය" හෝ "නව ප්‍රජාතන්ත්‍රවාදී" විප්ලවය යන දෙකෙන් තැනී ඇත්තේය යන්න ඉතිහාසය විසින් සනාථ කරනු ලැබ ඇත. මේ විප්ලවීය ප්‍රවාහයන් දෙක අතර බන්ධනය අධිරාජ්‍යවාදී යුගයේ විප්ලවීය මූලෝපායේ පවතී. දෙවෙනි ලෝක යුද්ධයේ සිට අද දක්වා කාලපරිච්ඡේදයේදී පීඩිත ජනතාවන්ගේ හා ජාතීන්ගේ අරගලය ලෝක විප්ලවීය අරගලයේ කුණාටු කේන්ද්‍රය වී ඇත. අධිරාජ්‍යවාදී රාජ්‍යයන් ගණනාවක සමෘද්ධිය, ස්ථාවරභාවය හා "ප්‍රජාතන්ත්‍රවාදය" අත්පත් කරගෙන තිබෙන්නේ පීඩිත රටවල් ජනතාවගේ සූරාකෑම හා දුක්ඛිතභාවය තීව්‍ර කිරීම මගිනි. ජාතික හා යටත්විජිත ප්‍රශ්නය මුලිනුපුටා දමනවා තබා නව යටත් විජිතවාදයේ සංවර්ධනය මගින් කර ඇත්තේ, ජාත්‍යන්තර ප්‍රග්ධනයේ අවශ්‍යතාවයන්ට මුළුමහත් ජාතීන් හා ජනතාවන් තවදුරටත් යටත්කරගෙන තිබීම හා අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට එරෙහි විප්ලවීය යුද්ධ සමස්ථ මාලාවකට මගපාද තිබීමය.

ලෝක ප්‍රතිවිරෝධයන්ගේ වත්මන් තීව්‍රකරණය මේ ව්‍යාපාරයන් සඳහා තවදුරටත් හැකියාවන් ඇතිකරන අතරම ඒවා ඉදිරියේ නව බාධක හා නව කර්තව්‍යයන්ද ස්ථානගත කෙරේ. පීඩිත ජනතාවගේ විප්ලවීය අරගල කඩාකප්පල් කිරීමේදී හා වළක්වාලීමේදී විශේෂයෙන්ම ඒවා අන්තර්-අධිරාජ්‍ය සතුරුතාවන්ගේ ආයුධ බවට හැරවීමේ අපේක්ෂාවන්හිදී අධිරාජ්‍යවාදී බලවේගයන්ගේ ප්‍රයත්න හා ඇතැම් සාර්ථකත්වයන් තිබියදීම මෙම අරගල අධිරාජ්‍යවාදී ක්‍රමයට බලගතු ප්‍රහාර එල්ල කිරීම සමස්ථයක් ලෙස ලෝකයෙන් විප්ලවීය විභවයන්ගේ සංවර්ධනය කිරීම දිගටම කරගෙන යයි.

බටහිර කඳවුරේ අධිරාජ්‍යවාදී රටවල පශ්චාත් දෙවෙනි ලෝක යුද්ධ කාලපරිච්ඡේදය අධිරාජ්‍යවාදී රාජ්‍යයන් විසින් පීඩිත ජනතාවගේ තියුණු කරන ලද සූරාකෑම සමග වෙන් කළ නොහැකි සේ බැඳුණු මෙම රටවල අධිරාජ්‍යවාදී පාලනයේ සාපේක්ෂ, ස්ථාවර බවක් පිළිබිඹු කරමින් නිර්විප්ලවීය තත්ත්වයක් මගින් අවශ්‍යයෙන්ම සලකුණුවී තිබුණි. එසේ වුවද මෙම රටවල විප්ලවීය මතුබලාපොරොත්තු මෑත මතකයෙහි

> "අවුරුදු දහයකට පෙර පැන නැගුණ අධිරාජ්‍යවාදී යුද්ධයේ වැදගත් කම රැඳී පවත්නේ අනෙක් ඒවා අතර, මේ සියලු ප්‍රතිවිරෝධයන් එකම බුරුත්තකට ඒකරාශී කර කිරා මැන බැලීය, එමගින් නිර්ධන පන්තියේ විප්ලවීය අරගල වේගවත් කිරීම හා ඒවාට පහසුකම් සැපයීම කළේය යන කාරණයෙහිය."

ප්‍රතිවිරෝධයන්ගේ දැඩි වීම කලින් නිද්‍රාවට වැටී සිටි හෝ දේශපාලන ජීවිතයට අවධානයක් නොයෙදූ ලෝකයේ සියලු රටවල් හා කලාපද බහුජන කොටස්ද ලෝක ඉතිහාසයේ දිය සුළිය කරා දැන් ඇදගනිමින් සිටී, අනාගතයේදී ඊටත් වඩා විස්මිත ලෙස ඇද ගන්නවා ඇත. එහෙයින් විප්ලවීය කොමියුනිස්ට්වාදීහු සූදනම් විය යුත්තාහ. ඔවුන්ගේ විප්ලවීය අරගලය වේගවත් කිරීමට පංති විඥානයෙන් යුතු කම්කරුවන් හා ජනතාවගේ විප්ලවීය පාර්ශයන් සූදනම් කළ යුත්තාහ.

කොමියුනිස්ට්වාදීහු, අධිරාජ්‍යවාදී යුද්ධයේ ස්ථිරසාර විරුද්ධවාදීහුය, ඔවුහු මිනිස් වර්ගයාගේ ඉතිහාසයේ සිදුකළ හැකි විශාලතම අපරාධය වනු ඇති තුන්වන ලෝක යුද්ධයක් සඳහා වන සූදනම් කිරීම් වලට එරෙහි අරගලයේදී බහුජනතාව බලමුළු ගන්වා මෙහෙයවිය යුත්තාහ. එහෙත් මාක්ස් ලෙනින්වාදීහු කිසිදිනෙක ජනතාවගෙන් සත්‍ය වසන් නොකරයි. මේ අපරාධය වැලැක්විය හැක්කේ මාක්ස් - ලෙනින්වාදීන් හා විප්ලවීය බලවේග නායකත්වය දෙන, නායකත්වය දීමට සූදනම් වන විප්ලවයට, විප්ලවීය යුද්ධයට පමණක්මය. මාක්ස් - ලෙනින්වාදීහු සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවත්නා විප්ලවීය විභවයන් තරයේ ග්‍රහණය කරගත යුතු අතර හැකි තැන්වල විප්ලවීය යුද ව්‍යාපාරය ආරම්භ කරමින් එවැනි විප්ලවීය යුද ව්‍යාපාරයක් තවමත් මෝරා ගොස් නැති තැන්වල සූදනම් කිරීම් වර්ධනය කරමින් සෑම පෙරමුණකම විප්ලවීය අරගලය වර්ධනය කිරීමට බහුජනතාවට නායකත්වය දිය යුත්තාහ.

මේ ආකාරයෙන් කොමියුනිස්ට් වාදය සඳහා අරගලය පෙරට ගෙන යාමද තීරණාත්මක සංග්‍රාමයන්ගේ මාවතේදී නිර්ධන පංතියේ හා පීඩිත පංතියේ ජනතාවගේ ජයග්‍රහණය නැතිකර ලෝක යුද්ධයක් සඳහා වන අධිරාජ්‍යවාදීන්ගේ වත්මන් රටවල් ගණනාවක කම්කරු පංතියේ පාලනය පිහිටුවා විප්ලවීය අරගලයේ ඉදිරිගමනට වඩා වාසිදයක සමස්ත ලෝක තත්ත්වයක් නිර්මාණය සිදුවනු ඇත. අනෙක් අතට විප්ලවීය අරගලය තුන්වන ලෝක යුද්ධයක් වලක්වාලීමට අසමත්නම් කොමියුනිස්ට්වාදීහුද විප්ලවීය නිර්ධන පංතිය හා බහුජනතාවද එවැනි යුද්ධයක් සහ ඊසමග එන නොවැලැක්විය හැකි පීඩාවන් මගින් උපදවනු ලබන දුෂ්ඨ අපරාධ වලට එරෙහිව ජනතාව බලමුළු ගැන්වීමටද යුද්ධයේ මූලය වන අධිරාජ්‍යවාදයට එරෙහිව එය එල්ල කර සතුරාගේ දුර්වලවූ ශක්තියේ වාසිය අත්කර ගැනීමටද මේ ආකාරයෙන් ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී යුද්ධය අධිරාජ්‍යවාදයට හා ප්‍රතිගාමීත්වයට එරෙහි සාධාරණ යුද්ධයක් බවට පත්කිරීමටද සූදනම්විය යුත්තාහ.

අධිරාජ්‍යවාදය ලෝකය තනි ගෝලීය ක්‍රමයකට ඒකාබද්ධකර ඇති බැවින් (සහ වැඩි වැඩියෙන් එසේ කරන බැවින් ) ලෝක තත්ත්වය වැඩිවැඩියෙන් සෑම රටකම සංවර්ධනයන්ට බලපායි. මෙලෙස ලෝකය පුරාම විප්ලවීය බලවේග සමස්ත ලෝක තත්ත්වය පිළිබඳ නිවැරදි ඇගයීමක් මත තමන්ම පදනම්විය යුතුය. සෑම රටකම විශේෂිත තත්ත්වයන් ඇගයීමේදී ද විශේෂිත මූලෝපාය හා උපක්‍රම සූත්‍රගත කිරීමේදීද විප්ලවීය භාවිතාව සංවර්ධනය කිරීමේදීද මුහුණදෙන තීරණාත්මක කාර්යභාරය මෙයින් නිශේධනය නොකරයි. මාක්ස් ලෙනින් වාදීන් විසින් ගෝලීය මට්ටමේ සමස්ථ තත්ත්වය සහ සෑම රටකම සංයුක්ත තත්ත්වයන් අතර මෙම අපෝහක සබඳ තාවය නිවැරදි ලෙස ග්‍රහණය කර නොගතහොත් ඔවුන් සෑම රටකම විප්ලවයේ යහපත සඳහා ගෝලීය මට්ටමේ අත්‍යන්තයෙන්ම වාසිදයක තත්ත්වය ඕනෑම කාලයකට වඩා වාසිදයකය. මෙම වර්ගයේ රටවල විප්ලවීය තත්ත්වයන් දුර්ලභ සහ සාමාන්‍යයෙන් අද ලෝකයේ හඬගැසෙමින් පවතින අවස්ථාව වැනි ලෝක ප්‍රතිවිරෝධයන්ගේ තිබුණ තීව්‍රවීම සමග සම්බන්ධවී ඇති බව ඉතිහාසය පෙන්වාදී ඇත.

බොහෝ අධිරාජ්‍යවාදී රටවල විශේෂයෙන්ම 1960 ගණන්වල සංවර්ධනය වූ බහුජන විප්ලවීය අරගල, ඒ කාලයේ බලය අල්ලාගැනීමක් සඳහා වාසිදයක තත්ත්වයන් නොතිබුණේය., යන මේ ලෝක ව්‍යාපාරයේ සමස්ථ පිරිහීම සමග පරිහානියට පත්වුණේය., යන කරුණු තිබියදීම මේ රටවල නිර්ධන පංති විප්ලවයේ හැකියාව බලපෑම් සහගත ලෙස විදහා පායි. අද තියුණු වන ලෝක තත්ත්වය, නිදසුන් ලෙස ඇතැම් අධිරාජ්‍යවාදී රටවල නිර්ධන පංතියේ පහල ස්ථරයන්ගේ වැදගත් කැරලි මෙන්ම අධිරාජ්‍යවාදී යුද්ධ සූදනම්වීම් වලට එරෙහිව රටවල් ගණනාවක ශක්තිමත් ව්‍යාපාරයක, ඒ තුළ වඩාත් විප්ලවීය අංශයක්ද ඇතුලත්ව වර්ධනයවීම මගින් පෙන්වන පරිදි මේ රටවල වැඩි වැඩියෙන් පිළිබිඹු වෙමින් තිබේ.

නැගෙනහිර කඳවුරේ ධනවාදී හා අධිරාජ්‍යවාදී රටවල රාජ්‍ය ධනවාදී ධනේෂවරය විසින් ගෙනයනු ලබන පාලනයේ සාපේක්ෂ ස්ථාවර භාවයෙහි වැදගත් පිපිරීම සහ විවරයන් වඩවඩාත් විද්‍යාමාන වෙයි. පෝලන්තයේ නිර්ධන පංතිය හා බහුජනතාවගේ අනෙකුත් පාර්ශවයන් අරගලයේ නැගීසිට ස්ථාපිත ක්‍රමයට බලගතු ප්‍රහාර එල්ලකර ඇත. එසේම මෙම රටවල නිර්ධන පංතිය විප්ලවය සඳහා විභවයන් සංවර්ධනය වෙමින් පවතින අතර, ඒවා ලෝක ප්‍රතිවිරෝධයන්ගේ සංවර්ධනය හා තීව්‍රකරණය මගින් ශක්තිමත් කරනු ඇත.

දෙවර්ගයට අයත් රටවල විප්ලවීය මූලයන්ට සංවර්ධිත රටවල විප්ලවීය නිර්ධ පංති ව්‍යාපාරය හා පීඩිත ජාතීන්ගේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලව අතර මූලෝපායික සන්ධානයේ ස්වභාවය අවබෝධකර ගැනීමට අධ්‍යාපනය දීම වැදගත් ය. නිර්ධන පංතියේ හා සැබෑ මාක්ස් ලෙනින් වාදී පක්ෂයක නායකත්වය යටතේ සමාජවාදය පිහිටුවීමට මගපෑදීම පීඩිත පංති ජනතාවගේ විප්ලවීය අරගලයේ හෝ ඔවුන්ගේ හැකියාවේ වැදගත්කම ප්‍රතික්ෂේප කරන සමාජ ශෝධීන් වාදී ආස්තනය පහරදිය යුතු තවමත් අන්තරායකර පිළිපැනීමකි. ජාතික විමුක්ති අරගලය එහි ස්වාභාවික (අධිරාජ්‍යවාදී) මිතුරන්ගේ “ආධාර” මගින් දයක වන්නේ නම් පමණක් ජාතික විමුක්ති අරගලයක් සාර්ථක වනු ඇතැයි කියන සෝවියට් සංගමය විසින් නායකත්ව දෙනු ලබන නූතන

සංශෝධන වාදීහුද ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සමාජවාදී විප්ලවයකට පරිණාමය වීමේ හැකියාවක් නැතැයි මූලධර්මීය වශයෙන් නිශේධ කරන ලද ට්‍රොට්ස්කිවාදීහුද මෙම අනර්ථකාරී ප්‍රවණතාවයයට නිදසුන්ය. අනෙක් අතට මෑත කාලයෙහි වැදගත් ප්‍රශ්නයක් වූයේ සංවර්ධිත රටවල විප්ලවීය තත්ත්වයන්ගේ විභව්‍යතාවය නොසලකා හරින නැතහොත් එවැනි විප්ලවීය තත්ත්වයන් පැන නැගිය හැක්කේ ජාතික විමුක්ති අරගලයන්හි වර්ධනයන්ගේ ඍජු ප්‍රතිඵලයක් වශයෙන් පමණකැයි සලකන තවත් පිළි පැනීමකි. මේ පිළි පැනීම් දෙකම විප්ලවීය නිර්ධන පංතියේ ශක්තිය හීන කරන ඒවාය. ඒවායේද ඔවුන් සංවර්ධනය වන ලෝක අවස්ථාව සැලකිල්ලට ගැනීමට අසමත්වෙති. විවිධ වර්ගයන්ට අයත් රටවල් විප්ලවීය ප්‍රගමනයන් සඳහා සහ ලෝක පරිමාණයක් මත ඉන් ගලා එන විභවයන් සැලකිල්ලට ගැනීමට අසමත් වෙති.

## ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඉතිහාසය සම්බන්ධ ප්‍රශ්න කීපයක්

කොමියුනිස්ට් ප්‍රකාශනය ප්‍රකාශයට පත් කළ හා "සියලු රටවල කම්කරුවෙනි ! එක්වව් ! " යන හඬගෑමේ පටන් සියවසකට ටිකක් වැඩි කාලයක් පුරා ජාත්‍යන්තර නිර්ධන පංතිය අතිමහත් අත්දැකීම් සම්භාරයක් ඒකරාශී කරගෙන ඇත. විවිධ වර්ගයේ රටවල විප්ලවීය ව්‍යාපාරය මෙම අත්දැකීම අවබෝධ කරගන්නේ විප්ලවීය ජයග්‍රහණයන්ගේ හා මහත් විප්ලවීය ක්‍රියාකාරිත්වයේ ශ්‍රේෂ්ඨ දිනවලදීද අඳුරුතම ප්‍රතිගාමිත්වයේ අඳුරුතම පසු බෑමේ කාලපරිච්ඡේදයන්හිදීද වේ. ව්‍යාපාරයේ හැරීම් පෙරලීම් සහිත මාවතේදී මාක්ස් ලෙනින් වාදයේ මාඕසේතුං චින්තනයේ විද්‍යාව හැඩ ගැසුන අතර එය එහි විප්ලවීය හදවද කපා දැමූ හෝ එය පිලුණු හා ජීවයෙන්තොර සිද්ධානතයක් බවට පත් කළා වූ අයවලුන්ට එරෙහිව කළ ස්ථිරසාර අරගලයක් ඔස්සේ සංවර්ධනය විය. ලෝක ඉතිහාසයේ හා පංති අරගලයේ සංවර්ධනයෙහි වැදගත් හැරවුම් ලක්‍ෂයන් දෘෂ්ඨිමය පෙරමුණේ මාක්ස්වාදයද, සංශෝධනවාදය හා පොතේගුරු වාදයද අතර කෙරුණු බිහිසුණු අරගලය සමග අවිච්ඡින්න ලෙස අතිනත් ගත්තේය. දෙවන ජාත්‍යන්තරයට එරෙහිව ලෙනින්ගේ අරගලය (එය පළමුවන ලෝක යුද්ධයේ පැන නැඟීම හා රුසියාවේ හා සෑම තැනකම විප්ලවීය තත්ත්වයක සංවර්ධනය සමඟ අනුරූපී විය.) හා ලෝක ඓතිහාසික සංවර්ධනයන් පිළිබිඹු කළ ශ්‍රේෂ්ඨ අරගලයක් වූ (සෝවියට් සංගමයේ ධනවාදය යලි ස්ථාපනය කිරීම සමාජවාදී චීනයේ පංති අරගලය තීව්‍රවීම විශේෂයෙන්ම එක්සත් ජනපදයේ අධිරාජ්‍යවාදයට එරෙහිව විප්ලවීය අරගලයේ ලෝක පරිමාණ ඉහල නැගීමක සංවර්ධනය) නූතන සෝවියට් සංශෝධනවාදයට එරෙහිව මාඕසේතුංගේ අරගලය සම්බන්ධ ප්‍රශ්නය වූයේ මෙයයි. ඊහා සමානවම අද ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය අත්දකිමින් තිබෙන ගැඹුරු අර්බුදය චීනයේ නිර්ධන පංති පාලනයේ ආපසු හැරීමේ හා මාඕසේතුංගේ මරණින් පසු හා ඩෙංෂියාපිං හා හුවාකුවෝ පොංගේ කුදෙතාවෙන් පසු සංස්කෘතික විප්ලවයෙන් පසු එල්ලකළ සමස්ත ප්‍රහාරයේ එසේම ලෝක යුද්ධයේ අනතුර හා විප්ලවයේ මතු බලාපොරොත්තුව වර්ධනය කරන ලෝක ප්‍රතිවිරෝධයන්ගේ සම්පූර්ණවීමේ පිළිබිඹුවකි. අද අනෙක් ශ්‍රේෂ්ඨ අරගලවලදී මෙන්ම විප්ලවීය ක්‍රියාමාර්ගයක් සඳහා සටන් කරන බලවේගයන්, සංශෝධනවාදීන් හා සියලු වර්ගයේ ධනපති වගඋත්තරකරුවන් විසින් වටලා පහරදෙනු ලබන කුඩා සුළුතරයකි. එහෙත් මේ බලවේග අනාගතය නියෝජනය කරන අතර ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ තවත්දුර වර්ධනය වත්මන් සංකීර්ණ තත්ත්වයන් තුල විප්ලවීය නිර්ධන පංතියේ ඉදිරිමාවත සටහන් කරන දේශපාලන ක්‍රියාමාර්ගයක් සකස් කර ගැනීමේ ඔවුන්ගේ හැකියාව මත රඳා පවතී. මෙය මෙසේ වන්නේ කෙනෙකුගේ ක්‍රියාමාර්ගය නිවැරදි නම් පටන් ගැන්මේදී ඔහුට එකදු සෙබලකු හෝ නොසිටියද සෙබළුන් ඇති කර ගත හැකි හා දේශපාලන බලය නොතිබුණේ වුවද බලය අත්පත් කර ගත හැකි නිසාය. මෙය මාක්ස්ගේ කාලයේ සිට ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම් විසින් උසුලන ලද්දකි.

ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය සඳහා පොදු ක්‍රියාමාර්ගයක් ඔප්නංවා ගැනීම සඳහා වන අත්‍යන්තයෙන්ම වැදගත් මූලයක් වන්නේ අපේ ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීමේ නිවැරදි ඇගයීමයි. නිමක් නැති දිවිකැප කළ විරුවන්ගේ හා දශලක්ෂ ගණන් ජනතාවගේ බහුජන විප්ලවීය අරගල මාවතේ දී ලබා ගත් විප්ලවීය අත්දැකීම් හා උගත් පාඩම්වලට ප්‍රමාණවත් වැදගත්කමක් දීමට අසමත්වීම අත්‍යන්තයෙන්ම වගකීම් විරහිත වීමක් හා දැනුම පිළිබඳ මාක්ස්වාදී න්‍යායට එරෙහිව යාමක් වනු ඇත.

අද විප්ලවීය ජාත්‍යන්තර ව්‍යාපාරය අනෙකුත් මාඕවාදී බලවේගයන්ගේද එකතුව මාක්ස්, එංගල්ස්, ලෙනින්, ස්ටාලින්, මාඕ ගේ උරුමක්කාරයෝ වෙති. ඔවුහු මේ උරුමය සමඟ ස්ථිරසාර ලෙස පදනම්විය යුත්තාහ. එහෙත් ඔවුහු එලෙසම මේ උරුමයේ පදනම මත එහි අඩුපාඩු විවේචනය කිරීමට නිර්භය විය යුත්තාහ. ජනතාව ප්‍රබෝධමත් කරන අත්දැකීම් මෙන්ම ජනතාව සංවේගයට පත්කරන අත්දැකීම්ද ඇත්තේය. සියලු රටවල කොමියුනිස්ට්වාදීහු හා විප්ලවවාදීහු මේ සාර්ථකත්වයන් හා අසාර්ථකත්වයන් අත්දැකීම් අවධාරණයෙන් සැලකිල්ලට ගෙන බරපතල ලෙස අධ්‍යයනය කළ යුතුය. එලෙස ඒවායින් නිවැරදි නිගමනයන් හා ප්‍රයෝජනවත් පාඩම් කරා එළඹිය යුතුය.

අපේ උරුමයේ සම්පිණ්ඩනය මුළුමහත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය මගින් කරගෙන යා යුතු සාමූහික වගකීමකි. එවැනි සම්පිණ්ඩනයන් කළ යුත්තේ එකල පැවති වාස්තවික ඓතිහාසික තත්ත්වයන්ද නිර්ධන පංති පෙරමුණ බලඇණියමත ඒවා පැනවූ සීමාවන්ද සම්පූර්ණ වශයෙන් සැලකිල්ලට ගන්නාවූද සියල්ලන්ටමත් වැඩියෙන් ඓතිහාසික තත්ත්වයන් නොසලකා අද දවසේ නිර්ණායකයෝ අතීතය මැනීමේ පාරභෞතික වැරදි වලක්වන වස් අතීතය නිර්මාණයට සේවය කිරීමට සැලැස්වීමේ ජීවගුණයෙන් යුතු වූද මාක්ස් ලෙනින්වාදී මූලධර්ම මත පදනම්වෙමින් අනුකම්පා විරහිත විද්‍යාත්මක ආකාරයකටය. එවැනි සම්පූර්ණ සම්පිණ්ඩනයන් සඳහා

නිසැකවම සැලකිය යුතුතරම් දිගුකාලයක් ගන්නා නමුදු ලෝක සිදුවීම්වල පීඩනය විප්ලවීය විභ්‍යවතාවයන්ගේ විවෘත වීම, නිර්ධන පංතියේ පෙරමුණු බලඇණි වලට ඔවුන්ගේ වගකීම් ඉටුකිරීම වඩා හොඳට හැකි කරනු පිණිස ඇතැම් ප්‍රධාන පාඩම් අද නිශ්චය කරගතයුතුයැයි ඉල්ලා සිටී.

ඓතිහාසික අත්දැකීම් සම්පිණ්ඩණයටත් හැමවිටම පංති අරගලයේ තියුණු රංගභූමියක් ඇත්තේය. පැරිස් කොමියුනයේ පරාජයේ සිට මේ දක්වාම අවස්ථාවාදීහු හා සංශෝධනවාදීහු හරිදෙය හා වැරදිදෙය ආපසු හැරවීමට ද්විතීයිකය ප්‍රධානදෙය සමග පටලැවීමට සහ එනයින් "නිර්ධන පංතිය ආයුධ නොගතයුතුය" යන නිගමනයට ඒමට නිර්ධන පංතියේ පරාජයන් හා අඩුපාඩු අල්ලාගෙන ඇත්තාහ. එහි නිර්මාණාත්මක සංවර්ධනය යන නාම පුවරුව යටතේ මූලික මූලධර්මයන්ගේ නිශේධ කිරීම සඳහා නිදහසට කාරණයක් ලෙස බොහෝවිට නවතත්ත්වයන්ගේ පැනනැගීම උපයෝගී කරගෙන ඇත. ඒ අතරම නිර්ධන පංතියේ අඩුපාඩු මෙන්ම සාර්ථකත්වයන් සමාලෝචනය කිරීමට හා අතීතයේදී නිවැරදියැයි සැලකූ ආස්ථානයන් තහවුරුවීම සිදුවී නැතැයි හෝ ඇතැයි යන්න සමාලෝචනය කිරීමට අසමත්වීම වැරදි සහ මාක්ස්වාදයේ විවේචනාත්මක ජීවගුණය අතහැර දැමීම මෙන්ම හානි ගෙනදෙයි. එවැනි ප්‍රවේශයන් මාක්ස් ලෙනින් වාදය බිඳදැමීමක් වනු ඇති අතර සතුරාගේ ප්‍රහාරයන්ට නොසෙල්වී සිටීම නොහැකි කරයි. එහි විප්ලවීය සාරය මරාදමයි.

සත්තකින්ම ඉතිහාසය පෙන්වාදී තිබෙන්නේ මාක්ස්වාදයේ සැබෑ නිර්මාණාත්මක සංවර්ධනයන් (ව්‍යාජ සංශෝධනවාදී විකෘති කිරීම් නොවේ.) හැමවිටම මාක්ස් ලෙනින් වාදයේ මූලික මූලධර්ම ආරක්ෂා කිරීමේ හා තහවුරු කිරීමේ බිහිසුණු අරගලයන් සමග වෙන් කළ නොහැකිසේ බැඳී තිබුණ බවයි. විවෘත සංශෝධනවාදීන්ට විරුද්ධ සහ මාකස්වාදී මූලධාර්මික භාවයේ (Maxist OrthÞoxy) ආවරණය යටතේ විප්ලවයට විරුද්ධවූ කෞට්ස්කි වැන්නන්ට විරුද්ධව ලෙනින් කළ ද්විදර්ශනීය අරගලය ද නූතන සංශෝධනවාදීන්ට හා ඔවුන් ලෙනින් සහ ස්ටාලින් යටතේ එක්සත් සමාජවාදී සෝවියට් ජනරජයේ සමාජවාදය ගොඩනැගීමේ අත්දැකීම් නිශේධනය කිරීමට එරෙහිව සංශෝධනවාදයේ මූලයන් පිලිබඳව සම්පූර්ණ හා විද්‍යාත්මක විවේචනයක් කරන අතරම ගෙනගිය මාඕ සේතුංගේ ශ්‍රේෂ්ඨ අරගලයද මීට සාක්ෂි දරයි.

ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඉතිහාසයෙහි වන දුෂ්කර ප්‍රශ්න හා ගැටළු වලට අද එවැනිම ප්‍රවේශයක් අවශ්‍යය. බරපතල අනතුරක් පැමිණෙන්නේ මාඕ සේතුංගේ මරණයෙන් පසු ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයෙහි ඇතිවූ පරාජයන් හමුවේ මාක්ස් ලෙනින් වාදය අසාර්ථකවී ඇතැයි හෝ යල්පැනගොස් ඇතැයිද නිර්ධන පංතිය විසින් අත්පත් කර ගනු ගැබූ සමස්ත අත්දැකීමම ප්‍රශ්නයට භාජනය කළයුතු යැයිද ප්‍රකාශ කරන්නවුන් ගෙනි. මේ ප්‍රවනතාවය සොවියට් කොමියුනිස්ට් සංගමයේ නිර්ධනපංති ආඥාදායකත්වයේ අත්දැකීම් නිශේධ කරනු ඇත. නිර්ධන පංති නායකත්වය ශ්‍රේණිවලින් ස්ටාලින් මකාදමනු ඇත සහ ඇත්තෙන්ම නිර්ධන පංති විප්ලවය පිලිබඳ ලෙනින්ගේ මූලික තිසීසය පෙරමුණු පක්ෂයක හා නිර්ධනපංති ආඥාදායකත්වයේ අවශ්‍යතාවය ප්‍රහාරයට ලක්කරනු ඇත.

මාඕ බලගතු ලෙස ප්‍රකාශ කර ඇති පරිදි "අපට කඩු දෙකක් ඇති බව මම සිතමි. එකක් ලෙනින්ද අනික ස්ටාලින්ද වේ". ස්ටාලින්ගේ කඩුව ඉවත දැමූවිටක, "මෙම දෙරටුව විවෘත කරනු ලැබූ විටක සාමාන්‍යයෙන් මාක්ස් ලෙනින් වාදය ඉවත දැමේ". 1956 මාඕ සේතුං විසින් කරන ලද මේ ප්‍රකාශණයෙහි වලංගුභාවය අද දක්වා ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අත්දැකීම විසින් පෙන්වා දෙනු ලැබ තිබේ. ඒ හා සමානව අද ද මාඕ සේතුං විසින් විප්ලවීය විද්‍යාවේ කරන ලද සංවර්ධනයන්ට ප්‍රහාර එල්ලකර තිබේ. නැතහොත් පිළිගත නොහැකි බව කියා ඇත. ඇත්තෙන්ම මේ සියල්ල ඉතා පැරණි සහ පිලුණු සංශෝධනවාදයේද සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේද " නව" පිටපතකි.

සම්ප්‍රදයික මොස්කව් ලැදි පක්ෂවලින් හෝ එහි "යුරෝකොමියුනිස්ට්" ප්‍රවාහයේ චීනයේ සංශෝධනවාදී පැහැරගත්තන්ගෙන් හෝ ට්‍රොට්ස්කිවාදීන්ගෙන් හා ලෙනින්වාදයේ සුළු ධනේශ්වර විවේචනයන්ගෙන් යන කුමකින් පැමිණියද මෙම සම්පූර්ණ විවෘත සංශෝධනවාදය ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ප්‍රධාන අනතුර ලෙස නොනැසී පවතී. ඒ අතරම සංශෝධනවාදය එහි පොතේගුරුවාදී ආකාරයෙන් විප්ලවීය මාක්ස්වාදයේ දරුණු සතුරෙකු ලෙස දිගටම පවතිනු ඇත. අන්වර්හොජා සහ ඇල්බේනියානු කම්කරු පක්ෂයේ දේශපාලන ක්‍රියාමාර්ගයෙහි ඉතාමත් තියුණු ලෙස ප්‍රකාශයට පත්කර ඇති මෙම ධාරාව මාඕ සේතුං චින්තනයට, චීන විප්ලවයේ මාවතට, විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවයේ අත්දැකීමට පහරදෙයි. ස්ටාලින්ගේ ආරක්ෂකයන් ලෙස වෙස් බඳිමින් (සත්තකින්ම ඔවුන්ගේ තිසීසයන් බොහොමයක් ට්‍රොට්ස්කිවාදීය) මේ සංශෝධනවාදීහු ස්ටාලින්ගේ සැබෑ විප්ලවීය උරුමය කිලිටි කරති. මෙම කැටකයෝ (Impoter) ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ මුදුන්පත් කිරීම් නොව එහි අඩුපාඩු සහ වැරදි ඔවුන්ගේ සංශෝධනවාදී - ට්‍රොට්ස්කිවාදී ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට උපයෝගී කර ගනිමින් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය කිසියම් "ගූඪ පොතේගුරුවාදී ශුද්ධත්වය" කරා ආපසු යාමේ පදනමකට ගැලපෙන ලෙස ක්‍රියාකරන්නැයි ඉල්ලා සිටිති. මෙම හෝජාවාදී ක්‍රියාමාර්ගයේ බොහෝ ලක්ෂණ සෝවියට් සංශෝධනවාදයේ (එමෙන්ම පො දුවේ ප්‍රතිගාමිත්වයේ) හැකියාවටද ඇතුලත්ව සම්භාව්‍ය සංශෝධනවාදය සමඟ විවෘතවම ලෙනින්වාදී, විරෝධී "යුරෝ කොමියුනිස්ට්වාදය නගාලීම සඳහා නැතහොත් දෙකෙන්ම වාසි ගැනීම සඳහා එක්ව කටයුතු කරයි. ඒ අමතර හෝජාගේ වෙස්ගන්වන ලද ලෙනින්වාදී විරෝධය ඔවුන්ගේ පොදු ධනේශ්වර දෘෂ්ඨිමය පදනමට සාක්ෂියකි.

මාඕසේතුංගේ මාක්ස්ලෙනින්වාදී විද්‍යාවේ ගුණාත්මක සංවර්ධනය තහවුරු කිරීම අද ජාත්‍යන්තර ව්‍යාපාරයෙහිද පංති විඥාන කම්කරුවන් හා විප්ලවීය මනසැති ජනයා අතරද විශේෂිත වැදගත්කමක් නියෝජනය කරන සහ දැවෙන ප්‍රශ්නයකි. කාරණයට සම්බන්ධ වන මූලධර්මය මාඕ විසින් නිර්ධන පංති විප්ලවයට හා මාක්ස් ලෙනින්වාදී විද්‍යාවට කරන ලද තීරණාත්මක දයකත්වයන් තහවුරු කරන වාද සහ ඒවා මත ගොඩනගන්නවාද නැද්ද යන්නට වඩා කිසිසේත්ම අඩු දෙයක් නොවේ. එහෙයින් එය මාක්ස් ලෙනින් වාදයම තහවුරු කරනවාද නැද්ද යන ප්‍රශ්නයට වඩා කිසිසේත් වැඩි දෙයක් නොවේ.

"ලෙනින්වාදය අධිරාජ්‍යවාදය හා නිර්ධන පංති විප්ලවීය යුගයේ මාක්ස් වාදය වේ" යයි ස්ටාලින් පැවසීය. මෙය සම්පූර්ණයෙන්ම නිවැරදිය. ලෙනින්ගේ මරණයේ පටන් ලෝක තත්ත්වය විශාල වෙනස්කම් වලට භාජනයවී තිබේ. එහෙත් යුගයේ වෙනසක් වී නැත. ලෙනින් වාදයේ පදනම් හා මූලධර්ම යල් පැනගොස් නැත. අද අපේ සිතීමට මඟ පෙන්වන න්‍යායික පදනම දිගටම පවත්වාගනී. මාඕසේතුං චින්තනය මාක්ස් ලෙනින් වාදයේ සංවර්ධනයේ නව අවධියක් බව අපි සහතික කර කියා සිටිමු. මාකස් ලෙනින් වාදය-මාඕසේතුං චින්තනය තහවුරු කිරීමෙන් හා ඒ මත ගොඩනැගීමෙන් තොරව සංශෝධනවාදය, අධිරාජ්‍යවාදය හා පොදුවේ ප්‍රතිගාමිත්වය පරාජය කළ හැකි නොවේ.

## එක්සත් සෝවියට් සමාජවාදී ජනරජය හා කොමින්ටර්නය

රුසියාවේ ඔක්තෝම්බර් විප්ලවය සහ නිර්ධන පංතියේ ආඥාදායකත්වය පිහිටුවීම ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ ඉතිහාසයේ නව අවධියක් විවෘත කළේය. නිර්ධන පංති විප්ලවය සහ නිර්ධන පංති ආඥාදායකත්වය පිළිබඳ මාක්ස්වාදී න්‍යායට ලෙනින් කළ තීරණාත්මක සංවර්ධනයේ ජීවමාන තහවුරු කිරීම ඔක්තෝබර් විප්ලවය විය. ඉතිහාසයේ ප්‍රථම වරට කම්කරු පංතිය පැරණි රාජ්‍ය උපකරණ පොඩිපට්ටම් කර දමා, තමන්ගේම පාලනයක් පිහිටුවාගෙන, එහි ළඳරු වියේදීම සමාජවාදී පාලන තන්ත්‍රයේ ගෙල හිරකර දැමීමට සඳහා සූරාකන්නන් කල තැත ව්‍යවර්ත කර, අත්‍යවශ්‍ය දේශපාලන තත්ත්වයන් නිර්මාණය කරමින් සාර්ථක කර ගත්තේය. මේ ක්‍රියාවලියේදී නව වර්ගයක පෙරමුණු දේශපාලන පක්ෂයක, ලෙනින්වාදී පක්ෂයේ කේන්ද්‍රීය කාර්යභාර විදහා දක්වනු ලැබිණ.

ඔක්තෝබර් විප්ලවයේ ජාත්‍යන්තර සංඝටනය විශේෂයෙන්ම පළමුවන ලෝක යුද්ධය හා ඒ සමඟ අතින්ගත් විප්ලවීය ක්‍රියාකාරිත්වයේ ඉහල නැගීම විසින් සලකුණු කරන ලද ලෝක සන්ධිස්ථාන මාවතේදී එය කළ පරිදි අතිමහත්විය. ආරම්භයේ පටන්ම නව සමාජවාදී රාජ්‍යයේ නායකයෝ සහ පංති විඥාත කම්කරුවෝ එහි විප්ලවයේ ජයග්‍රහණය එයින්ම අවසාන වන්නක් ලෙස නොව අධිරාජ්‍යවාදය පරාජයට පත් කිරීමේ ලෝකය මුලුල්ලේම සූරාකෑම මුලිනුපුටා කොමියුනිස්ට්වාදය පිහිටුවීමේ ලෝක පරිමාන අරගලයේ ප්‍රථම ප්‍රධාන කඩඉම ලෙස දැක්කාහ. රුසියානු විප්ලවයත් සමගම රුසියානු විප්ලවයේ සජීවී අත්දැකීම් උකහා ගැනීමේ පදනම මත, විසකවා තිබුණු හා තදන්තරව දෙවන ජාත්‍යන්තරය තැණුන සමාජවාදී පක්ෂවලින් අතිබහුතරයක් ලක්ෂණ කොට ගෙන තිබුණ ප්‍රතිසංස්කරණ වාදයන් හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් කැඩී වෙන්වෙමින් නව කොමියුනිස්ට් ජාත්‍යන්තරයක් පිහිටුවනු ලැබිණ. පළමුවන ලෝක යුද්ධය විසින් ගෙන එනු ලැබූ විෂය බද්ධ සංවර්ධනයත් සමඟ සබඳතාවයෙන් යුතුව රුසියානු විප්ලවය සහ කොමින්ටර්නය සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය සඳහා වන අරගලය අවශ්‍යයෙන්ම යුරෝපීය ප්‍රපංචයක සිට ඉතිහාසයේ ප්‍රථම වරට සැබෑ වශයෙන්ම ලෝක පරිමාණ අරගලයක් බවට පරිවර්තනය කළේය.

ලෙනින් හා ස්ටාලින් ලෝක නිර්ධන පංති විප්ලවයේ සමස්ථ ක්‍රියාවලිය තුල පීඩිත රටවල විප්ලවයේ වැදගත්කම අවධාරණය කරමින් හා මෙම රටවල විප්ලවය අධිරාජ්‍යවාදී රටවල නිර්ධන පංති විප්ලවය මත රඳා පැවැතියේය යන  අදහස දැරූ සහ මේ වර්ගයේ රටවල ප්‍රථමයෙන් විප්ලවයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී අවධියට නායකත්වය දීමේ පදනම මත සමාජවාදී විප්ලවයක් කිරීමට නිර්ධන පංතියට ඇති හැකියාව ප්‍රතික්ෂේප කළ ට්‍රොට්ස්කි වැනියවුන්ට එරෙහිව විවාද කරමින් ජාතික හා යටත් විජිත ප්‍රශ්නය මත නිර්ධන පංති ක්‍රියාමාර්ගය සංවර්ධනය කළේය.

රුසියානු විප්ලවයෙන් පසු එළඹි කාලපරිච්ඡේදය ලෝක පරිමාණ විප්ලවීය පැසසීමක් සහ රටවල් ගණනාවකම කම්කරු පංති දේශපාලන බලය පිහිටුවීමේ ප්‍රයත්නයක් මගින් සලකුණු විය. අලුතෙන් පිහිටුවන ලද එක්සත් සෝවියට් සමාජවාදී ජනරජයේ දෙන ලද සෘජු ආධාරය හා ලෝක පරිමාණ විප්ලවීය ව්‍යාපාරය කෙරෙහි ලෙනින් විසින් දක්වන ලද දේශපාලන අවධානය තිබියදීත් පළමුවන ලෝක යුද්ධය සංකේන්ද්‍රණය කළ අර්බුදයේ තාවකාලික විසඳීම හා අධිරාජ්‍යවාදී බලවේගයන්ගේ ශේෂවී පැවති ශක්තියද එසේම විප්ලවීය කම්කරු පංති ව්‍යාපාරයේ දුර්වලතාද එක්සත් සෝවියට් සමාජවාදී ජනරජයේ සීමාවලින් පිටත විප්ලවයේ පරාජයට මගපෑදීය.

ලෙනින් සහ ඔහුගේ අනුප්‍රාප්තික ස්ටාලින් එ.සෝ.ස. ජනරජයෙහි විප්ලවයේ අත්පත් කර ගැනිම් ආරක්ෂාකර ගැනිමේදී සෝවියට් සංගමයෙහි තනිවම සමාජවාදී ආර්ථික ක්‍රමයක් ගොඩනගා පවත්වාගෙන යාමේදී අත්‍යවශතාවයට මුහුණ දුන්හ. ලෙනින්ගේ මරණින් පසු එ.සෝ.ස. ජනරජයේ නිෂ්පාදන බලවේගයන්ගේ පහත්මට්ටම අතිවිශාල ගොවි ජනතාවක පැවතීම හා එ.සෝ.ස. ජනරජයේ ජාත්‍යන්තර හුදෙකලාභාවය, සමාජවාදය ගොඩ නැගීම කළ නොහැකියයි කියූ ට්‍රොට්ස්කි හා අනෙකුත් අයට විරුද්ධව ස්ටාලින් විසින් වැදගත්

දෘෂ්ඨිමය හා දේශපාලනමය අරගලයක් දියත් කරනු ලැබීය. මෙම වැරදි යටත්විම්වාදී දෘෂ්ඨිකෝණය න්‍යායික වශයෙන් සහ වඩාත් වැදගත්ම පැරණි ධනවාදී ක්‍රමය මුලිනුපුටා දැමීමේ, කෘෂිකර්මය සාමූහික කරණයේ සහ මිනිසා විසින් මිනිසා සූරා කෑම මත තවදුරටත් පදනම් නොවූ නව ආර්ථික ක්‍රමයක් නිර්මාණය කිරීමේ සංග්‍රාමය කරා ගිය දශලක්ෂ ගණන් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ භාවිතය යන දෙකේදීම පරාජයට පත් කෙරුණි.

මෙම බලවත් හැගීම් පුබුදු වන සංග්‍රාම සහ ඒවායේදී දිනාගත් වැදගත් ජයග්‍රහණ මාක්ස් ලෙනින් වාදයේ බලපෑම අතිමහත් ලෙස ව්‍යාප්ත කිරීමටද ලෝකය මුළුල්ලේ එ.සෝ.ස. ජනරජයේ ගෞරවය වර්ධනය කිරීමටද හේතුවිය. පංති විඥාන කම්කරුවන් සහ පීඩිත ජනතාව එ.සෝ.ස. ජනරජය තමාගේම ලෙස සැලකූහ. සෝවියට් කම්කරු පංතිය විසින් දිනාගන්නා ලද ජයග්‍රහණයන්ගෙන් ප්‍රමුදිත වූහ. අධිරාජ්‍යවාදීන්ගේ තර්ජනයට හා ප්‍රහාරයන්ට එරෙහිව එහි ආරක්ෂාවට පැමිණියහ.

එසේ වුවද ආපසු හැරී බැලීමේදී එ.සෝ.ස. ජනරජයේ සමාජවාදී විප්ලවයේ ප්‍රගතිය 1920 ගනන් වල අග හා 30 ගණන්වල ශ්‍රේෂ්ඨ සමාජවාදී පරිවර්තනයන්ගේ කාලපරිච්ඡේදයෙහි පවා බරපතල දුබලතා හා අඩුපාඩු වලින් සලකුණුවී ඇති බව දැකිය හැකිය. මෙම දුර්වලතාවයන් ගෙන් සමහරක් නිර්ධන පංති ආඥාදායකත්වයේ කලින්වූ ඓතිහාසික අත්දැකීමක් නැතිකම (කෙටි ආයු කාලයකින් යුත් පැරිස් කොමියුනය හැර) මගින් හා එ.සෝ.ස. ජනරජයට එල්ලවූ බරපතල අධිරාජ්‍යවාදී වටලෑම හා ආක්‍රමණය මගින් විස්තර කරන්නට හැකිය. කෙසේ වුවද මෙම ප්‍රශ්න ඇතැම් වැදගත් න්‍යායික හා දේශපාලන වැරදි මගින් වර්ධනය කර ඌණපූරණය කෙරිණි. මාඕසේතුං කෘෂෙව්ගේ අවලාදයන්ගෙන් ස්ටාලින් ආරක්ෂා කළ අතරම මෙම වැරදි වලට හේතුවූ දෘෂ්ඨිමය පදනම විස්තර කර දැක්විය. ස්ටාලින් සතුව පාරභෞතිකවාදයේ සැලකිය යුතු ප්‍රමාණයක් පැවති අතර ඔහු බොහෝ ජනයාට පාරභෞතිකවාදී හා අනම්‍ය වූහ. ඔවුහු ප්‍රතිපක්ෂයන්ගේ ඒකීය භාවය ප්‍රතික්ෂේප කරමින් දෙයක් එක්කෝ එකක් හෝ අනෙක වියයුතුව ඇතැයි සිතති. එහෙයින් දේශපාලනය වැරදි කරති. ස්ටාලින්ගේ ඉතාම මූලික වැරැද්ද වූයේ සියලු පරිමණ්ඩලයන්හි සම්පූර්ණ වශයෙන් අපෝහකය යොදා ගැනීමට අසමත්වීම හා එලෙස සමාජවාදය යටතේ පංති අරගලයේ ස්වභාවය සහ ධනපති ප්‍රතිෂ්ඨාපනය වැලැක්වීමේ මාධ්‍යයන් සම්බන්ධයෙන් බරපතල වැරැදි නිගමනයන්ට එළඹීමය. ස්ටාලින් පැරණි සූරාකන පංතීන්ට එරෙහිව දරුණු අරගලයක් ගෙනගිය අතර න්‍යායික වශයෙන් සමාජවාදී සමාජයම තුළින් සංශෝධනවාදීන් විසින් පිළිඹිබු කරන ලදුව හා සංකේන්ද්‍රණය කරන ලදුව පාලක කොමියුනිස්ට් පක්ෂය තුලින් නව ධනේශ්වරයක පැන නැගීම ප්‍රතික්ෂේප කළේය. එනයින් කර්මාන්තයේ හා කෘෂිකර්මයේ සමාජවාදී හිමිකම මූලික වශයෙන් තහවුරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සෝවියට් සංගමයේ ප්‍රතිසතික පංති ප්‍රතිවිරෝධයන් මුලිනුපුටාදමා ඇත්තේය යන ඔහුගේ වැරැදි ඉදිරිපත් කිරීම පැන නැංගේය. එපරිද්දෙන්ම සමාජවාදී සමාජය පිළිබඳ විශ්ලේෂණයට ආපෝහකය මුළුමනින්ම යොදගැනීමට අසමත්වීමක් සෝවියට් නායකත්වය සමාජවාදය යටතේ නිෂ්පාදන බලවේග හා නිෂ්පාදන සබඳතා අතර ප්‍රතිවිරෝධය තව දුරටත් නොතිබුණේය යන නිගමනයට ඒමටද උත්තර නිර්මිතයේ විප්ලවය ගෙන යාමට ප්‍රමාණවත් අවධානයක් යෙදීම හා ප්‍රමාණ වශයෙන් සමාජවාදී හිමිකම් ක්‍රමය පිහිටුවීමෙන් පසු පවා නිෂ්පාදන සබඳතාවයන් විප්ලවීය කිරීම අඛණ්ඩව කරගෙන යාම නොසලකා හැරීමටද මග පෑදීය.

එලෙසම සමාජවාදී සමාජයේ ස්වභාවය පිළිබඳ මෙම වැරදි තේරුම් ගැනීම ජනතාව හා සතුරන් අතර ප්‍රතිවිරෝධයන්ද ජනතාව අතරම වන ප්‍රතිවිරෝධයන්ද ප්‍රමාණවත් ලෙස වෙන් කර හඳුනාගැනීමෙහිලා ස්ටාලින්ගේ අසමත් බවට දායකත්වයක් සැපයීය. මෙහි ප්‍රථිඵල වශයෙන් මෙම ප්‍රතිවිරෝධයන් හැසිරවීමේ නිලධාරිවාදී විධික්‍රම පිහිටකොට ගැනීමේ පැහැදිලි ප්‍රවණතාවයකට දායකත්වය සැපයූ අතර සතුරාට වඩාත් ඉඩ ප්‍රස්ථා ලබා දුන්නේය.

ලෙනින්ගේ මරණින් පසු ආ කාලපරිච්ඡේදයේදී ස්ටාලින් ලෝක විප්ලවය පෙරට ගෙන යාමේ වැදගත් කාර්යභාරයක් රඟපෑම හා අලුතෙන් පිහිටවූ කොමියුනිස්ට් පක්ෂ සංවර්ධනය කිරීම හා තහවුරු කිරීම අඛණ්ඩව කර ගෙන ගිය කොමියුනිස්ට් ජාත්‍යන්තරයට නායකත්වය දුන්නේය.

බරපතල ලෝක ආර්ථික අර්බුද මැද්දේ නව ලෝක යුද්ධයක, හා සෝවියට් සංගමය මත අධිරාජ්‍යවාදී ප්‍රහාරයන්ගේ වැඩෙන තර්ජනය ජර්මනියේ ෆැසිස්ට්වාදය බලයට පැමිණීම හා ජර්මන් කොමියුනිස්ට් පක්ෂය පොඩිපට්ටම් කර දැමීමද අනෙකුත් රටවල් ගණනාවකම ෆැසිස්ට්වාදය පිහිටුවීම හෝ සමාජ තර්ජනයක්ද මැද්දේ 1935දී කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ අත්‍යයන්තයෙන්ම වැදගත් සම්මේලනයක් පවත්වනු ලැබිණ. මෙම සියලු ප්‍රයත්නයන් සැලකිල්ලට ගනිමින් කොමියුනිස්ට් ජාත්‍යන්තරය සඳහා උපක්‍රමික ක්‍රියාමාර්ගයක් සංවර්ධනය කිරීමට ප්‍රයත්න දැරීම අත්‍යාවශ්‍ය හා නිවැරදි විය.

මන්ද කොමින්ටර්නයේ හත්වන සම්මේලනයට ජාත්‍යන්තර ව්‍යාපාරයේ ඉතිහාසය මත එවැනි ගැඹුරු බලපෑමක් පැවතී තිබෙන හෙයින් කාලයේ පවතින ඓතිහාසික තත්ත්වයන්ගේ ආලෝකය තුල, සම්මේලනයේ වාර්තාවේ සන්සුන් හා විද්‍යාත්මක ඇගයීමක් කරගැනීමට අත්‍යවශ්‍ය නිසාය. විශේෂයෙන්ම ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ පරාජයට හේතු පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කළ යුතුය. එහෙත් ඇතැම් නිගමනයන්ට දැන් එළැඹිය හැකිය. එය අද දවසේ මාක්ස් ලෙනින්වාදීන්ගේ වත්මන් ක්‍රියභාරයන්ගේ ආලෝකය තුළින් කළයුතු අතර පැහැදිලි පිළිපැනීමේ තැනක් හඳුනාගත යුතුය.

පළමුවෙන්ම අධිරාජ්‍යවාදී රටවල ෆැසිස්ට්වාදය හා ධනපති ප්‍රජාතන්ත්‍රවාදය අතර වෙනස සත්තකින්ම කොමියුනිස්ට් පක්ෂ සඳහා සැබෑ වැදගත්කමකින් යුක්තවන අතරම සලකන ලද්දේ ධනේශ්වර ආඥාදායකත්වයේ මේ ආකාර දෙක අතර වෙනසේ නියතයන් බවට පත්කිරීමේ හා ෆැසිස්ට්වාදයට විරුද්ධ අරගලයේ මූලෝපායික අවවියක් සකස් කිරීමේ නැමියාවක් දැක්වූ ක්‍රමයකටය. දෙවෙනුව නිර්ධන පංතියේ වැඩෙන දුක්ඛිතභාවය (Immiseration ) සංවර්ධිත ධනේශ්වර රටවල කම්කරු පංතියේ බෙදීම සමනය කරන ද්‍රව්‍යමය පදනම හා ලෙනින් ඔහුගේ අධිරාජ්‍යවාදය හා දෙවෙනි ජාත්‍යන්තරයේ බිඳවැටීම පිළිබඳ කෘතීන්හි ඒසා බලගතු ලෙස විශ්ලේෂණය කර තිබුණ එහි තදන්තර ධ්‍රැවීකරණය නිර්මාණය කරනු ඇත; යන්න පිලිගත් තිසීසයක් සංවර්ධනය කළේය. අර්බුදයේ ගැඹුර සංවර්ධිත ධනපති රටවල ශ්‍රමික වංශක්කාර පැළැන්තියේ සමාජ පදනම බිඳදමා කලින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ආධිපත්‍යය යටතේ සිටි ශ්‍රමික වංශක්කාර පැළැන්තියේ සමාජ පදනම බිඳදමා කලින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ආධිපත්‍යය යටතේ සිටි විශාල කම්කරු පාර්ශවයන් සමඟ එක්සත්වීම සඳහා යොදගැනීමට කොමියුනිස්ට් පක්ෂවලට අවශ්‍ය කෙරුණු සැබෑ විභවිතාවන්ට මගපෑදූ බව සැබැවින්ම සත්‍යවන අතර, කම්කරු පංතියේ භේදය සමහන් කළ හැකිවනු ඇතැයි යන කිසිදු වර්ගයක මූලෝපායික හැඟීමක් කෙරෙහි විශ්වාසය තැබීම වැරදි විය. තෙවනුව ෆැසිස්ට්වාදය යනු අධිරාජ්‍යවාදී රටවල ඒකාධිකාරී ධනේශ්වරයේ ඉතාමත්ම ප්‍රතිගාමී පාර්ශවයේ පාලනතන්ත්‍රය ලෙස නිර්වචනය කළවිට එය ඒකාධිකාරී ධනේශ්වරයේ එක පාර්ශ්වයක් ප්‍රගතිශීලී ලෙස දැක්මේ අන්තරායකර ප්‍රතිසංස්කරනවාදී හා ක්ෂාන්තිවාදී ප්‍රවනතාවයට දෙරටු විවෘත කළේය.

මෙම වැරදි සමාලෝචනය කිරීම හා ඒවායින් ඉගෙනගැනීම අවශ්‍යවන අතරම ඒ හා සමානවම මේ කාලපරිච්ඡේදයට ඇතුලත්වන කොමියුනිස්ට් ජාත්‍යන්තරය කොමියුනිස්ට්වාදය දියකර හැරීම්වාදී හා ට්‍රොට්ස්කිවාදී ප්‍රයත්නයට පෙරලා පහරදීමේ උරුමයේ කොටසක් ලෙස පිළිගැනීම අත්‍යවශ්‍යය. මේ කාලපරිච්ඡේදයේදී පවා කොමියුනිස්ට් ජාත්‍යන්තරය පංති සතුරන්ට එරෙහිව දශලක්ෂ ගණන් කොමියුනිස්ට් කම්කරුවන් බලමුළු ගැනුවූ අතර ප්‍රතිගාමිත්වයට එරෙහිව, ස්පාඤ්ඤයේ ෆැසිස්ට්වාදයට එරෙහිව සටන් කිරීම පිණිස ජාත්‍යන්තර බ්‍රිගේඩ සංවිධානය කිරීම වැනි වීරෝධාර අරගලයන්ට නායකත්වය දුන්නේය. මේවායේදී කම්කරු පංතියේ ඉතාමත්ම අනගි දූපුතුන් ජාත්‍යන්තරවාදයේ ප්‍රබෝධජනක ආදර්ශයක් වෙමින් ඔවුන්ගේ රුධිරය වැගිරූහ.

කොමියුනිස්ට් ජාත්‍යන්තරය එලෙසම සෝවියට් සංගමයේ, සමාජවාදයේ දේශයේ ආරක්ෂාව උදෙසා, නිවැරදි ලෙස සුවිශාල අවධානයක් දුන්නේය. එහෙත් සෝවියට් සංගමය විවිධ අධිරාජ්‍යවාදී රටවල් සමඟ ඇතැම් අතරමැදි සමාදානයට එළඹවිට, කොමින්ටර්නයේ නායකයෝ 1946 දී මාඕ සේතුං කළ (එකල එ.සෝ.ස. ජනරජය දැන් එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය හා ප්‍රංශයද අතර ඇතිකරගත් අතර මැද සමාදානයන් සම්බන්ධයෙන්) තීරණාත්මක ලක්ෂ්‍යය තේරුම් ගැනීමට සමත් වෙනවාට වඩා බොහෝවිට අසමත්වූහ. "එවැනි අතරමග සමාදානයකදී ධනපති ලෝකයේ රටවල ජනතාව සිය රටේදී එය අනුගමනය කිරීම හා අතරමග සමාදානයන්ට එළඹීම අවශ්‍ය නොකරයි. " තවදුරටත් එවැනි අතරමග සමාදන ප්‍රථමයෙන්ම හා ප්‍රධාන වශයෙන්ම ලෝක විප්ලවීය ව්‍යාපාරයේ සමස්ථ සංවර්ධනය සැලකිල්ලට ගත යුතුය. සත්තකින්ම එහිදී සමාජවාදී රාජ්‍යයන්ගේ ආරක්ෂාව වැදගත් කාර්යභාරයක් රඟපායි.

සමාජවාදී රාජ්‍යයක් (රාජ්‍යයන්) අධිරාජ්‍යවාදී වටලෑමේ තත්ත්වයන් තුළදී මේ විප්ලවීය ජයග්‍රහණයන් ආරක්ෂාකිරීම ජාත්‍යන්තර නිර්ධන පංතිය උදෙසා ඉතා වැදගත් කාර්යභාරයක් වෙයි. එමෙන්ම සමාජවාදී රාජ්‍යයන් රාජ්‍ය තාන්ත්‍රික අරගලයන් ගෙනයාම අවශ්‍යවනු ඇති අතර ඇතැම් විට එක් හෝ තවත් අධිරාජ්‍යවාදී බලයක් සමඟ විවිධ ආකාරයේ ගිවිසුම්වලට එලඹියයුතු වනු ඇත. එහෙත් සමාජවාදී රාජ්‍යයන්ගේ ආරක්ෂාව හැමවිටම ලෝක විප්ලවයේ සමස්ථ ප්‍රගමනයට යටත් විය යුතු අතර නිර්ධන පංතියේ ජාත්‍යන්තර අරගලයට සමාන ලෙස දැකීම කිසිද නොකළ යුතුය. (සහ සත්තකින්ම ආදේශකය නොවේ.) ඇතැම් තත්ත්වයන් තුළ සමාජවාදී රටක ආරක්ෂාව ප්‍රධාන විය හැකිය. එහෙත් මෙය එලෙස නිවැරදි වන්නේ එහි ආරක්ෂාව ලෝක විප්ලවයේ ඉදිරි ගමන සඳහා තීරාණාත්මක වන නිසාය.

මෙම පාඩම්වල ආලෝකය තුළින් දෙවෙනි ලෝක යුද්ධය ආශ්‍රිත කාලපරිච්ඡේදයේ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අත්දැකීම් සමාලෝචනය කරගැනීම අත්‍යාවශ්‍යය. ධනපති ක්‍රමයේ එකම මිනීමරු තර්කය මීට වගකිවයුතු වන්නේ වී නමුදු දෙවෙනි ලෝක යුද්ධය පළමුවන ලෝක යුද්ධයේ හුදු ප්‍රතිනිරූපනයක්ම නොවේ. එය ප්‍රතිවිරෝධයන්ගේ සංකීර්ණ සංයෝගයකි. 1939 එහි ආරම්භයේදීම මාඕ පෙන්වාදුන් පරිදි එය " ස්වභාවයෙන් අසාධාරණ, කොල්ලකාරී හා අධිරාජ්‍යවාදී විය." එහෙත් හිට්ලර්ගේ ජර්මනිය ඔහුගේ හමුද සෝවියට් සංගමය මතට හැරවූ විට ගෝලීය පටලැවීම්වලින් යුත් ප්‍රධාන වෙනසක් හටගත්තේය. සෝවියට් සංගමය පැත්තෙන්ම මේ සාධාරණ යුද්ධය, ලොවපුරා රතු හමුදවේද සෝවියට් කම්කරු පංතියේ හා ජනතාවගේද වීරෝධාර විරෝධය පෑම මගින් මහත්සේ ප්‍රමෝදයට පත් කම්කරු පංතියේ සහ පීඩිත ජනතාවගේ සහයෝගය හා අනුකම්පාව දිනාගත්තේය. මෙසේ හුදෙක් ආක්‍රමණයකට ගොදුරුවූවෙකුට දක්වන අනුකම්පාවක්ම නොව සෝවියට් දේශයේ ආරක්ෂාව එපරිද්දෙන්ම ලෝක විප්ලවයේ සමාජවාදී මූල කඳවුරු ප්‍රදේශයේද ආරක්ෂාව වූවේය, යන ගැඹුරු කැපවීම පෙන්නුම් කරන්නක් විය. ඒ හා සමානවම චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ චීන ජනතාව විසින් ජපන් ආක්‍රමණයට විරුද්ධව දියත් කරන ලද යුද්ධයද වර්ධනය වූ අතර ඉතාම නිශ්චිත ලෙසට සාධාරණ යුද්ධයක් හා ලෝක නිර්ධන පංති ලෝක විප්ලවයේ සංයුක්ත කොටසක් විය.

විශේෂයෙන්ම යුද්ධය වෙත සෝවියට් සංගමයේ ප්‍රවේශයත් සමග එය වඩාත් සංකීර්ණ ස්වභාවයක් ගත්තේය. එය සංයුක්තකොටස් අතර සංයෝගයක් බවට පත්විය. සමාජවාදය හා අධිරාජ්‍යවාදය අතර යුද්ධය, අධිරාජ්‍යවාදී කඳවුරු අතර යුද්ධය, අධිරාජ්‍යවාදී කඳවුරු අතර යුද්ධය, අධිරාජ්‍යවාදයට විරුද්ධ පීඩිත ජනතාවගේ යුද්ධය, සහ ඇතැම් රටවල සන්නද්ධ අරගලයේ මට්ටමට සංවර්ධනය වූ නිර්ධන පංතිය හා ධනේශ්වර පංතිය අතර ප්‍රතිවිරෝධය යනුවෙනි.

මෙම වෙනස් පැති එක් අතකින් සමාජවාදී බලවේගයන් වර්ධනයට ෆැසිස්ට් අධිරාජ්‍යවාදී බලවේගයන්ගේ පරාජයට, අධිරාජ්‍යවාදයේ දුර්වලවීමට හා ජාතික විමුක්ති අරගලයන් වඩා ප්‍රාණවත් කිරීමට මගපෑදීය. අනෙක් ඒවා එක්සත් ජනපදය අධිරාජ්‍යවාදීන් අතර ප්‍රධාන පල්හොරාගේ කාර්‍යභාරය පවරා ගැනීමත් සමඟින් ලෝකයේ අධිරාජ්‍යවාදී බෙදීම යලි සකස් කිරීමකට මග පෑදිණි.

දෙවෙනි ලෝක යුද්ධයේ මාවතේදී ශ්‍රේෂ්ඨ විප්ලවීය මුදුන්පත් කිරීම් සිදුවිය. ඒ අතරම බරපතල වැරදි හා එළඹෙන කුණාටු සඳහා වඩා හොඳින් සූදනම්වනු පිණිස ඒවා ගැඹුරින් සමාලෝචනය කිරීමේ සාමූහික ක්‍රියාවලියක් ආරම්භ කිරීම නොදැක සිටීම අසීරුය. විශේෂයෙන්ම අපට ඉහතින් සඳහන් කළ ප්‍රතිවිරෝධයන් සාර සංග්‍රහවාදීව සංයෝග කිරීමේ වැරැද්ද සටහන් කරගත හැකිය. ප්‍රායෝගික දේශපාලන අර්ථයෙන් ගත්කල සෝවියට් සංගමයේ රාජ්‍යතාන්ත්‍රික අරගලය සහ ජාත්‍යන්තර ගිවිසුම් කොමින්ටර්නය සකස් කෙරෙන කොමියුනිස්ට් පක්ෂවල කටයුතු සමග වඩවඩාත් ව්‍යාකූල බවකට පත්විය. මෙම ප්‍රශ්නය එලෙසම නිර්ෆැසිස්ට් බලවතුන් සැබැවින්ම පෙරලා දැමිය යුතුව තිබෙන අධිරාජ්‍යවාදීන් විය, යන්නට වඩා වෙනස් කිසියම් කොටසක් ලෙස විදහා දැක්වීමේ බලගතු ප්‍රවනතාවයට දයකත්වය සැපයීය. ජර්මන් ෆැසිස්ට් හමුදා අත්පත් කරගත් යුරෝපීය රටවල බහුජනතාව බලමුළු ගැන්වීමේ ස්ථාවරයෙන් කොමියුනිස්ට් පක්ෂය ජාතික හැඟීම්වල උපක්‍රමික වාසිය ලබාගැනීම වැරදි නොවීය. එහෙත් එවැනි උපක්‍රමික පියවරයන් මූලෝපායේ මට්ටමට නගාලීම හෙතුකොට ගෙන වැරදි සිදු කෙරුනේය. මිත්‍ර අධිරාජ්‍යවාදීන්ගේ ආධිපත්‍යය යටතේ පැවති යටත් විජිතවල විමුක්ති අරගලයද එපරිද්දෙන්ම එවැනි වැරදි සහගත අදහස් හේතුකොට ගෙන හික්මවාලනු ලැබිණි.

මෙම වැදගත් කාලපරිච්ඡේදයේ හා පසුව ආ ආසන්න අවුරුදුවල සිදුවූ ස්මරණීය විප්ලවීය අරගල හා ජයග්‍රහණ ආදරයෙන් රැක බලාගන්නා හා තහවුරු කරන අතරම අද දවසේ මාක්ස් ලෙනින් වාදීන් මෙම වැරදි හා ඒවායේ පදනම පිළිබඳව ඔවුන්ගේ අවබෝධය ගැඹුරු කරගත යුතුව තිබේ.

දෙවෙනි ලෝක යුද්ධයෙන් පැන නැගුණ සමාජවාදී කඳවුර කිසිදක ස්ථාවර නොවීය. නැගෙනහිර යුරෝපීය මහජන ප්‍රජාතන්ත්‍රවාදයන් බොහොමයක ගෙනගියේ සුළු විප්ලවීය පරිවර්තනයකි. දෙවෙනි ලෝක යුද්ධය සමයේ හා ඉන්පසු තත්ත්වයන්හිදී සෝවියට් සංගමය තුලම බලගතු මුදහැරුණු සංශෝධනවාදී ශක්තියෙන් හා බලපෑමෙන් වැඩී ගියේය. ස්ටාලින්ගේ මරණින් පසු 1956 දී කෘෂොව් විසින් නායකත්වය දෙනු ලැබූ මේ සංශෝධනවාදී බලවේග දේශපාලන බලය අල්ලා ගැනීමෙහිලා සාර්ථක වූ අතර සියළු පෙරමුණුවලදී මාක්ස්-ලෙනින් වාදයට පහරදී එම රටේ ධනවාදය ප්‍රතිස්ථාපනය කළහ.

කෘෂෙව්ගේ හා සෝවියට් සංගමයේ සංශෝධනවාදීන් ගේ <u>කුදෙතාව</u> එලෙසම කොමියුනිස්ට් ව්‍යාපාරය කලින් පවත්වාගෙන තිබූ තත්ත්වයට වැටෙන්නටම පහරදීමක් වූ බව දැන් පැහැදිලිය. පුළුල්ව පැතිර ඇති සංශෝධනවාදයේ පිළිකාව කොමින්ටර්නය සැදුන බොහෝ පක්ෂ (ඉතාම බලපෑම් සහිත ඇතැම් ඒවාද ඇතුලත්ව) මේ වනවිටත් කෑදවා තිබුණි. අනෙක් බොහෝ ඒවායේ තුනීව තට්ටුවකින් පමණක් ආවරණය වී තිබූ පක්ෂ වේගයෙන් නූතන සංශෝධනවාදයේ ආස්ථානයන්ට පිරිහෙන්නට වූ අතර විප්ලවීය මූලයන් මරාදමනු ලැබිණි. සෝවියට් සංගමය තුලට ස්ටාලින්ගේ මරණින් පසු යුද්ධය විසින් දුර්වලකරන ලද හා බරපතල දේශපාලන දෘෂ්ඨිය වැරදි විසින් නිරායුධ කරන ලද සැබෑ මාක්ස් - ලෙනින් වාදීන් හා සෝවියට් නිර්ධන පංතිය සංශෝධනවාදී පාවා දෙන්නන්ට කිසිදු බරපතල පහරදීමක් එල්ල කිරීමෙහිලා වන නොහැකියාව ඔප්පු කළේය.

## මාඕ සේතුං සංස්කෘතික විප්ලවය සහ මාක්ස්ලෙනින්වාදී ව්‍යාපාරය.

කෘෂොව්ගේ කුදෙතාවෙන් ක්ෂණයකින් පසු පටන්ම මාඕ සේතුං සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ මාක්ස්-ලෙනින් වාදීහු සෝවියට් සංගමයේද, ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේද වර්ධනයන් විශ්ලේෂණය කිරීමටද නූතන සංශෝධනවාදයට එරෙහිව අරගල කිරීමටද පටන් ගත්හ. 1963 දී ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ පොදු ක්‍රියාමාර්ගය පිළිබඳ යෝජනාවක් (කරුණු 25 ලිපිය) නම් ප්‍රකාශනය සංශෝධනවාදය පිළිබඳ අංග සම්පූර්ණ හා ප්‍රසිද්ධ හෙලාදැකීමක් හා සියළු රටවල සැබෑ මාක්ස් - ලෙනින් වාදීන්ට කළ හඬගෑමක් විය. තත්කාලීන මාක්ස් - ලෙනින්වාදී ව්‍යාපාරයට එහි සම්භව්‍ය ලෙස ඇත්තේ මෙම ඓතිහාසික ආයාචනය හා එය සමඟ අතිනත ගෙන පැමිණි විවාදයන්ය.

යෝජනාවෙහි හා විවාදයන්හි මාඕ සහ චීන කොමියුනිස්ට් පක්ෂය නිවැරදි ලෙස නිර්ධන පංති ආඥාදායකත්වය පිළිබඳ ලෙනින්ගේ ආස්ථානය ඔසවා තැබීය. සහ "සමස්ථ ජනතාවගේ රාජ්‍යය" පිළිබඳ සංශෝධනවාදී න්‍යාය නිශ්ප්‍රභා කළේය. සන්නද්ධ විප්ලවයේ අවශ්‍යතාවය ඔසවා තැබීය. සහ සමාජ වාදය කරා සාමකාමී පරිවර්තනයක් පිළිබඳ මූලෝපායට විරුද්ධ වූයේය.

පීඩිත ජනතාවගේ ජාතික විමුක්ති යුද්ධවල සංවර්ධනය, සහයෝගය හා ධෛර්යය දීම කළේය. "නව යටත් විජිතවාදයේ ව්‍යාජ ස්වාධීනත්වය හෙළිදරව් කරමින් හා ඒවා ලෝක සාමයට, අනතුරට හෙලන නිසා ජාතික විමුක්ති යුද්ධ මඟහැරිය යුත්තේය" යන සංශෝධනවාදී ආස්ථානය නිශ්ප්‍රභා කළේය.

ස්ටාලින් හා එ.සෝ.ස. ජනරජයේ සමාජවාදය ගොඩනැගීමේ අත්දැකීම පිළිබඳ සමස්ථ සාධනීය ඇගයීමක් කළේය, සහ ස්ටාලින්ගේ වැරදි පිළිබඳ ඇතැම් වැදගත් විවේචනයන් කරන අතරම ස්ටාලින්ට එරෙහිව "මස්කඩකාරයෙක්" "දුෂ්ඨ පාලකයෙක්" යනුවෙන් එල්ලකළ අවලාදයන් නිශ්ප්‍රභා කළේය. අනෙකුත් පක්ෂ මත සංශෝධනවාදී ක්‍රියාමාර්ග කෘෂොව් දැරූ ප්‍රයත්නයට විරුද්ධ වූවා සේම තොරේස්, ටොග්ලියාටි, ටිටෝ අනෙක් නූතන සංශෝධනවාදීන් විවේචනයට ලක් කළේය.

සමාජවාදයේ පංති ස්වභාවය සම්බන්ධයෙන් හා නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ විප්ලවය කරගෙන යාම සම්බන්ධයෙන් මාඕ සේතුං සංවර්ධනය කරමින් තිබූ තිසීසය කලලමය ආකාරයකින් ඉදිරිපත් කළේය.

ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම් හා සංශෝධනවාදයේ මුල් පිළිබඳ සම්පූර්ණ අධ්‍යයනයක් සඳහා හඬගෑය.

යෝජනාවල හා විවාදවල අඩංගුවූ මෙම කරුණු මෙන්ම අනෙක් ඒවාද මාක්ස් ලෙනින් වාදය සංශෝධනවාදයෙන් වෙන්කර ගැනීම සඳහා වූ හා තවමත් එසේවන තීරණාත්මක කරුණුය. මාඕ සහ චීන කොමියුනිස්ට් පක්ෂය මේ විවාදයෙන් ඔස්සේ සංශෝධනවාදීන් ගේ බෙදීමටද නව නිර්ධන පංති විප්ලවීය පක්ෂ පිහිටුවන ලෙසද මාක්ස් ලෙනින්වාදීන් ධෛර්යමත් කළේය. විවාදයන් නූතන සංශෝධනවාදයෙන් රැඩිකල් බිඳීයාමක් හා මාක්ස් ලෙනින් වාදීන්ට සංග්‍රාමය සඳහා පෙරට යාම සඳහා සෑහෙන තරම් සම්පූර්ණ නොවූ අතර අනෙක් අය විවේචනය කරන අතරතුර ඇතැම් වැරදි සහගත අදහස් පවා සංයුක්ත විය. නව මාක්ස් ලෙනින් වාදී ව්‍යාපාරයකට උපත දීමේදී ඇත්තටම මේ විවාදයන්ද මාඕ හා චීන කොමියුනිස්ට් පක්ෂයද රඟපෑ කාර්යභාරය නිසා විවාද තුළ හා ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයෙහි චීන කොමියුනිස්ට් පක්ෂය විසින් දියත්කරන ලද අරගලය තුල නිශේධනීය පැත්ත ද්විතීයික ලෙස සැළකීම නිවැරදි හා අත්‍යවශ්‍යය.

අධිරාජ්‍යවාදී රටවල් සම්බන්ධයෙන් යෝජනාව "එක්සත් ජනපද අධිරජ්‍යවාදය පාලනය කරන හෝ පාලනය කිරීමට උත්සාහ කරන ධනපති රටවල කම්කරු පංතිය හා ජනතාව ඔවුන්ගේ ප්‍රහාරයන් ප්‍රධාන වශයෙන්ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට විරුද්ධව මෙහෙයවිය යුතුය. එහෙත් ඒ සමගම ඒකාධිකාරී ධනපතියන්ට හා ඔවුන්ගේ ජාතික පලප්‍රයෝජන පාවාදෙන අනෙකුත් ප්‍රතිගාමී බලවේගයන්ට එරෙහිවද ප්‍රහාරයන් යෙදිය යුතුය." යන අදහස පෙරට දැමීය. මේ ආකාරයේ රටවල මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරයේ සංවර්ධන කෙරෙහි බරපතල ලෙස ප්‍රතිවිපාක ගෙනදුන් මෙම අදහස අධිරාජ්‍යවාදී රටවල "ජාතික ඵල ප්‍රයෝජන" යනු අධිරාජ්‍යවාදී ඵල ප්‍රයෝජනය පාවා නොදෙන, ඒ වෙනුවට ඒවා අනෙකුත් අධිරාජ්‍යවාදී බලයන් සමඟ එය ඇති කරගනු ඇති කුමනාකාර සන්ධානයක් තිබියදීත් එවැනි සන්ධානයක නොවැලැක්විය හැකි අසමාන ස්වභාවයන් තිබියදීත් පාලක ඒකාධිකාරී ධනපති පංතිය විසින් ආරක්ෂා කරනු ලබනවා ඇත, යන කරුණ අඳුරු කරදමයි. මෙලෙස ඔවුන්ව ඵලප්‍රයෝජනයන්හි හොඳම ආරක්ෂකයින් ලෙස අධිරාජ්‍යවාදී ධනේශ්වරයේ වටිනාකම වැඩිකර දැක්වීමේ ප්‍රයෝජනයන්හි යෙදීමට මෙම රටවල නිර්ධන පංතිය ධෛර්යය ගැන්වීය. මෙම අදහසට ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ දිගු ඉතිහාසයක් තිබේ. එය සටන්කොට පැරදවිය යුතුය.

චීන කොමියුනිස්ට් පක්ෂය සංශෝධනවාදීන්ට විරුද්ධව මාක්ස් ලෙනින්වාදී පක්ෂවල සංවර්ධනයට සුවිශාල අවධානයක් යෙදූ අතර එය කොමියුනිස්ට් වාදීන්ගේ ජාත්‍යන්තර සමගිය සංවර්ධනය කිරීමේ අත්‍යවශ්‍ය ආකාර හා මාර්ග සොයාගන්නේ නැත. දෘෂ්ඨිමය හා දේශපාලන සමගියට කළ දයකත්වයන් තිබියදීත් මෙය ලෝක පරිමාණයක් මත සංවිධානමය සමගියක් ගොඩනැගීමේ ප්‍රයත්නයන් විසින් පිලිබිඹු කරනු ලැබුවේ නැත. චීන කොමියුනිස්ට් පක්ෂයට කොමින්ටර්නයේ සාධනීය පැති ප්‍රධාන වශයෙන්ම සම්බන්ධි පක්ෂවල මුලපිරීම හා ස්වාධීනත්වය සුන්කර දැමීමට මගපෑදූ අධි මධ්‍යගත වාදය විසින් ඇතිකරන ලද ඒවා පිළිබඳ අතිශයෝක්තියට නැගුණු තේරුම්ගැනීමක් තිබිණ. චීන කොමියුනිස්ට් පක්ෂය පිතෘ පක්ෂ සංකල්පය නිවැරදි ලෙස විවේචනය කළ අතරම, ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුළ එහි හානිකර බලපෑම පෙන්වා දුන්නේය. පක්ෂ අතර සහෝදරාත්මක ප්‍රතිපත්තිද, අදහස් විවාද කිරීම හා පොදු දෘෂ්ඨිකෝණයන් මුදුන්පත් කරගැනීම සඳහා සංවිධිත සංසදයක අඩුව මේ ප්‍රශ්නය විසඳීමට ආධාර නොකළ බවද එහෙත් සැබවින්ම එය වඩාත් තීව්‍ර බවද අවධාරණය කළේය.

නූතන සංශෝධනවාදයට එරෙහි න්‍යායික අරගලය මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරයක් යළි ගොඩනැගීමේදී තීරණාත්මක කාර්යභාරයක් රඟපෑවේනම් මාක්ස් ලෙනින්වාදීන්ගේ සමස්ථ නව පරම්පරාවකට උපත ගෙන දුන්නේ විශේෂයෙන්ම අරගලයේ පෙරනොවූ විරූ ආකාරයක් වූ නූතන සංශෝධන වාදයට එරෙහි මෙම අරගලයේ ඵලයෙහි විශාල කොටසක්ව වූ ශ්‍රේෂ්ඨ සංස්කෘතික විප්ලවයයි. කෝටි ගණන් කම්කරුවෝ, ගොවියන් හා විප්ලවීය තරුණයන් පක්ෂය හා රාජ්‍ය අවයව තුළ බලකොටු තනාගෙන සිටි ධනේශ්වර මග ගත්තන් බලයෙන් නෙරපා

දැමීම සඳහා වූ සංග්‍රාමය තුලට ඇදී ගියහ. ඔවුහු සමාජය තවදුරටත් විප්ලවීය කිරීම 1960 ගණන් සහ 70 ගණන්වල මුලු ලොව විසඳාගෙන ගිය විප්ලවීය කොටසක් ලෙස නැගී සිටියාවූ ලොව මුළුල්ලේ දශලක්ෂ ගනන් ජනතාව ලෙළෙන භූයක් බවට පත්වූහ.

සංස්කෘතික විප්ලවය නිර්ධන පංති විප්ලවයේ හා සමාජය විප්ලවීය කිරීමේ ඉතාමත්ම දියුණු අත්දැකීම නියෝජනය කරයි. ප්‍රථම වරට කම්කරුවෝ සහ අනෙකුත් විප්ලවීය මූලයන් සමාජවාදය යටතේ පංති අරගලයේ ස්වභාවය සමාජවාදී සමාජය තුළින්ම නොවැලැක්විය හැක්කේ පැන නගිනු ඇති හා, විශේෂයෙන්ම පක්ෂයේ නායකත්වය තුල සංකේන්ද්‍රණයවී ඇති ධනෙශ්වර මග ගත්තන්ට එරෙහිව නැගී සිට ඔවුන් පෙරලා දැමීමේ අවශ්‍යතාවය හා සමාජවාදී පරිවර්තනය තවදුරටත් ඉදිරියට ගෙනයාමට අරගල කිරීම සහ මෙලෙස මෙම ධනවාදී මූලයන් උපදවන පස හාරා ඉවත්කර දැමීම පිළිබඳ පැහැදිලි තේරුම්ගැනීමකින් සන්නද්ධ වූහ. දශකයක කාලයක් චීනයේ සංශෝධනවාදී ප්‍රතිෂ්ඨාපනය වළකාලූ සංස්කෘතික විප්ලවය සමයේදී ශ්‍රේෂ්ඨ ජයග්‍රහණ දිනාගත්තේය. අධ්‍යාපනයෙහි, සාහිත්‍ය සහ කලාවෙහි විද්‍යාත්මක පර්යේෂණ සහ උත්තර නිර්මිතයෙහි අනෙකුත් මූලයන්හි ශ්‍රේෂ්ඨ සමාජවාදී පරිවර්තනයට නායකත්වය දුන්නේය. දශලක්ෂ ගණන් කම්කරුවෝ සහ අනෙකුත් විප්ලවවාදීහු දරුණු දෘෂ්ටිමය හා දේශපාලනමය අරගල මාවතේදී ඔවුන්ගේ පංති විඥාණය හා මාක්ස් ලෙනින් වාදයේ ප්‍රාගුණ්‍යය විශාල වශයෙන් ගැඹුරු කරගත්හ. දේශපාලන බලය භාවිතයට යෙදීමේ ඔවුන්ගේ හැකියාව තවදුරටත් වර්ධනය කරගත්හ. සංස්කෘතික විප්ලවය නිර්ධන පංති ජාත්‍යන්තර අරගලයේ කොටසක් ලෙස දියත් කළහ. ලොව මුලුල්ලේ විප්ලවීය අරගලයට දෙන ලද සහයෝගය මගින් පමණක් නොව මේ සහයෝගය දීමේදී චීන ජනතාව විසින් විදහා පාන ලද සැබෑ පරිත්‍යාගයක් මගින්ද ප්‍රකාශිත නිර්ධන පංති ජාත්‍යන්තර වාදයේ පුහුණු භූමියක්ද විය. එක්ව නැගී සිට සංශෝධනවාදයට එරෙහි සටන කරා බහුජනතාව මෙහෙයවූ හා තියුණු පරාජය හමුවේ මාක්ස් ලෙනින් වාදය මාඕ සේතුං චින්තනය ආරක්ෂාකිරීම අඛණ්ඩව කරගෙන ගිය චියැංචිං හා චෑන්ග්-චුං චියාඕ වැනි විප්ලවීය නායකයන් පැන නැගුණි.

"පංති අරගලයේ පිලිගැනීම, නිර්ධන පංති ආඥාදායකත්වය පිළිගැනීම දක්වා දිගුකරන්නේ කවරෙක්ද ඔහු පමණක් මාක්ස් වාදියෙක් වේ" යයි ලෙනින් පැවසීය. මාඕ සේතුං විසින් ශ්‍රේෂ්ඨ සංස්කෘතික විප්ලවය ඔස්සේ මුදුන්පත් කරගත් අනගි පාඩම් හා ප්‍රගමනයන් ආලෝකයෙන් ලෙනින් විසින් ඉදිරිපත් කරන ලද නිර්ණායකය තවදුරටත් මුවහත්වී තිබේ. යමෙක් මාක්ස් වාදියෙක් වන්නේ ඔහු පංති අරගලයේ පිළිගැනීම, නිර්ධන පංතියේ ආඥාදායකත්වයේ පිළිගැනීම දක්වා දිගු කිරීමෙන් හා කොමියුනිස්ට් වාදය දක්වා එන සමාජවාදයේ කාලපරිච්ඡේදය මුළුල්ලේම පංතීන්ගේ විෂය මූල පැවැත්ම, ප්‍රතිඝතික පංති ප්‍රතිවිරෝධයන් හා පංති අරගලය දිගටම පැවතීම පිළිගන්න විට පමණකි." යයි දැන් ප්‍රකාශ කළ හැකිය. මාඕ එතරම් බලගතු ලෙස ප්‍රකාශකර ඇති පරිදි "මේ ප්‍රශ්නය පිළිබඳ පැහැදිලිතාවය නැතිකම සංශෝධනවාදයට මග පාදයි.

සංස්කෘතික විප්ලවය මාක්ස් ලෙනින්වාදයේ ජීවශක්තියේ ජීවමාන සනාථ කිරීමක් විය. එක් සූරාකෑමේ ක්‍රමයක් තවත් එකකින් විතැන් කිරීම පමණක් කළ හැකිවූ පූර්ව විප්ලවයන් සියල්ලට වඩා නිර්ධන පංති විප්ලවය වෙනස්වූ බව එය පෙන්වීය. එය සියලු රටවල විප්ලවවාදීන්ට මහා ප්‍රබෝධයක මූලයක් විය. මේ සියලු හේතූන් නිසා සංස්කෘතික විප්ලවය සහ මාඕ සේතුං සියලු ප්‍රතිගාමීන්ගෙන් හා සංශෝධනවාදීන්ගෙන් කල්පවත්නා හා දුෂ්ඨ අපවාදයන් උපයාගත්තේය. එමෙන්ම එම හේතූන් නිසාම සංස්කෘතික විප්ලවය ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ විප්ලවීය උරුමයේ වෙන් කළ නොහැකි කොටසක් වශයෙන් පවතින්නේ.

සංස්කෘතික විප්ලවයේ දැවැන්ත ජයග්‍රහණයන් තිබියදීම සංශෝධනවාදීන් චීන කොමියුනිස්ට් පක්ෂයේ හා රාජ්‍යයේ වැදගත් ස්ථාන දිගටම දැරූහ. සැබෑ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයක් යළි ගොඩනැගීමේ තවමත් දුර්වල ප්‍රයත්නයන්ට සැළකිය යුතු හානියක් කළ ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කළහ. එහි රාජ්‍ය ධූත සේවයේ විශාල ප්‍රමාණයක් චීන කොමියුනිස්ට් පක්ෂය හා අනෙක් මාක්ස් ලෙනින් වාදී පක්ෂ අතර සබඳතා පාලනය කළ චීනයේ සංශෝධනවාදීහු නිර්ධන පංතියේ හා පීඩිත පංතියේ ජනතාවගේ විප්ලවීය අරගලයට පිටු පෑහ. නැතහොත් චීනයේ රාජ්‍ය එල ප්‍රයෝජන සඳහා මෙම අරගල යටත් කිරීමට උත්සාහ කළහ. ප්‍රතිගාමී අත්තනෝමතික පාලකයන් ව්‍යාජ ලෙස "අධිරාජ්‍ය විරෝධීන්" වශයෙන් හඳුන්වා දුන්හ. "අධිරාජ්‍යවාදයට" එරෙහි ලෝක පරිමාණ අරගලයක ධජය යටතේ එන්ට එන්ටම බටහිර කඳවුරේ ඇතැම් අධිරාජ්‍යවාදී බලවතුන් ලෝකයේ ආසන්න හෝ සාධනීය බලවේග වශයෙන් පවා චිත්‍රණය කළහ. මේ කාලපරිච්ඡේදය සමයේ පවා චීන කොමියුනිස්ට් පක්ෂය තුළ සංශෝධනවාදීන් විසින් සහයෝගය දෙන ලද චීන හිතවාදී මාක්ස් ලෙනින් වාදී පක්ෂ බොහොමයක් ලැජ්ජා විරහිතව ධනේශ්වරය පිටුපස යන්නට පටන්ගත් අතර සමස්ථ ලෝකයේම "ප්‍රධාන සතුරා ලෙස වැඩි වශයෙන් දුටු සෝවියට් සංගමයට එරෙහිව අධිරාජ්‍යවාදී සහායක ක්‍රියාවන්ට හා යුද සූදානම්වීම්වලට ආධාර කිරීම හෝ එකඟත්වය පෑම හෝ පවා කළහ. මෙම සියළු ප්‍රවණතාවයන් චීනයේ කුදෙතාවන් සමග හා ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට බලෙන් පිළිගැන්වීමට තැත් කරන ලද සංශෝධනවාදීන්ගේ" "ලෝක තුනේ න්‍යාය" පිළිබඳ විවේචනය එය අවධාරණය කරන සංකල්ප විවේචනය කිරීම මගින් ගැඹුරු කළයුතු, සහ මූලික විමර්ශනයට ලක්කළ යුතුය. මෙහිදී මෙම ප්‍රතිවිප්ලවවාදී න්‍යායටම විරුද්ධවීම නිසා මාඕ ගේ සමීපතම සහෝදරවරුන්, මෙම සංශෝධන වාදී පැහැරගන්නන් විසින් ප්‍රසිද්ධියේ හෙලාදකිනු ලැබ තිබෙන බව සටහන්කර ගැනීම වැදගත්ය.

අධිරාජ්‍යවාදය හා නිර්ධන පංති විප්ලවයේ යුගයේ අත්‍යවශ්‍ය ප්‍රතිවිරෝධයන්ගෙන් හෝ ලක්ෂණවලින් එකක් වන්නේ සමාජවාදී රාජ්‍යයන් හා අධිරාජ්‍යවාදී රාජ්‍යයන් අතර ප්‍රතිවිරුද්ධයයි. වත්මන් කාලයේද මෙම ප්‍රතිවිරෝධය කලින් සමාජවාදීව පැවැති රාජ්‍යයන් ගණනාවක සංශෝධනවාදී පරිවර්තනයේ ප්‍රතිඵලයක් වශයෙන් තාවකාලිකව මුලිනුපුටා දමා තිබෙන අතර සමාජවාදී රාජ්‍යයන් එකක් හෝ ගණනාවක යළිත් සිය තත්ත්වය අත්පත්කර ගනු ඇති නිර්ධන පංති කොල්ලකාරී අධිරාජ්‍යවාදී සතුරන්ගේ පැවැත්ම සමග මුහුණට මුහුණදීම නොවැලැක්විය හැකිවන නිසා මෙම ප්‍රතිවිරෝධය හසුරුවාලීමේදී කොමියුනිස්ට් ව්‍යාපාරයේ අත්දැකීම සමාලෝචනය කරගැනීම වැදගත් න්‍යායික කාර්යභාරයන් ලෙස පවතින්නේය. යන්න අඩු සත්‍යයක් නොවේ.

මාඕ සේතුංගේ මරණින් ටික කලකට පසු 1976 දී චීනයේ ධනවාදී ගර්භිතයෝ සංස්කෘතික විප්ලවයේ තීන්දු ආපසු දුෂ්ඨ කුදෙතාවක් දියත්කර චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් විප්ලවවාදීන් පෙරලා දමා අංග සම්පූර්ණ සංශෝධනවාදී වැඩපිළිවෙලක් සංවිධානයකර අධිරාජ්‍යවාදයට යටත් වූහ. එම රටේ නිර්ධන පංති පාලනය ප්‍රතිශ්ඨාපනයක් සඳහා අරගලය දිගටම ගෙනගිය චීන කොමියුනිස්ට් පක්ෂයෙහි විප්ලවවාදීන්ගෙන් මෙම කුදෙතා විරෝධයට මුහුණ දුන්නේය. ජාත්‍යන්තර වශයෙන් බොහෝ රටවල කොමියුනිස්ට් වාදීහු හුවා කුවෝ පොංග් හා චන් ෂියාඕ පින්ගේ සංශෝධනවාදී ක්‍රියාමාර්ගය වටහාගත් අතර චීනයේ ධනවාදී මාර්ගිකයින් විවේචනය කර හෙළිකර දැක්වූහ. චීනයෙහි හා ජාත්‍යන්තරව කුදෙතාවට එල්ල වූ මේ විරෝධය පෑම නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ පංති අරගලයේ තක්සේරුවක් හා ධනේශ්වර ප්‍රතිෂ්ඨාපනයක හැකියාව සමග නිර්ධන පංතිය හා මාක්ස් ලෙනින් වාදීන් සන්නද්ධ කිරීම සඳහා වෙහෙස නොබලා වැඩකළ මාඕ සේතුංගේ දුර දක්නා විප්ලවීය නායකත්වයට සාක්ෂියකි. මාඕ සේතුං විසින් මග පෙන්වන ලදුව නිර්ධන පංති මූලස්ථානයන් විසින් කරන ලද න්‍යායික වැඩද එලෙසම සමාජවාදී සමාජයෙහි ප්‍රතිවිරෝධයන්ගේ ස්වභාවයේ නිවැරදි තේරුම් ගැනීමක් සමග මාක්ස් ලෙනින් වාදීන් සන්නද්ධ කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් රඟපෑ අතර මාඕසේතුං චින්තනයේ වැදගත් විදහා දැක්වීමක් ලෙස පවතියි. මෙය සමාජවාදී රටක් නොතිබුණ, මේ තත්ත්වයට මුහුණ දීමට බලකෙරී තිබියදීත් වසර විස්සකට පෙර සෝවියට් සංගමයේ සංශෝධනවාදී කුමන්ත්‍රණය අවස්ථාවේදී ඔවුන් සිටියාට වඩා 1976 ඛේදනීය සිද්ධි සඳහා දෘෂ්ඨිමය වශයෙන් හොඳට සූදනම්වීමට මාක්ස් ලෙනින් වාදී ව්‍යාපාරයට ඉඩ ලැබිණ.

එසේ වුවද ලෝක ජනගහණයෙන් හතරෙන් එකක් සමන්විත රටක ධනවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ජාත්‍යන්තර ව්‍යාපාරයේ පෙරමුණේ පැවැති මාක්ස් ලෙනින්වාදී පක්ෂය සංශෝධනවාදී බලයට නතුවීම ලෝක විප්ලවීය අරගලය හා මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරය මත ගැඹුරු ප්‍රතිවිපාක ඇති කළේය. පෙරදී ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ කොටසක් වූ බොහෝ පක්ෂ චීනයේ සංශෝධනවාදීන් හා ඔවුන්ගේ "ලෝක තුනේ න්‍යාය" වැළඳගත් අතර විප්ලවීය අරගලය සම්පූර්ණයෙන්ම අත්හැර දැමීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම පක්ෂ අතර කිසියම් බිඳවැටීමක් (Demordize) ව්‍යාප්තවූ අතර අනෙක් අතට විප්ලවීය මූලයන් පිළිබඳ විශ්වාසය නැතිකරගෙන මහා අර්බුදයකට මුහුණ දුන්නේය, නැතහොත් සම්පූර්ණයෙන්ම බිඳ වැටුණේය.

චීන සංශෝධනවාදීන්ගේ නායකත්වය අනුගමනය කිරීම ප්‍රතික්ෂේප කළ අනෙකුත් ඇතැම් මාක්ස් ලෙනින් වාදීන් අතර පවා චීනයේ අහිමිවීම, බිඳවැටීමකට මගපෑදූ අතර මාක්ස් ලෙනින් වාදය මාඕ සේතුං චින්තය ප්‍රශ්න කිරීමකට භාජනය කෙරුණේය. මෙම ප්‍රවණතාවය අන්වර්හෝජා සහ ඇල්බේනියානු කම්කරු පක්ෂය මාඕ සේතුං චින්තනය මත මුළු ශක්තිය යොද විවෘත පහරදීමක් දියත් කරනු ලැබූවිට තවදුරටත් තීව්‍ර විය.

චීනයේ කුදෙතාවෙන් පසුව ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුල කිසියම් අර්බුදයක් ඇතිවනු ඇතැයි අපේක්ෂා කළ අතර මෙම අර්බුදයේ ගැඹුර සහ එය අවසානයකට පත්කිරීමේ දුෂ්කරතාවය 1976 වන විටත් මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරය තුල සංශෝධන වාදයේ විවිධ ආකාරයන් ශක්තිමත් කිරීමෙන් පෙන්නුම් කළේය. මාක්ස් ලෙනින් වාදීහු ජාත්‍යන්තර ව්‍යාපාර තුල වඩාත් මෑත කාලපරිච්ඡේදයේ හා කලින් කාලපරිච්ඡේදය යන දෙකෙහිම සංශෝධන වාදයේ මූලයන් විමර්ශණය හා අධ්‍යනය කිරීම දිගටම කළ යුතුය. ඉතිහාසය පුරා ජාත්‍යන්තර නිර්ධන පංතිය හා කොමියුනිස්ට් ව්‍යාපාරය විසින් කරන ලද විප්ලවීය ප්‍රගමනයන්හි ද පන්නරය ලබාදුන් මූලික මූලධර්ම තහවුරු කිරීම හා ගොඩනැගීම දිගටම කරගෙන යන අතරම දිගටම පවතින සංශෝධනවාදී බලපෑමට එරෙහිව අරගලය දියත් කිරීම අඛණ්ඩව කරගෙන යා යුතුය.

## විප්ලවීය කොමියුනිස්ට්වාදීන්ගේ කාර්‍යයභාරයෝ

සියළුම රටවල විප්ලවීය කොමියුනිස්ට් වාදීන්ගේ කාර්‍යය වන්නේ ලෝක විප්ලවයේ සංවර්ධනය කඩිනම් කිරීම - නිර්ධන පංතිය හා විප්ලවීය බහුජනතාව විසින් අධිරාජ්‍යවාදය හා ප්‍රතිගාමීත්වය පෙරලා දමනු ලැබීමය. විවිධ රටවල අත්‍යවශ්‍ය අවධින්ට හා සන්ධානයන්ට අනුව නිර්ධන පංති ආඥාදායකත්වය පිහිටුවීමය ; හා සූරාකන සමාජයේ සියළුම ද්‍රව්‍යමය හා දෘෂ්ඨිමය ලාංඡන මුලිනුපුටා දැමීමේ අරගලය හා මෙලෙස ලෝකය මුලුල්ලේම පංති විරහිත සමාජය, කොමියුනිස්ට්වාදය මුදුන් පත් කිරීමය. ප්‍රධාන සහ ප්‍රමුඛතම කොමියුනිස්ට්වාදීහු ඔවුන්ගේ පැවැත්මේ තර්කනය සිහි තබාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. එසේ නොවුනහොත් විප්ලවයට ඔවුන්ගේ ප්‍රයෝජනයක් නැත. වඩාත්ම නරක දෙය වන්නේ එහි මාර්ගයෙහි බාධකයන් බවට පිරිහීයාමය.

අත්දැකීම පෙන්වා තිබෙන්නේ නිර්ධන පංති විප්ලවය මුදුන්පත් කරගත හැක්කේ හා පෙරට ගෙනයාහැක්කේ මාක්ස් ලෙනින්වාදයේ - මාඕ සේතුං චින්තනයේ විද්‍යාව මත පදනම්ව ලෙනින්වාදී ක්‍රියාමාර්ගයන් හා ගොඩනැගූ නිර්ධන පංතියේ හා ජනතාවගේ අනෙකුත් කොටස් අතර ඉතාම හොඳ විප්ලවීය මූලයන් ආකර්ෂණය කරගනිමින් පුහුණු කිරීමට සමත් හැබෑ නිර්ධන පංති පක්ෂයක් මගින් පමණක් බවය. අද ලෝකයේ බොහෝමයක් රටවල එවැනි පක්ෂයක් නැත. එවැනි පක්ෂ පවතින රටවල පවා ඒවා සාමාන්‍යයෙන් ගත්කල එළඹෙන කාලපරිච්ඡේදයේ අවශ්‍යතාවයන්ට හා අවස්ථාවන්ට මුහුණ දීමට සෑහෙන තරම් දෘෂ්ටිමය හෝ සංවිධානමය වශයෙන් ශක්තිමත් නැත. මේ හේතුන් නිසා සැබෑ මාක්ස් ලෙනින්වාදී පක්ෂ පිහිටුවීම හා ශක්තිමත් කිරීම සමස්ත ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය සඳහාම තීරණාත්මක කාර්‍යභාරයක් වේ.

මාක්ස් ලෙනින්වාදී පක්ෂයක් නොපවතින රටවල විප්ලවීය කොමියුනිස්ට් වාදීන් මුහුණ දෙන හදිසි කාර්‍යභාරය වන්නේ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ආධාරය ඇතිව එවැනි පක්ෂයක් පිහිටුවීමයි. පක්ෂය පිහිටුවීම සඳහා ප්‍රධාන යතුර වන්නේ නිෂ්චිත, රටේ සුවිශේෂතාවයන්ද, සමස්ත ලෝක තත්ත්වයද යන දෙකම සැලකිල්ලට ගනිමින් නිවැරදි දේශපාලන ක්‍රියා මාර්ගයක් හා වැඩපිළිවෙලක් සංවර්ධනය කිරීමයි. මාක්ස් ලෙනින්වාදී පක්ෂයක් ගොඩනැගිය යුත්තේ බහුජනතාව අතර සමීප සම්බන්ධතාවයකින් යුතුව විප්ලවීයව වැඩකරගෙන යාමෙනි. විප්ලවීය බහුජන ව්‍යාපාරයක් ක්‍රියාවට නගිමිණි. විශේෂයෙන්ම විප්ලවවාදී ව්‍යාපාරයේ ඉදිරි ගමන සඳහා විසඳිය යුතු දැවෙන දේශපාලන ප්‍රශ්න වලට ආමන්ත්‍රණය කරමිණි. ඒවා විසඳීමෙනි. මෙය නොකරන්නේ නම් පක්ෂය ගොඩනැගීමේ කාර්යය වඳ බවට පත්ව, විප්ලවීය භාවිතයෙන් වියෝව අයාලයේ ගමන් කිරීමය. අනෙක් අතට පක්ෂය ගොඩනැගීම සාමාජිකයන් කිසියම් ප්‍රමාණයක් එක්රැස් කර ගැනීම මත විසඳීම හෝ පක්ෂය පිහිටුවීමට පෙර බහුජනතාව අතර කිසියම් ප්‍රමාණාත්මක බලපෑමක් තිබිය යුතුයැයි හුදෙක්ම කියා සිටීම් එලෙසම වැරදිය. බොහෝ අවස්ථා වල පක්ෂය ප්‍රථමයෙන් පිහිටුවනවිට එය සමත්වනු ඇත්තේ සාපේක්ෂ වශයෙන් කුඩා සාමාජිකත්වයකිනි. ඕනෑම අවස්ථාවකදී පක්ෂයේ ධජය විප්ලවීය කොටස් එක්රැස්කිරීමේ කාර්යය සහ පක්ෂයේ බලපෑම නිර්ධන පංතිය හා බහුජනතාව අතර ගැඹුරු කිරීම අනවරත කාර්යයකි.

මාක්ස් ලෙනින්වාදී පක්ෂයක් ගොඩනැගිය යුත්තේ හා ශක්තිමත් කළ යුත්තේ හා ධනේශ්වරයට හා එහි ශ්‍රේණීන් තුල සුළු ධනේශ්වර බලපෑමට එරෙහිව ක්‍රියාකාරී දෘෂ්ටිමය අරගලයක් දියත් කිරීමේ මාවත තුලය. පෙරමුණු පක්ෂයක් ගොඩනැගීමේදී මාක්ස්ලෙනින් වාදීහු පක්ෂයේ නිර්ධන පංති ස්වභාවය සහ පෙරමුණු කාර්‍යභාරය තහවුරු කිරීමට මාඕ සටන් වැදුණාවූ මාර්ගය වන සංස්කෘතික විප්ලවයේ අත්දැකීමෙන් උගත යුතුය. පක්ෂය තුළ මාර්ග දෙකේ අරගලය පිළිබඳ මාඕගේ අවබෝධය ගල්ටැඹක් වන් පක්ෂයක් පිළිබඳ ඔහුගේ විවේචනය සහ පක්ෂ සාමාජිකයන් දෘෂ්ඨිමය වශයෙන් යළි හඩ ගැන්වීමේ අවශ්‍යතාවය පිළිබඳ ඔහුගේ අවධාරණය ලෙනින් විසින් සංවර්ධනය කරන ලද පෙරමුණු පක්ෂය පිළිබඳ මූලික සංකල්පය පොහොසත් කළේය. මධ්‍යගතවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය යන දෙකම, නිදහස හා විනය යන දෙකම අධිෂ්ඨානයේ ඒකත්වය හා සිතේ පෞද්ගලික සැනසුම් බව සහ ප්‍රමුදිත භාවය යන දෙකම තිබෙන දේශපාලන තත්ත්වයක් නිර්මාණය කිරීම වැදගත්ය.

විප්ලවීය න්‍යායක් මගින් මෙහෙයවනු ලැබීමෙන් තොරව භාවිතය අඳුරේ අතපතගායි. මාක්ස් ලෙනින් වාදී පක්ෂ සහ සමස්තයක් ලෙස ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය සමාජයේ හා ලෝකයේ වාස්තවික තත්ත්වයන් වාස්තවික විශ්ලේෂණයකට භාජනය කිරීමේදී විප්ලවීය න්‍යාය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය ගැඹුරු කළ යුතුය. මාක්ස් ලෙනින් වාදීහු නව ප්‍රපංචයකු විශ්ලේෂණයේ ක්ෂේත්‍රය අන්‍යන්ට අත්හැර නොදැමිය යුතුය. විප්ලවීය ව්‍යාපාරය හා සමස්තයක් ලෙස සමාජය තුළ විවාදවන තීරණාත්මක ගැටළු හා ප්‍රශ්න සියල්ල අලලා න්‍යායික අරගලය ක්‍රියාත්මක ලෙස දියත් කළ යුතුය. මාක්ස් ලෙනින් වාදී පක්ෂයක් ගොඩනැගීම හා සංවිධානය කළ යුත්තේ බලය අලලා ගැනීමේ මූලික අරමුණු ස්ථිරසාර ලෙස සිත්හිධාරණය කරගෙනය. එයමත් නිර්ධන පංතිය හා බහුජනතාව සංවිධානමය වශයෙන්, දේශපාලන වශයෙන් හා දෘෂ්ඨිමය වශයෙන් සූදනම් කිරීමේ කාර්යය පවරා ගනිමින් 1980 සරත් සමයේ ඒකාබද්ධ ප්‍රකාශය ඉදිරිපත් කළ පරිදි කෙටියෙන්ම කොමියුනිස්ට්වාදීහු යනු විප්ලවීය යුද්ධ ව්‍යාපාරයෙහි පක්ෂවාදීහුය. මේ විප්ලවීය යුද්ධය හා විප්ලවීය අරගලයේ අනෙකුත් ආකාර ගෙනයා යුත්තේ දේශපාලන බලය හැසිරවීමේ හා සමාජය පරිවර්තනය කිරීමේ සමත්වනු පිණිස විප්ලවීය බහුජනතාව පුහුණු කිරීම සඳහා වන ප්‍රධාන රංග භූමියක් ලෙසය. බහුජනතාවගේ සන්නද්ධ අරගලයක් සඳහා තත්ත්වයන් තවමත් නොමැතිවිට පවා කොමියුනිස්ට්වාදීන් එවැනි තත්ත්වයන් පැන නැගීම සඳහා සූදනම් කිරීමේ වැඩ කරගෙන යාම අත්‍යාවශ්‍යය. විවිධ රටවල විප්ලවයේ කර්තව්‍යයන් සහ එය ගමන් කරන අවධීන්හි වෙනස්කම් නොතකා පක්ෂය එහි කොඳුනාරටිය අනීතික පදනමක් මත සංවිධානය කළ යුතුය. සැබෑ විප්ලවීය පක්ෂයක් කිසි කලෙක දිගු කාලයක් සාමකාමීව ඉවසා නොසිටින ප්‍රතිගාමීන්ගේ මර්ධනයට එරෙහිව නැගී සිටීමට සූදනම් කළ යුතුය යන්නද, ඇතුළුව මාක්ස් ලෙනින් වාදී පක්ෂ සම්බන්ධයෙන් වන ක්‍රියාකාරීත්වයන් සමස්ත මාලාවක්ම මේ මූලධර්මයට ඇත.

බලය සඳහා වන සන්නද්ධ අරගලයක යෙදෙන හෝ සූදනම් කෙරෙන අතර මාක්ස් ලෙනින්වාදී පක්ෂය නීත්‍යානුකූල හා විවෘත වැඩවල විවිධ ආකාරයන් ප්‍රයෝජනයට ගත යුතුය. ඉතිහාසය පෙන්වාදී ඇත්තේ එවැනි වැඩ වැදගත් හා නිශ්චිත කාලපරිච්ඡේදයකදී තීරණාත්මක පවා වන අතර ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ පංති ස්වභාවය අනාවරණය කිරීම සමඟ සම්බන්ධ කළ යුතුබව හා කිසිම තත්ත්වයකදී කොමියුනිස්ට් වාදීන් සිය ආරක්ෂාව අත්හල දැමීම නොකළ යුතු සහ විවිධ නෛතික හැකියාවන් අහෝසිවූ විට විප්ලවීය වැඩ කරගෙන යාමට පක්ෂයට ඇති හැකියාව අඛණ්ඩව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය පියවර ගැනීමට අසමත් නොවියයුතු

බවය. නෛතික වාදයට හා විකලාංග පාර්ලිමේන්තු මන්දබුද්ධික භාවයට වැටීමෙන් තොරව නෛතික හා විවෘත හැකියාවන් උපයෝගී කර ගැනීම අතර ප්‍රතිරෝධය හැසිරවීමේ අතීත අත්දැකීම සමාලෝචනය කළ යුතු අතර, යෝග්‍ය පාඩම් උකහාගත යුතුය.

දෙවර්ගයක රටවලදී විප්ලවයේ මාවත විසින් ඉදිරිපත් කරනු ලබන කාර්යභාරයන් සම්බන්ධයෙන් පුවත්පතකට වෙනස් කාර්යභාරයක් ඇති වන්නේ වී නමුදු, එහි විප්ලවීය කාර්යභාරයන් ගෙනයාමට, බහුජනතාව බලය අල්ලා ගැනීමට පුහුණු කිරීමට මාක්ස් ලෙනින්වාදී පක්ෂය නිතිපතා නිකුත් වන කොමියුනිස්ට් පුවත්පතකින් සන්නද්ධ විය යුතුය. කොමියුනිස්ට් පුවත්පත සුළු හෝ පටු නැතහොත් නීරස හෝ පොතේ ගුරුවාදී නොවිය යුතුය. එය පංති විඥාණ නිර්ධන පංතිය හා අනෙකුත් අය සමාජය හා ලෝකය පිළිබඳ අංග සම්පූර්ණ දැක්මකින්, ප්‍රධාන වශයෙන්ම සිද්ධීන් පිළිබඳ සමීපව කරන විශ්ලේෂණයක් හා දේශපාලන අනාවරණයක් ඔස්සේ සන්නද්ධ කිරීමට ප්‍රයත්න දැරිය යුතුය.

සෑම රටකම මාක්ස්වාදී පක්ෂය ගොඩනැගිය යුත්තේ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ කොටසක් වශයෙන් හා එහි අරගලය ගෙනයා යුත්තේ කොමියුනිස්ට්වාදය සඳහා වන ලෝක මහජන අරගලයේ කොටස් වශයෙන් ඊට යටත්වය. පක්ෂය තමන්ගේම ශ්‍රේණීන්ට පංති විඥාත කම්කරුවන්ට හා විප්ලවීය බහුජනතාව, ජාත්‍යන්තර වාදය යනු හුදෙක් එක් රටක නිර්ධන පංතියක් තවත් රටකට දෙන ආධාරයක් නොව වඩා වැදගත් ලෙස නිර්ධන පංති පක්ෂය යනු අධිරාජ්‍යවාදී ලෝක ක්‍රමයකට මුහුණ දෙන සියළුම මිනිස් වර්ගයා විමුක්ත කිරීමේ කාර්යභාරය ඇති තනි පංති ඵලප්‍රයෝජනයකින් යුත් ලෝක මහජන තනි පංතියක පිළිඹිබුවක්මය යන්න පිළිගනිමින්, ජාත්‍යන්තරවාදී ජීවගුණයෙන් අධ්‍යාපනය දිය යුතුය.

එවැනි ජාත්‍යන්තර අධ්‍යාපනය හා ප්‍රචාරය නිශ්චිත රටක දේශපාලන බලය පිහිටුවීමෙන් පසුව විප්ලවය අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට පක්ෂය නිර්ධන පංතිය සූදනම් කිරීමේ වෙන් කළ නොහැකි කොටසකි. දේශපාලන බලය පිහිටුවීමද, දේශපාලන බලය පිහිටුවීමද සමාජවාදී ක්‍රමයක් ස්ථාපිත කිරීම පවාද සූරාකෑම මත පදනම් වී නැත. එය එහිම අවසානයක් ලෙස නොව ලෝක ව්‍යාප්ත කොමියුනිස්ට් වාදයේ අරමුණු මුදුන් පමුණුවා ගන්නා තෙක්ම හැරීම් හා පෙරළීම් වලින්ද ජයග්‍රහණයන් මෙන්ම පරාජයන්ගෙන්ද පිරුණු දීර්ඝ පරිවර්තනීය කාලපරිච්ඡේදයක කොටසක් ලෙස දැකිය යුතුය.

## යටත් විජිත අර්ධ (හෝ නව) යටත් විජිත රටවල කාර්යභාරයෝ

අධිරාජ්‍යවාදය විසින් ගමන් කරන ලද යටත් විජිත හෝ (නව යටත් විජිත) රටවල් දෙවෙනි ලෝක යුද්ධයේ සිට අද දවස දක්වා කාලපරිච්ඡේදයේ නිර්ධන පංතියේ ලෝකපරිමාණ අරගලයේ ප්‍රධාන රංග භූමිය සංස්ථාපනය කර ඇත. මේ කාල පරිච්ඡේදයේදී විප්ලවීය යුතු ව්‍යාපාරයද ඇතුලත් විප්ලවීය අරගලයක් දියත් කිරීමේදී අත්දැකීම් විශාල ප්‍රමාණයක් මුදුන්පත් කරගෙන ඇත. අධිරජ්‍යවාදය අත්‍යන්තයෙන්ම බරපතල පරාජයක් අත්කරගෙන ඇති අතර, නිර්ධන පංතිය සමාජවාදී රටවල් පිහිටුවීම ඇතුලත් බලපෑම් සහිත ජයග්‍රහණ ගණනාවක් දිනා ඇත. ඒ අතරම මේ රටවල විප්ලවීය බහුජනතාව ජාතික විමුක්ති යුද්ධයද ඇතුළුව විරෝධාර අරගල දියත් කර තිබේ. නිර්ධන පංතිය හා එහි මිතුරන් විසින් දේශපාලන බලය පිහිටුවීමට මග නොපාදන ලද එහෙත් ජනතාවගේ ජයග්‍රහණයන්ගේ ඵල, සාමාන්‍යයෙන් එක් හෝ තවත් අධිරාජ්‍යවාදී බලයක් (බලයන්) සමඟ සංයමයෙන් යුතු නව සූරාකන්නන් විසින් අත්පත් කරගනු ලැබ ඇති තැන්වලදී කොමියුනිස්ට් ව්‍යාපාරය කටුක අත්දැකීමක් ලබා ඇත. මේ සියල්ල පෙන්වා දෙන්නේ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට මෙම වර්ගයේ රටවල විප්ලවය දියත් කිරීමේදී දශක කීපයක අත්දැකීම් විවේචනාත්මකව සම්පිණ්ඩනය කර ගැනීමේ ඉතා වැදගත් කාර්යභාරයක් තිබෙන බවය.

චීනයේ විප්ලවීය යුද්ධයේ දිගු කාලයක් පුරා මාඕ සේතුං විසින් සංවර්ධනය කරන ලද න්‍යාය යටත් විජිත හෝ අර්ධ (හෝ/නව) යටත්විජිත රටවල විප්ලවීය මූලෝපාය හා උපක්‍රම විස්තරාත්මකව සකස් කර ගැනීම සඳ හා අධ්‍යයනය ලක්ෂයක් (Point of Reference) වශයෙන් පවතී.

මේ වර්ගයේ රටවල විප්ලවයේ ඉලක්කය වන්නේ විදේශීය අධිරාජ්‍යවාදයද, අධිරාජ්‍යවාදීන් හා සමීපව සම්බන්ධ හා ඒ මත රඳා පවතින කොම්ප්‍රදෝරු නිළධර ධනේශ්වරය හා රදළයින්ද වේ.

මෙම රටවල විප්ලවය අවදි දෙකක් පසු කළ යුතුය. පළමුවැන්න නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයකි. එය ඍජුවම දෙවැන්නට එනම් සමාජවාදී විප්ලවයට මගපාදයි. විප්ලවයේ පළමු අවදියේ ස්වභාවය, ඉලක්ක හා කාර්යභාරයට, නිර්ධන පංතියට නව ප්‍රජාතන්ත්‍රවාදී වැඩපිළිවෙලට සහයෝගය දිනාගත හැකි සියළු පංති හා ස්ථරවල පුළුල් ගොඩනැගීමට හැකි කරයි සහ අවශ්‍ය කරයි. කෙසේ වුවද එය එසේ කළ යුත්තේ යෝග්‍ය තත්ත්වයන් තුල තමන්ගේම සන්නද්ධ බලවේගයන් ඇතුළුව නිර්ධන පංතියේ ස්වාධීන බලවේගයන් ඇතුළුව නිර්ධන පංතියේ ස්වාධීන බලවේගයන් සංවිධානය කිරීමේ හා ශක්තිමත් කිරීමේද විප්ලවීය බහුජනතාවගේ අනෙකුත් කොටස් අතර විශේෂයෙන්ම දිළිඳු ගොවීන් අතර නිර්ධන පංතියේ පිළිගත් ආධිපත්‍යය පිහිටුවීමේ පදනම මතය. මේ සන්ධානයේ මුල්ගල වන්නේ කම්කරු, ගොවි සන්ධානයය. නව ප්‍රජාතන්ත්‍රවාදී වැඩපිළිවෙලේ

කේන්ද්‍රීය කොටස් හිමිකර ගන්නේ කෘෂිකාර්මික විප්ලවය (එනම් ගම්බද අර්ධ රදළ සූරාකෑමට එරෙහි අරගලය (නැතහොත් "වැඩකරන්නාට ඉඩම්" යන සටන් පාඨය මුදුන්පත් කිරීම) කරගෙන යාමය.

මෙම රටවල නිර්ධන පංතියේ හා බහුජනතාවගේ සූරාකෑම බරපතලය; අධිරාජ්‍යවාදීන්ගේ දුෂ්ඨ අපරාධ නිත්‍යය; පාලක පංතීහු ඔවුන්ගේ ඒකාධිපතිත්වය නග්නව හා මෘග ලෙස භාවිතාවේ යොදති. ඔවුන් ඔවුන්ගේ ඒකාධිපතිත්වයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී හෝ පාර්ලිමේන්තු ආකාරය උපයෝගී කරගන්නා විට පවා එය ආවරණය කරන්නේ ඉතා තුනීවටය. මෙම තත්ත්වය නිර්ධන පංතියේ, ගොවියන්ගේ හා බහුජනතාවගේ, අනෙකුත් කොටස්වල පැත්තෙන් නිතර සිදුවන විප්ලවීය අරගලයන්ට මගපාදන අතර ඒවා බොහෝවිට සන්නද්ධ අරගලයේ ආකාරය ගනී. මෙම රටවල ප්‍රතිගාමී පංතීන්ට ස්ථාවර පාලනයක් පවත්වා ගැනීම හා රාජ්‍යය මුලුල්ලේ ඔවුන්ගේ බලය ස්ථාපිත කරගැනීම දුෂ්කර කරන ඒකරාශිවූ හා විකෘති සංවර්ධනයද ඇතුලත් මෙම හේතූන් නිසා බොහෝවිට මෙම රටවල විප්ලවය, විප්ලවීය බලවේගයන්ට ගම්බද එක් ආකාරයක හෝ තවත් ආකාරයක පදනම් ප්‍රදේශ පිහිටුවීම හා ගමෙන් නගරය වටලෑමේ මූලික මූලෝපාය ක්‍රියාවට නැගීමට හැකි කරන දිග්ගැසුණු විප්ලවීය යුද්ධයේ ආකාරය ගැනීමට හේතුවෙයි.

නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් ගෙනයාමේ යතුර වන්නේ නිර්ධන පංතියේ ස්වාධීන කාර්යභාරය හා එහි හැකියාවයි. එහි මාක්ස් ලෙනින්වාදී පක්ෂය මගින් විප්ලවීය අරගලය තුල පිලිගත් ආධිපත්‍යය පිහිටුවීමයි. අත්දැකීම විසින් යලි යලිත් පෙන්වාදී ඇත්තේ ජාතික ධනේශ්වර පංතියේ කොටසක් විප්ලවීය ව්‍යාපාරයට සම්බන්ධවන විට පවා එය නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයකට නායකත්වය දීමක් වන්නේ නැතිබව හා එවැන්නක් කරා වර්ධනය කළ නොහැකි බවය. මේ විප්ලවය අවසානය දක්වා ගෙනයාමක් කිසිසේත් නොවන බවය. මාක්ස්-ලෙනින්වාදී පක්ෂයක් විසින් නායකත්වය දෙනු නොලබන "අධිරාජ්‍යවාදී විරෝධී පෙරමුණක" (හෝ ඊහා සමාන විප්ලවීය පෙරමුණක) එවැනි පෙරමුණක් හෝ බලවේගයක් තුල "මාක්ස්වාදී" (සැබවින්ම ව්‍යාජ-මාක්ස්වාදී) වරණයක් භාවිතයට යොදන විට පවා ඒවායේ බංකොලොත්භාවය ඉතිහාසය පෙන්වාදෙයි. එවැනි විප්ලවීය සැකැස්මවල් වීරෝධාර අරගලයන්ට, අධිරාජ්‍යවාදීන් බලගතු ප්‍රහාරයන් එල්ල කිරීමට පවා නායකත්වය දෙනු ලැබ තිබෙන අතරම ඒවා අධිරාජ්‍යවාදී හා ධනේශ්වර බලපෑමට විරෝධය පෑමේදී දෘෂ්ඨිමය හා සංවිධානමය වශයෙන් අසමත් බව ඔප්පු කර තිබේ. එවැනි බලවේග බලය අල්ලාගත් තැන් වලදී පවා ඔවුන් සමාජය පුරා පැතුරුණු විප්ලවීය පරිවර්තනයක් ගෙනයාමට අසමත්ව තිබෙන අතර ඉක්මනින් හෝ පමාවී අධිරාජ්‍යවාදීන් විසින් පෙරළා දමනු ලැබ හෝ ඔවුන්ම අධිරාජ්‍යවාදීන් සමග සංයමයෙන් යුතුව නව ප්‍රතිගාමී බලයක් බවට පත්වීමෙන් හෝ එම ගමන අවසානයකට පත් කරනු ඇත.

පාලක පංතීන් ඔවුන්ගේ මෘග හෝ ෆැසිස්ට් ආඥාදායකත්වය ක්‍රියාවට නගන තත්ත්වයන්හිදී කොමියුනිස්ට් පක්ෂයට මෙය මගින් උපතදෙන ප්‍රවිරෝධයන් නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ වාසියට යොදගත හැකි අතර, අනෙකුත් පංති බලවේගයන් සමග තාවකාලික ගිවිසුම් වලට හෝ සන්ධානයන්ට එළඹිය හැකිය. කෙසේ වුවද මෙය සාර්ථක ලෙස කරගෙන යා හැක්කේ ෆැසිස්ට් විරෝධී අරගලයේ අන්තර්ගතය නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ අන්තර්ගතයට වැඩියමක් නොවන හෙයින් ආඥාදායකත්වයට විරුද්ධව අරගලය තුලින් මූලෝපායික අවධියක් සකස් කිරීමෙන් තොරව විප්ලවය සම්පූර්ණ කිරීමේ සමස්ත හා ප්‍රධාන කාර්යභාරය තුල එවැනි සන්ධාන යොදගනිමින් පක්ෂය එහි නායකත්වය පවත්වා ගන්නේ නම් පමණි.

මාක්ස් ලෙනින්වාදී පක්ෂය නිර්ධන පංතීන් සහ විප්ලවීය බහුජනතාව නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ගෙනයාමේ හදිසි කාර්යභාරය හා විවිධ පංතීන්ගේ, මිතුරු සතුරු පංති සමානවම-කාර්යභාරය හා ගැටෙන එලප්‍රයොජන පිළිබඳ අවබෝධයක් පමණක් නොව සමාජවාදී විප්ලවයට පරිවර්තනය වීම හා ලෝක ව්‍යාප්ත කොමියුනිස්ට්වාදයේ අවසාන ඉලක්කය පිළිබඳ සූදනම්වීමේ අවශ්‍යතාවයෙන් සන්නද්ධ කළයුතුය.

ජනතාවගේ සැබෑ අරගලයක් වීමට පක්ෂය විප්ලවීය අරගලය එවැනි ක්‍රමයකට මෙහෙයවිය යුතුය, යන්න මාක්ස් ලෙනින්වාදීන් සඳහා වන මූධර්මයකි. මාක්ස්-ලෙනින්වාදීහු යුද්ධයක් දියත් කිරීමේ දුෂ්කර තත්ත්වයන් තුලදී පවා පුලුල්ව පැතිරුණු දේශපාලන අධ්‍යාපනය ගෙනයාමට හා බහුජනතාවගේ න්‍යායික හා දෘෂ්ඨිමය මට්ටම නගාලීමට ප්‍රයත්න දැරිය යුතුය. මේ සඳහා ස්ථාවර කොමියුනිස්ට් පුවත්පතක් පවත්වා ගැනීම හා සංවර්ධනය කිරීම විප්ලවය සංස්කෘතික පරිමණ්ඩලය තුලට ගෙනයාමද අවශ්‍යවනු ඇත.

යටත්විජිත, අර්ධ (හෝ නව) විජිත රටවල මෑත කාලපරිච්ඡේදයේ ප්‍රධාන පිලිගැනීමවී ඇත්තේ හා ප්‍රවණතාවය ලෙස පවතින්නේ මේ වර්ගයේ රටවල විප්ලවීය ව්‍යාපාරය සඳහා මෙම මූලික දිශානතිය ප්‍රතික්ෂේප කිරීම හෝ නිශ්ප්‍රභාකිරීමයි. ඒවානම් නිර්ධන පංතියේ හා මාක්ස්-ලෙනින්වාදී පක්ෂයේ නායක කාර්යභාරය නිශේධ කිරීම; මහජන යුද්ධය ප්‍රතික්ෂේප කිරීම හෝ අවස්ථාවාදී විකෘති කිරීම; නිර්ධන පංතියේ නායකත්වය යටතේ කම්කරු ගොවි සන්ධානය මත පදනම් එක්සත් පෙරමුණක් ගොඩනැගීම, අතහැර දැමීමය.

මෙම සංශෝධනවාදී පිළිගැනීම අතීතයේදී වාම හා විවෘතවම දක්ෂිණාංශික ආකාරයක් යන දෙකම ගෙන ඇත්තේය. විශේෂයෙන්ම අතීතයේදී නූතන සංශෝධනවාදීහු "සමාජවාදයට සාමකාමී පරිවර්තනය" දේශණා කළ අතර, ජනතා විමුක්ති අරගලයෙහි ධනේශ්වර නායකත්වය නගාලුහ. කෙසේ වුවද මෙය විවෘතවම මෙම යටත්වීම්වාදී දක්ෂාණාංශික සංශෝධනවාදය හැමවිටම කියුවෙත් නායකත්වය හා අනෙකුත් අය විසින් ඇතැම්විට

නගාලන ලද කිසියම් වර්ගයක "වාම" සන්නද්ධ සංශෝධනවාදයක් සමඟ අනුකූලව හා වැඩි වැඩියෙන් මිශ්‍රවී ඇත. මෙම සංශෝධනවාදය සන්නද්ධ අරගලය බහුජනතාවගෙන් වෙන්කර විප්ලවීය අවධි එක තනි සමාජවාදී විප්ලවයකට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාමාර්ගය දේශණා කරයි. එය සත්තකින්ම අදහස් කරන්නේ කම්කරු පංතිය පටුවූ කඳවුරුවලට කැඳවීම හා අධිරාජ්‍යවාදය හා විදේශ ප්‍රාග්ධනය යටත් කරන හා ශක්තිමත් කරන පසුගාමී හා විකෘති ආර්ථික හා සමාජ සබඳතාවන් සම්පූර්ණයෙන් මුලිනුපුටා දැම්මේදී කම්කරු පංතිය, ගොවිජනතාව හා අනෙකුත් අයට නායකත්වයදීමේ අවශ්‍යතාවය නිශේධ කිරීමය. අද සංශෝධනවාදයේ මේ ආකාරය ජාතික විමුක්ති අරගලයන්ට කාවැදීමේ හා පාලනය කිරීමේ සමාජ අධිරාජ්‍යවාදී ප්‍රයත්නයේ, ප්‍රධාන බලකායන්ගෙන් එකකි.

යටත් විජිත අර්ධ (හෝ නව) යටත් විජිත රටවල් විප්ලවීය ව්‍යාපාරය නිවැරදි එල්ලයකින් යුතුව සංවර්ධනය කරනු සඳහා මාක්ස් ලෙනින්වාදීහු සියළු ආකාර සංශෝධනවාදීන්ට එරෙහි අරගලය වේගවත් කිරීම අඛණ්ඩව කරගෙන යාමද මේ වර්ගයේ රටවල වාස්තවික තත්ත්වයන් තවදුරටත් විශ්ලේෂණය කිරීම සඳහා වෙන් කළ නොහැකි න්‍යායික පදනමක් ලෙස මාඕ සේතුංගේ කටයුතු තහවුරු කිරීමද තෝරාගත් දේශපාලන ක්‍රියාමාර්ගයක් සංවර්ධනය කිරීමද කළ යුතුය.

ඒ අතරම යටත්විජිත හා පරාධීන රටවල විප්ලවීය ක්‍රියා මාර්ගයක් ගෙනයාමට ප්‍රයත්න දරන සැබෑ විප්ලවීය බලවේග අතර දෘෂ්‍යමානව තිබෙන අනෙකුත් ද්විතියික පිලිපැනීම් සැලකිල්ලට ගැනීමද අත්‍යාවශ්‍යය. ප්‍රථමයෙන්ම අප්‍රිකාවේ, ආසියාවේ හා ලතින් ඇමෙරිකාවේ පීඩිත ජාතීන් තනන රටවල් ශෛලමය කඳවුරක් නොවන බවද ඒවායේ පංති සංයුතිය අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට හා සමස්තයක් ලෙස ලෝක තත්ත්වයට මුහුණට මුහුණලා ඒවායේ තත්ත්වය පිළිබඳ සබඳතාවන්හිදී සැලකිය යුතු වෙනස්කම් තිබෙන බවද අවධාරණයට ගත යුතුය. මේ ප්‍රශ්න පිළිබඳ සම්පූර්ණ හා විද්‍යාත්මක මත අධ්‍යයනයක් කරගෙන යාමට අසමත්වීමේ, ජාත්‍යන්තර නිර්ධන පංතියේ පූර්ව අත්දැකීම් යාන්ත්‍රිකව කොපිකිරීමේ හෝ ජාත්‍යන්තර තත්ත්වයේ හා විශේෂිත රටවල වෙනස්වීම් පිළිබඳ හඳුනාගැනීමට අසමත්වීමේ ප්‍රවණතාවයන්ට හැක්කේ විප්ලවීය ව්‍යායාමයට හානිගෙනදීම හා මාක්ස් ලෙනින්වාදී බලවේග දුර්වල කිරීම පමණකි.

1960 ගණන්වල හා 1970 ගණන්වල මුල බොහෝ රටවල් රාශියක මාක්ස් ලෙනින්වාදී බලවේග චීනයේ සංස්කෘතික විප්ලවයේ බලපෑම යටතේ සහ පොදු ලෝක ව්‍යාප්ත විප්ලවීය උත්සන්නියෙ කොටසක් ලෙස සන්නද්ධ විප්ලවීය යුද ව්‍යාපාරය දියත් කිරීමේදී බහුජනතාවගේ කොටස් සමඟ එක්වූහ. රටවල් බොහෝ ගණනක මාක්ස් ලෙනින්වාදීහු ජනගණයේ සැලකිය යුතු කොටස් විප්ලවීය ධජය යටතේ එක්රැස් කර ගැනීමටද මෘග ප්‍රතිවිප්ලවය මර්ධනය තිබියදීත් මාක්ස්-ලෙනින්වාදී පක්ෂය සහ ජනතා සන්නද්ධ බලවේග පවත්වා ගැනීමටද සමත්වූහ. නව මාක්ස් ලෙනින්වාදී පක්ෂ ගොඩනැගීමේදී, සන්නද්ධ අරගලය දියත් කිරීමේදී මෙම මුල්කාලීන ප්‍රයත්නයන් කිසියම් ප්‍රාථමික භාවයක් මගින් සලකුණුවීම හා ඒවා තුලම දෘෂ්ඨිමය හා දේශපාලනමය දුර්වලතා ප්‍රකාශයට පත්වීම නොවැළැක්විය හැකිවිය. එසේම සත්තකින්ම අධිරාජ්‍යවාදීන් හා සංශෝධනවාදීන්, විප්ලවාදීන්, " අතිවාමාංශිකයන්" හෝ ඊටත් වඩා නරක්වුන් ලෙස හෙලාදැකීමට මෙම වැරදි හා දුර්වලතාවන් අල්ලා ගැනීම විමතිය දනවන්නක් නොවීය. ඒසේ වුවද පොදුවේ ගත්කල වැඩිදුර ප්‍රගමනයන් සඳහා පදනම සකස් කිරීමට ආධාර කළ මෙම අත්දැකීම් මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරයේ උරුමයේ වැදගත් කොටසක් ලෙස පිළිගත යුතුය.

ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමෙරිකාවේ පීඩිත රටවල පොදුවේ ගත්කල විප්ලවීය තත්ත්වයන් දිගටම පවතියි. එහෙත් මෙය නිවැරදි ලෙස තේරුම් ගැනීම වැදගත්ය. විප්ලවීය තත්ත්වය ඍජු රේඛාවක් ඔස්සේ ගමන් නොකරයි. එයට ඊටම අයත් පසුබෑම් හා ගලායාම් ඇත්තේය. කොමියුනිස්ට් පක්ෂය මෙම ගණිතය සිත්හි තබාගත යුතුය. බොහෝ විට ලින් පියාඕ වාදය සමඟ එකට යන අදහසක් විප්ලවීය යුද්ධයේ ආවේගය හා අවසාන ජයග්‍රහණය සම්පූර්ණයෙන්ම මනෝමූල සාධකය (කොමියුනිස්ට්වාදීන්) මත රඳා පවතිනවාය යන්න තහවුරු කිරීමේ ඒකාංගික ආකෘතියක් තුලට නොවැටිය යුතුය. මෙම රටවල පොදුවේ ගත්කල හැමවිටම පංති අරගලය ගෙනයාමේදී කිසියම් ආකාරයක සන්නද්ධ අරගලයක් අභිමත හා අත්‍යවශ්‍ය වන්නේ නමුදු ඇතැම් කාලපරිච්ඡේදයන්හිදී සන්නද්ධ අරගලය, අරගලයේ ප්‍රධාන ආකාරය විය හැකි අතර තවත් කාලපරිච්ඡේදයන්හි එය එසේ නොවිය හැක.

විප්ලවීය තත්ත්වය බැසයමින් තිබෙන විට කොමියුනිස්ට් පක්ෂය යෝග්‍ය උපක්‍රම නිශ්චය කරගතයුතු අතර ඉක්මන් හා නොඉවසිලිවන්ත ඉදිරිගමන්වලට ඇද නොවැටිය යුතුය. එවැනි තත්ත්වයන් තුල දිග්ගැසුණු විප්ලවීය මහජන යුද්ධය ගෙනයාමේදී දේශපාලන හා සංවිධානමය සූදනම්වීම් වල අවශ්‍යතාවය කිසිදු ආකාරයකින් නොසලකා නොසිටිය යුතු අතර, තවදුර ඉදිරියට යාම් සඳහා යෝග්‍ය තත්ත්වයන් එළඹෙන තෙක් රැඳී සිටින ගමන් විප්ලවයේ සංවර්ධනය කඩිනම් කිරීම පිණිස වාස්තවික තත්ත්වයන්ට උචිත අරගල හා සංවිධාන ආකෘතීන් නිශ්චය කරගත යුතුය. විප්ලවීය යුද්ධය සඳහා තත්ත්වයන් රටපුරාම හිතකර බවට පත්වනතෙක් සන්නද්ධ අරගලය ආරම්භ කිරීම හෝ සන්නද්ධ අරගලයේ කිසියම් ආකාරයක් උපයෝගී කරගැනීම කල්දමනු ඇති ඕනෑම වැරදි සහගත අදහසකට එරෙහිව සටන්වැදීම අවශ්‍යය. මෙම මතය "තනි ගිණි පුපුරකට ගිණි ජාලාවක් ඇවිලිය හැකිය". යන මාඕගේ කියමනට එරෙහිව මෙම රටවල විප්ලවයේ හා විප්ලවීය තත්ත්වයේ අසමාන සංවර්ධනය නිශේධ කරයි. එසේම විශේෂිත රටක විප්ලවය මත සමස්ත ජාත්‍යන්තර තත්ත්වය බලපෑමක් කරන්නේය යන්න අවධාරණය කරගැනීම වැදගත්ය. මෙය සැලකිල්ලට නොගැනීම ලෝක පරිමාණ සංවර්ධනයන් මගින් විප්ලවීය

ක්‍රියාවලිය කඩිනම් කරන විටක එම අවස්ථාව ග්‍රහණය කරගැනීමට මාක්ස් ලෙනින් වාදීන් සූදානම් තත්ත්වයකට හැර දමනු ඇත.

නව අධිරාජ්‍යවාදී යුද්ධයක අනතුර සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින්නාවූ අද නව යටත්විජිත රටවල මාක්ස්-ලෙනින් වාදී පක්ෂ හා සන්ධානද අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව අවධානය යොමුකිරීමේ හදිසි කාර්යභාරයට මුහුණට මුහුණලා සිටී. විවිධ අධිරාජ්‍යවාදී හවුල් සමග පවත්වගෙන යන සම්බන්ධයේ තත්ත්වයට අනුව එම රටවල් බොහොමයක් අධිරාජ්‍යවාදී යුද්ධය තුලට ඇද ගැනීමේ හැකියාව තිබේය යන්න කොමියුනිස්ට්වාදීහු සැලකිල්ලට ගත යුතුය. එවැනි අධිරාජ්‍යවාදී යුද්ධයක් මධ්‍යයේ කොමියුනිස්ට් පක්ෂ පැන නැගිය හැකි විවිධ වාස්තවික තත්ත්වයන් සැලකිල්ලට ගැනීමද මෙම තත්ත්වයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ සිතීම සංවර්ධනය කර ගැනීමද කළ යුතුය. මෙම රටවල් නිශ්චිත විෂයමූල තත්ත්වයන් තුල පොදුවේ ගත් කළ බහුජනතාව අධිරාජ්‍යවාදී යුද්ධයක අනතුර හා ප්‍රතිවිපාක ගැන දන්නේ අඩුවෙනි.

එමඟින් මාක්ස් ලෙනින්වාදීහු ඔවුන්ට අධ්‍යාපනය දිය යුත්තාහ. අධිරාජ්‍යවාදී යුද්ධයක් පිළිබඳ සිද්ධියකදී මාක්ස් ලෙනින් වාදීන් ඉතාමත් වැදගත් කාර්යභාරය වන්නේ විප්ලවීය අරගලය වේගවත් කිරීමට හා අධිරාජ්‍යවාදී යුද්ධය අධිරාජ්‍යවාදයට හා ප්‍රතිගාමිත්වයට එරෙහි විප්ලවය යුද්ධයක් බවට හැරවීට එවැනි යුද්ධයක් විසින් ඇති කරන ලද වාසිදයක අවස්ථාවන් උපයෝගී කර ගැනීමය.

1980 සරත් සමයෙහි ඒකාබද්ධ ප්‍රකාශය මෙසේ පෙන්වා දෙයි. "බල ආධිපත්‍යය පතුරුවා ඇති රටවල ධනේශ්වර සම්බන්ධතාවන්ගේ වැදගත් මූලයන් හඳුන්වාදීමේ; ප්‍රතික්ෂේප කළ නොහැකි ප්‍රවණතාවයක් අධිරාජ්‍යවාදයට ඇත්තේය. ඇතැම් පරාදීන රටවල ඒවා අර්ධ රදළ ලෙස ගුණාභිකරණය කිරීම නිවැරදි නොවන තරම් දුරට ධනේශ්වර සංවර්ධනය ගමන්කර ඇත්තේය. රදළ හෝ අරධ රදළ නිෂ්පාදන සම්බන්ධතාවයන් වැදගත් මූලයන් හා උත්තර නිර්මිතය තුළ ඒවා පිළිඹිබුවීම තවමත් පවතිද්දීම වුවද ඒවා "ප්‍රධාන වශයෙන්ම ධනවාදී" යැයි හැඳින්වීම වඩා හොඳයි.

එවැනි රටවල මේ තත්ත්වයන් පිළිබඳව වාස්තවික විශ්ලේෂණයක් කරගත යුතු අතර මාවතඃ කාර්යභාරයන්, පංති බලවේගයන්ගේ ස්වභාවය හා පෙළගැසීම සම්බන්ධයෙන් වන උචිත නිගමනයන් කරා එළඹිය යුතුය. කෙසේ වුවද විදේශ අධිරාජ්‍යවාදය විප්ලවයේ ඉලක්කයක් ලෙස දිගටම පවතී. "අධිරාජ්‍යවාදය විසින් ආධිපත්‍යයට ගනු ලැබ ඇති රටවල ධනේශ්වර සම්බන්ධතාවය වැඩි වැඩියෙන් හඳුන්වාදීමේ ප්‍රතිවිපාක මෙන්ම "ප්‍රධාන වශයෙන් ධනවාදී යැයි නිවැරදි ලෙස හැඳින්විය හැකි එකී පීඩිත රටවල විශේෂිත කාරණය පිළිබඳ විශ්ලේෂණයද ජාත්‍යන්තර ව්‍යාපාරයේ වැදගත් කාර්යභාරයක් ලෙස දිගටම පවතියි. එසේ වූවද අද ඉතා වැදගත් ඇතැම් නිගමනයන්ට එළඹිය හැකිවනු ඇත.

විධිමත් දේශපාලන ස්වාධීනත්වයේ හා පුළුල්ව පැතිරුණු ධනවාදී සබඳතාවන් හඳුන්වාදීමේ සංයෝගය පැරණි සෘජු යටත් විජිත ඉතා වැඩි ගනනක හෝ බොහොමයක නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක අවශ්‍යතාවය මුලිනුපුටා දමා ඇත්තේය යන මතය වැරදි සහ අන්තරාදයකය. විවිධ ට්‍රොට්ස්කිවාදීන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, විප්ලවීය මාක්ස්වාදයේ සුලු ධනපති විවේචකයන් විසින් ප්‍රවර්ධනය කරනු ලැබ ඇති මේ මතය අධිරාජ්‍යවාදය හා එය විසින් පීඩනයට පත් කරන ලද ජාතීන් අතර ගුණාත්මක වෙනසක් නැති බවද එහෙයින් අධිරාජ්‍යවාදී යුගයේ ඉතාම වැදගත් ලක්ෂණයන්ගෙන් එකක්, එක පහරකින් මුලිනුපුටා දැමිය හැකි බවද අදහස් කරයි.

ඇත්ත වශයෙන්ම අරාජ්‍යවාදය එය විසින් සූරාකනු ලබන රටවල නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය කෙරෙහි විලංගුවක් වීම දිගටම සිදුවෙයි. ප්‍රතික්ෂේප කළ නොහැකි ලෙස විශාල හෝ අඩු මට්ටම්වලින් එය හඳුන්වා දෙන ධනේශ්වර "සංවර්ධනය" මැනවින් ඒකීභූතවූ ජාතික වෙළඳපලකට හා "සම්භව්‍ය" ධනේශ්වර ආර්ථික ක්‍රමයකට නොව; විදේශීය ප්‍රාග්ධනය මත හා එහි ඵලප්‍රයෝජන මත අත්‍යන්තයෙන්ම ඒකාංගිත සංවර්ධනයකට මග පාදයි.

ප්‍රධාන වශයෙන්ම ධනේශ්වර වූ පීඩිත රටවල පවා විදේශීය අධිරාජ්‍යවාදය එහි දේශීය ආධාරකරුවන් සමගම විප්ලවයේ ප්‍රථම අවධියේදී ප්‍රධාන ඉලක්කය වශයෙන් පවතියි. එම රටවල විප්ලවයේ මාවත බොහෝ සෙයින් අර්ධ රදළ යටත් සබඳතාවයන් පවත්නා රටවල විප්ලවයන්ට වඩා සැලකිය යුතු අන්දමින් වෙනස්වනු ඇති අතරම; පොදුවේ ගත්කල ඒවායේ විප්ලවය සමාජවාදී විප්ලවය පටන්ගැනීමට හැකිවීමට පෙර ප්‍රජාතන්ත්‍රවාදී, අධිරාජ්‍ය විරෝධී අවධියක් පසුකිරීම තවමත් අවශ්‍යය.

දේශපාලනමය හා යුධමය යන දෙඅංශයෙන්ම ගම්බදට නගරවල ඇති සබඳතාවයේ සාපේක්ෂ වැදගත්කම ඇතැම් පීඩිත රටවල වර්ධනයවූ ධනේශ්වර සංවර්ධනය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති අත්‍යන්තයෙන්ම වැදගත් ප්‍රශ්නයකි. මෙම රටවල් සමහරකදී නගරයේ කැරලි දියත්කිරීම මගින් සන්නද්ධ අරගලය ආරම්භ කිරීම නිවැරදිය. ගම්බද විසින් නගර වටකරනු තැබීමේ මාදිලිය අනුගමනය නොකළ යුතුය. තවද විප්ලවයේ මාවත ගම්බද විසින් නගර වටලනු ලැබීමේ මාර්ගය ගන්නා රටවලදී පවා බහුජන කැලඹීමක් නරගවල නැගීසිටීම් හා කැරලි වලට මගපාදන තත්ත්වයන් ඇතිකළ හැකි අතර, පක්ෂය එහි සමස්ථ මූලෝපාය තුල එවැනි තත්ත්වයන් උපයෝගී කරගැනීමට සූදානම් විය යුතුය. කෙසේ වුවද මෙම තත්ත්වයන් දෙකේදීම නිර්ධන පංති

නායකත්වය යටතේ විප්ලවයට සහභාගිවීමට ගොවීන් බලමුළු ගැන්වීමේ හැකියාව එහි සාර්ථකත්වය සඳහා තීරණාත්මක වෙයි.

ධනේශ්වර සංවර්ධනයේ ක්‍රියාවලියට පෙර මධ්‍යම රජය ව්‍යුහයක පිහිටුවීම හේතුකොටගෙන අර්ධ (හෝ නව) යටත් විජිත රටවල් තුල ප්‍රධානකොටම බහුජාතික සමාජ සැකසුම් ඇතිවී ඇත; මේවායේ විශාල සංඛ්‍යාවක මෙම රාජ්‍යයන් නිර්මාණය කරනු ලැබුයේ අධිරාජ්‍යවාදීන්ම විසින්ය. තවදුරටත් මෙම රාජ්‍යයන්හි දේශසීමා නිර්මාණය කරන ලද්දේ අධිරාජ්‍යවාදී අත්පත්කර ගැනීම් වල හා කූටෝපායන්හි ප්‍රතිඵලයක් ලෙසිනි. මෙලෙස සාමාන්‍යකරණය වන්නේ අධිරාජ්‍යවාදය විසින් පීඩනයට පත්කරන ලද රාජ්‍ය සීමාවන්තුල පීඩිත ජාතීන්, ජාතික අසමානතාවය හා අනුකම්පා විරහිත ජාතික පීඩනය පැවතීමයි. අපේ යුගයේ ජාතික ප්‍රශ්ණය තනිරටවල අභ්‍යන්තර ප්‍රශ්ණයක් වශයෙන් පැවතීම නැවතී තිබෙන අතර නිර්ධන පංති විප්ලවයේ පොදු ප්‍රශ්ණයට ද්විතියික බවට පත්ව ඇත. මෙලෙස එහි සම්පූර්ණ විසඳුම අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය මත සෘජුවම රඳාපවතින තත්ත්වයට පත්ව ඇත. මේ සන්දර්භය තුල මාක්ස්-ලෙනින් වාදීහු බහුජාතික අර්ධ රදළ රාජ්‍යයන්හි පීඩිත ජාතීන්ගේ ස්වයං තිරණයට ඇති අයිතිය තහවුරු කළ යුතුය.

මෙලෙස යටත්විජිත හා නව යටත්විජිත රටවල මාක්ස් ලෙනින්වාදීහු දෘශ්ඨිමය හා දේශපාලන පෙරමුණේ ද්විත්ව කාර්යභාරයකට මුහුණදී සිටින්නේ යැයි කිවහැක. ඔවුහු එක් අතකින් මේ වර්ගයේ රටවල විප්ලවයේ ස්වභාවය හා මාවත සම්බන්ධ මාඕගේ මූලික උගැන්වීම් ආරක්ෂා කිරීම හා තහවුරු කිරීම අඛණ්ඩව කරගෙන යායුත්තාසේම 1960 ගනන් වල (ලෙනින්ගේ වචන අපේ වචන වලින් කියන්නේ නම්) "උමතු වර්ෂ" සමග අතිනත්ගත් විප්ලවීය ප්‍රයත්නයන් ආරක්ෂා කිරීම හා ගොඩනැගීම කළ යුතුය. ඒ අතරම විප්ලවීය කොමියුනිස්ට්වාදීහු අතින් අත්දැකීම් මෙන්ම; මෙම රටවල විප්ලවීය මාවතට බලපාන වත්මන් තත්ත්වයන් හා වර්ධනයක් යන දෙකම විශ්ලේෂණය කර ගැනීමට විවේචනාත්මක මාක්ස්වාදී ජීවගුණය යොදගත යුතුය.

## අධිරාජ්‍යවාදී රටවල්

ඒකාබද්ධ ප්‍රකාශනය පෙන්වා දෙන පරිදි අධිරාජ්‍යවාදී රටවල මාක්ස් ලෙනින්වාදීන්ගේ "මූලෝපාය හා උපක්‍රම පිළිබඳව මූලික විමර්ශනය ලක්ෂණය ලෙස ඔක්තෝබර් විප්ලවය දිගටම පවතියි". අධිරාජ්‍යවාදී රටවල නිර්ධන පංති විප්ලවය සඳහා සූදනම්වීම හා දියත් කිරීම පිළිබඳ මූලික ලෙනින්වාදී මූලධර්ම සංශෝධනවාදී විකෘති කිරීම් කන්දරාවකින් දිගු කලක් තිස්සේ වළලා දමාතිබූ නිසා මෙම කාරණය යලි තහවුරු කිරීම හා ගැඹුරු කිරීම අත්‍යවශ්‍ය ලෙනින් කොමියුනිස්ට්වාදීන් උදෙසා තත්ත්වයන් මෝරාගිය විට ප්‍රතිගාමී රජය බලයට එරෙහිව ඉලක්ක කරගත් කැරැල්ලකදී සමාජයේ විප්ලවීය බලවේගයන්ට නායකත්වය දීමට සමත් කම්කරුවන්ගේ අංගසම්පූර්ණ දේශපාලන ව්‍යාපාරයක් කම්කරුවන්ගේ දෛනික ආර්ථික අරගලය තුලින් සාංසිද්ධිකව වර්ධනය විය නොහැකි බවද, තවදුරටත් මෙම අරගලය විප්ලවීය කාර්ය රංගභූමියෙහි ඉතාම වැදගත් ඒවා නොවූ බවද ඔහු, නිවැරදි ලෙස පෙන්වා දුන්නේය. විප්ලවවාදීන් බහුජනතාවගේ සාංසිද්ධික ව්‍යාපාරය ශ්‍රම ශක්තියේ තත්ත්වයන් හා විකිණීම සඳහා කෙරෙන පටු අරගලයෙන් ඉවතට හැරවිය යුතුයැයි ඔහු තර්ක කළේය. මෙය කිරීම සඳහා කම්කරුවන්ට, ඔවුන්ගේ ආසන්න අත්දැකීම් වලට "පිටතින්" සියල්ලටම ඉහලින් <u>දේශපාලන හෙළිදරව් කිරීම්</u> මගින් සිය දේශපාලන, සංස්කෘතික විද්‍යාත්මක යනාදී සමාජයේ සෑම පරිමණ්ඩලයකම සියලු ප්‍රධාන සිදුවීම් ගැන කරන විශ්ලේෂණයන් මගින් සහ දේශපාලන විඥාණය ගෙන ඒම අත්‍යවශ්‍යය. නිර්ධන පංතියේ පංති විඥාණයෙන් යුත්, එහි විප්ලවීය කාර්යභාරයගන්නා සමාජයේ අනෙකුත් සියලු පංතීන්ගේ ස්වභාවය හා කාර්යභාරය පිළිබඳව සවිඥාණික කොටසක් ගොඩනැගිය හැක්කේ මේ මාර්ගයෙන් පමණකි.

උද්ඝෝෂණය හා ප්‍රචාරය තිරණාත්මක වන්නා සේම ඒවා ප්‍රමාණවත් නොවන බවද ලෙනින් අවධාරණය කළේය. බහුජනතාවට ඔවුන්ගේ විප්ලවීය සවිඥාණක බව හා සටන් කිරීමේ හැකියාව ඇත්තේ පංති අරගලය ඔස්සේ, විශේෂයෙන්ම විප්ලවීය අරගලය ඔස්සේ පමණකි. මේ මාර්ගයෙන් සහ කොමියුනිස්ට් වාදීන්ගේ සර්ව පාර්ශවීය වැඩ සමග බහුජනතාව ඔවුන්ගේම අත්දැකීම් සහ පංති අරගලයේ කෝව ඔස්සේ අධ්‍යාපනය ලබා ගනිති. කම්කරු පංතියේ ශෛලමය එක්සත් භාවය, දේශනකරනු වෙනුවට ලෙනින් අධිරාජ්‍යවාදය නොවැලැක්විය හැකි ලෙස පංති සබඳතාවන්ගේ, හැරවුමකට අධිරාජ්‍යවාදී රටවල කම්කරු පංතිය පීඩිත හා සූරා කෑමට ලක් වූ නිර්ධන පංතිද, අධිරාජ්‍යවාදී ධනේශ්වරයෙන් ප්‍රතිලාභ ලබන හා ඒ සමග සමාගමයෙන් සිටින කම්කරුවන්ගේ ඉහල කොටස්ද අතර බෙදීමකට මඟ පාදන බව පෙන්වා දුන්නේය.

එලෙසම ලෙනින් එක් ආකාරයකින් හෝ තවත් ආකාරයකින් "තමන්ගේම" අධිරාජ්‍යවාදී ධනේශ්වරය සමග නිර්ධන පංතියේ ඵලප්‍රයෝජන අනන්‍ය කිරීමට අපේක්ෂා කරන සියල්ලගේම දෘඩතර විරුද්ධවාදියෙකු විය. ඔහු අධිරාජ්‍යවාදී යුද්ධය හා සම්බන්ධයේදී විප්ලවීය පරාජය වාදයේ ක්‍රියාමාර්ගයක් සඳහා දෘඩතර ලෙස සටන්වැදුණු අතර, ධනේශ්වරයේ ඉරී වැරහැලිවුන, "ජාතික ධජයට" එරෙහිව නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයේ ධජය ස්ථිරසාරව ඔසවාලීය. එලෙසම ලෙනින් ධනවාදී රටවල විප්ලවය ඇති කිරීමේ හැකියාව මෙම රටවල කලාතුරකින් ඇති වන එහෙත් ධනවාදයේ පදනම් ප්‍රතිවිරෝධයන් සංකේන්ද්‍රණය කර ගන්නා විප්ලවීය තත්ත්වයන්ගේ සංවර්ධනය සමඟ සම්බන්ධකර විශ්ලේශනය කළේය. ඔහු බහුජනතාව අතර සමාජවාදී බලපෑම ඇති කිරීමෙහිලා හැමදෙයක්ම ක්‍රමික හා සාමකාමී සමුච්චයක් මත රාශිභූත කිරීමෙහි දෙවන ජාත්‍යන්තරයේ වැරදිද විශ්ලේශනය කළේය. ඒ වෙනුවට සාපේක්ෂ වශයෙන් "සාමකාමී" කාලවල කොමියුනිස්ට් වාදීන්ගේ කාර්යභාරය වුයේ මෙම

වර්ගයේ රටවල විප්ලවීය පරිවර්තනයන්ගේ හැකියාව ඇති කරන විටකදී හා එළඹීමට ඇති දශකයන් සඳහා සමාජය හා ලෝකය විප්ලවවාදීන්ගේ කාර්යභාරයන්ගෙන් සලකුණ කරන විටකදී, ඉතිහාසයේ අති විශේෂ මොහොතවල් සඳහා සූදානම්වීම යයි ඔහු තර්ක කළේය.

මේ විෂයයන් පිළිබඳව හා විද්‍යාත්මක සමාජවාදී න්‍යායයේ සමස්ථයට එහි ඇති කේන්ද්‍රතාවය පිලිබඳව ලෙනින් පැහැදිලිව දක්වා තිබියදීත් ලෙනින්වාදීහු බොහෝ විට එය නොසලකා හැරීම තෝරා ගෙන ඇත.

කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ඉතිහාසයේ මුල් කාලයෙහි ඇතැම් කොමියුනිස්ට් පක්ෂ තුල විප්ලවීය නොවන තත්ත්වයන් තුල බහුජන පක්ෂ පිලිබඳ වැරදි සහගත සංකල්පද ආර්ථිකවාදී පිලිගැනීම්ද දර්ශනය විය. මේ ප්‍රවණතාවන් ශක්තියෙන් වැඩුණු අතර අධිරාජ්‍යවාදී රටවල ධනේශ්වර ජාතික ඵලප්‍රයෝජන නගාලීමේ අනෙකුත් වැරදි හා අත්‍යන්තරයෙන්ම අන්තරාදායක ප්‍රවණතාවන් සමග එක පෙළට සිටිමින් ඒවා කොමියුනිස්ට්වාදී ව්‍යාපාරයේ විශාවාසයේ කොන්දේසි බවට පත්විය.

අවාසනාවකට 1960 ගනන්වල නූතන සංශෝධනවාදයෙන් කැඩී වෙන්වීම සැලකියයුතු තරම් දුරට විශේෂයෙන්ම අධිරාජ්‍යවාදී රටවල කොමියුනිස්ට් වාදින්ගේ මූලෝපාය හා උපක්‍රම සම්බන්ධයෙන් ගත් කළ අසම්පූර්ණ විය. "සාමකාමී මාවත" ප්‍රතික්ෂේප කිරීමද විවේචනය කිරීමද, අවසාන වශයෙන් සන්නද්ධ අරගලයක් ප්‍රචාරය කිරීමද කළ අතරම, ධනවාදී රටවල් කොමියුනිස්ට් ව්‍යාපාරය තුල සංශෝධනවාදයේ ඓතිහාසික මුල් සමාලෝචනය සඳහා දැරුවේ අඩු ප්‍රයත්නයකි. එසේම පොදුවේ ගත් කළ ලෙනින්ගේ නායකත්වය යටතේ පන්නරය ලැබූ "ඔක්තෝබර් මාවත" වඩා 1930 ගණන්වල ඇතැම් කොමියුනිස්ට් පක්ෂවල නිශේධනීය අත්දැකීම් මත වඩාත් පදනම්වූ කාර්ය පද්ධතියකට හැඩ ගැසුණි.

මේ කාලපරිච්ඡේදය තුල අධිරාජ්‍යවාදී රටවල් බොහෝමයක අලුතින් බිහිවූ විප්ලවීය බලවේගයන්ගේ සැලකිය යුතු කොටසක් ප්‍රතිධාවනකාරිත්වයෙන් හෝ වාමාංශික කට්ටිවාදයේ ප්‍රතිපත්තීන් කරාවූ වැරදි ප්‍රවේශ ගත්තේය. එහෙත් විශේෂයෙන්ම කාලය ගෙවීයන විට නව මාක්ස් ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන පොදු වශයෙන් කම්කරුවන්ගේ දෛණික අරගලය මත සංකේන්ද්‍රණය වෙමින් හා මේ අරගලවල නායකත්වය සඳහා සංශෝධනවාදීන්ද, ධනේශ්වර වෘත්තිය සමිති නිළධාරීන්ද සමග සටන් කරමින් ඔවුන්ගේ වැඩවල කේන්ද්‍ර සකස් කරන ක්‍රියාමාර්ගයක් ක්‍රියාවට නැගුණි. "සාමාන්‍ය කම්කරුවා " පිලිබඳ මේ වින්දනය හා ආර්ථික අරගලය කෙරෙහි සම්පූර්ණ අවධානය, යොමු කිරීම සැබැවින්ම විප්ලවීය ආස්තානයක් කරා හා මාක්ස් ලෙනින්වාදී පක්ෂ කරා කම්කරුවන් ස්වල්ප ප්‍රමාණයක් දිනා ගැනීමට මග පෑදූ නමුදු මාක්ස් ලෙනින්වාදී පක්ෂත් ඒවායේ සාමාජිකයනුත් මත අවාසනාවන්ත ලෙස ඇති කර තිබුණේ පිරිහීමේ ප්‍රතිවිපාකයකි. මෙම රටවල මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාර තුල ආධිපත්‍ය දරා සිටි ආර්ථිකවාදී ක්‍රියාමාර්ග භය බිහිකරන ලද විප්ලවීය මූලධර්මන්ට එරෙහිව තියුණුව නැගී සිටියේය. මෙම පක්ෂවල ප්‍රධාන කොටස තැනූ තරුණ සටන් කාමීන් ඒවාට සම්බන්ධවූයේ ලෝක ව්‍යාප්ත විප්ලවීය ක්‍රියාවලියට දායකත්වයක් සැපයීම ඔවුන්ට අවශ්‍ය නිසාය. කොමියුනිස්ට්වාදය සඳහා අරගලය කිරීමට ඔවුන්ට අවශ්‍ය වූ නිසාය. 1960 ගණන්වල විප්ලවීය ව්‍යාපාරය නිර්ධන පංතියකරා ව්‍යාප්ත කිරීමේ හා කම්කරුවන් සමග ඒකාබද්ධ කිරීමේ ආශාව සංස්කෘතික විප්ලවයේ තරුණ ජනයාගේ අත්දැකීම් විසින් පුබුදුවන ලද්දේ කුඩා මට්ටමකින් නොවේ. බලගතු හා නිවැරදි විප්ලවීය මනෝභාවයක්වූ එය කෙසේ වුවද ආර්ථිකවාදයේ බලපෑම යටතේ හුස්මහිර කිරීමට හා විකෘති කිරීමට පාත්‍රවිය. ලෝක ව්‍යාප්ත විප්ලවීය උත්සන්නිය පසුබැසි විට මාක්ස් ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන විප්ලවීය නොවන පදනමක් මත බහුජන අනුගාමිත්වයක් ලබා ගැනීම සඳහා වු ප්‍රයත්නයකදී, වඩ වඩාත් දකුණට ගමන් කිරීම කරා හැඩුරුවිය. මෙම සංවිධානවල සාමාජිකයන් විප්ලවීය සඳහා සූදානම්වීම සහ ඔවුන් සැබවින්ම අනුගමනය කළ කාර්‍යභාරයන් සම්බන්ධයෙන් දුටුවේ එන්ට එන්ටම අඩු සබඳතාවකි. මෙහි ප්‍රතිඵලය වූයේ විකෘති කිරීම, මානසික ඇදවැටීම හි අවස්ථාවාදය ශක්තිමත් කිරීමය.

මාක්ස්-ලෙනින්වාදීන් අතර, අධිරාජ්‍යවාදී රටවල "ජාතික කාර්යභාරයන්ට" (නැතහොත් වඩා නිවැරදි ඒවා පිළිබඳ ඌනතාවය) අදාලව පැවැති ව්‍යාකූලතාවය විසින් මේ සියල්ල තව දුරටත් සංකීර්ණ කරනු ලැබීය. කලින් පෙන්වා දුන් පරිදි, චීන කොමියුනිස්ට් පක්ෂයේ පවාද මේ සම්බන්ධයෙන් බරපතල වැරදි, මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරය විසින් එකට එකකරන ලද වැරදි අඩංගු කර ගත්තේය.

එක්සත් ජනපද අධිරාජ්‍යයට (ඒ කාලයේ ලෝක ප්‍රතිගාමිත්වයේ බලකොටු ලෙස නිවැරදිව වෙන්කොට හඳුනා ගත්) එරෙහිව සටන්කිරීමේ නිවැරදි, ජාත්‍යන්තරවාදී ආශාව අධිරාජ්‍යවාදී රාජ්‍යයන්ගේ ජාතික ඵලප්‍රයෝජන නගාලීම සමග ඒවා එක්සත් ජනපදය හා (විශේෂයෙන්ම 1970 ගණන්වල මුල්කාලයේ සිට ඉදිරියට) සෝවියට් සංගමය සමග ප්‍රතිවිරෝධයට පැමිණතාක් දුරට වැඩි වැඩියෙන් එකට මිශ්‍රකරගත්, ලෝක කටයුතු සම්බන්ධව හෝ මාක්ස් - ලෙනින්වාදී පක්ෂ විශාල ප්‍රමාණයක් විසින් වැඩි වැඩියෙන් වැරදි ආස්ථාන ජාත්‍යන්තර වාදයට එරෙහිව ගිය අස්ථාන ගනු ලැබිණි. මෙම ප්‍රශ්න පිළිබඳ මෙම පක්ෂවල ආස්ථාන විෂය මූල වශයෙන් අධිරාජ්‍යවාදී යුද සූදානම්වීම් හා ප්‍රතිවිප්ලවීය මර්ධන සමග බැඳුණේය. කලින් පෙන්වාදුන් පරිදි අධිරාජ්‍යවාදී රටවල ඇතැම් මාක්ස් ලෙනින්වාදී පක්ෂ 1976 චීනයෙහි කුදෙතාවටත් පෙරසිටම සම්පූර්ණයෙන්ම සමාජ ජාත්‍යන්තරවාදී ක්‍රියා මාර්ගයක් අනුගමනය කර තිබුණි.

මෙම බරපතල හා එකිනෙකට සම්බන්ධ වැරදි දෙක ආර්ථික වාදය හා සමාජ ජාත්‍යෝන්මදවාදය (කලලමය අවස්ථාවේවූ සංශෝධනවාදී, ලෝක තුනේ න්‍යය, ඇතුලත්ව) චීනයේ කුදෙතා වෙන් පසු යුරෝපයේ මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරයේ දෘශ්‍යමාන බිඳ වැටීමට දයකත්වය දුන් ප්‍රධාන මනෝ මූලක සාධක විය. සංවර්ධිත ධනේශ්වර රටවල කොමියුනිස්ට් වාදීහු සැබෑ මාක්ස් ලෙනින්වාදී පක්ෂ ගොඩනැගීමේදී හා ශක්තිමත් කිරීමේදී මෙම පීලි පැනීම් වල බලපෑමට එරෙහි අරගලයට විශාල අවධාරණයක් දිය යුතුය.

සංවර්ධිත ධනපති රටවල් බොහොමයක මාක්ස්-ලෙනින්වාදී ව්‍යාපාරය මඬේ එරී දැගලද්දී විප්ලවීය තරුණයන්ගේ ඇතැම් කොටස් "නව දෘශ්ඨිවාදක්" හා වෙනස් මාවතක් සොයා ගැනීම ප්‍රයත්න දැරූහ. විප්ලවීය තරුණයන්ගෙන් සැලකිය යුතු කොටසක් කෙරෙහිවූ අරාජිකවාදයේ හා සුළු ධනේශ්වර රැඩිකල් වාදයේ අනෙකුත් ආකාරයන්ගේ ආකර්ශණය විප්ලවීය වෙනසක් ගෙනඒමේ ආශාව පිළිඹිබු කළේය. එහෙත් මේ බලවේග එකම අංග සම්පූර්ණ විප්ලවීය මතවාදය, මාක්ස්වාදය පිළිබඳ ඔවුන්ගේ ඇති ඌණකතාවය නිසා එපමණින්ම, සම්පූර්ණ විප්ලවීය කාර්ය භාරයක් රඟපෑමට සමත් නොවේ. ඇතැම් රටවල සුළුපිරිසක් විප්ලවීය බහුජනතාව මත රඳා නොපවතින හා අධිරාජ්‍යවාදය විප්ලවීය පෙරලාදැමීමක නිවැරදි ඉදිරිදැක්මක් නොමැති මතවාදයක් හා දේශපාලන ක්‍රියාමාර්ගයක් වන ත්‍රස්තවාදය කරා හැරුණාහ. මේ ත්‍රස්තවාදී ව්‍යාපාර ඉතා "විප්ලවීය" අධිරාජ්‍යවාදී සෝවියට් සංගමයේ ආරක්ෂාව වැනි සංශෝධනවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී පීලිපැනිම් මාලාවක් ඒකාබද්ධ කර ඇත්තාහ. මෙම ව්‍යාපාර බහුජනතාවගේ දේශපාලන විඥාණය නගාලීමේ කේන්ද්‍රිය බව ග්‍රහණය කර ගැනීමද විප්ලවයට සූදනම්වීමක් ලෙස දේශපාලන අරගලයේදී ඔවුන්ට නායකත්වය දීමේද දැක්වූ මූලික අසාර්ථකත්වය ආර්ථිකවාදය සමග බෙදහදගෙන ඇත.

අධිරාජ්‍යවාදී රටවල විප්ලවීය ක්‍රියාමාර්ගයක් මතුකර ගැනීමේ ආරම්භක ලක්ෂ්‍යය මූලික ලෙනින්වාදී මූලධර්මයන් "භාරාමතු කරගැනීම" වන අතර එය තවමත් ආරම්භයක් පමණකි. අද අධිරාජ්‍යවාදී රටවල් ශතවර්ෂය ආරම්භයේදී රුසියාවෙන් සහ ඒකාලයේ අනෙකුත් අධිරාජ්‍යවාදී රටවලින් වැදගත් ලෙසින් වෙනස් වේ. එසේම ඔක්තෝබර් විප්ලවයේ සිට මෙම විප්ලවීය ව්‍යාපාරයක් ගොඩනැගීමට ප්‍රයත්න දැරීමේදී අත්දැකීම් විශාල ප්‍රමාණයක් (සාධනීය හා නිශේධනීය) සමුච්චය කෙරි ඇත්තේය.

අධිරාජ්‍යවාදී ක්‍රියාවලියේ සංවර්ධනය මෙම රටවල ඇතැම් ඒවායේ ගොවිජනතාවගේ දෘශ්‍යමාන අහෝසි කිරීම සුළු ධනේශ්වරයේ නව කොටස් වල සීඝ්‍ර වර්ධනය ආදියද ඇතුළත්ව වැදගත් වෙනස්කම් ගණනාවකට මගපාද ඇත. කෙසේ වූවද ඉතාමත් වැදගත් සංවර්ධනය වන්නේ පීඩිත ජාතීන්ගේ කොල්ලකෑම මත පදනම්වූ අධිරාජ්‍යවාදී රාජ්‍යයන්ගේ විශාල වශයෙන් වැඩුණු පරපෝෂිතවාදය හා ඒ සමග අතිනතගත් කම්කරු පංතියේ තවදුර ධ්‍රැවීකරණයක්ය. අධිරාජ්‍යවාදයෙන් ප්‍රතිලාභ ලබන හා එහි ඵලප්‍රයෝජනයන්ට කැමැත්තෙන්ම සේවය කරන හොඳින් ආරක්ෂාවුනු, හා බලපෑම් සහගත විශාල ශ්‍රමික වංශවත් පැලැන්තියක් අධිරාජ්‍යවාදී රටවල පවතී. අධිරාජ්‍යවාදය මෙම කම්කරුවන් හා දරිද්‍රතාවයට පත්වූද රැඩිකල් වෙනසක් සඳහා අරගල කිරීමට ආශා කරන්නාවූද කම්කරු පංතියේ සැලකිය යුතු ස්තරයක් (එහි සංචිත කාර්මි හමුදව - සේවා වියුක්තිකයන්ද ඇතුළත්ව) අතර ප්‍රතිවිරෝධය තියුණු කරයි. ප්‍රධාන බටහිර අධිරාජ්‍යවාදී රටවල කම්කරු පංතියේ මෙම පහල කොටස සංයුක්ත වන්නේ ආධිපත්‍යයට යටත්වූ රටවලින් පැමිණි සංක්‍රමණික කම්කරුවන් විශාල ප්‍රමාණයකින් නොව එලෙසම ඇතැම් තැන්හිදී අධිරාජ්‍යවාදී රාජ්‍යයන් තුලම වන ජාතික සුළුතරයන්ගෙන් හා පීඩිත ජාතීන්ගෙන්ද සංයුක්ත වේ. අධිරාජ්‍යවාදී රටවල නිර්ධන පංති පක්ෂයේ සමාජ පදනමේ ඉතාම වැදගත් මූල්‍ය වන්නේ කම්කරු පංතියේ මෙම පහල කොටසයි. කම්කරුවන්ගේ මේ කොටස් දෙක අතර වංශවත් ශ්‍රමික පැලැන්තිය පරිද්දෙන් අධිරාජ්‍යවාදයෙන් ප්‍රතිලාභ නොලබන්නාවූද සාපේක්ෂ සමෘද්ධියේ දිගු කාල පරිච්ඡේදයක් මගින් විශාල ලෙස බලපා ඇති හා සාමාන්‍ය කාලවලදී විප්ලවීය මනෝභාවයකින් තොරවූද කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සමහරවිට බහුතරයක් සිටිති. අර්බුදය ගැඹුරුවීම මගින් ඔවුන් ක්‍රියාකාරිත්වය කරා වේගයෙන් තල්ලු කරනු ලබන විට හා විශේෂයෙන්ම විප්ලවීය තත්ත්වයක් වර්ධනය වන විට මාක්ස්-ලෙනින්වාදී පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන විප්ලවීය, පංති විඥාත නිර්ධනීන්ද ප්‍රතිගාමී ශ්‍රමික වංශක්කාර පෙළැන්තිය හා එහි දේශපාලන ප්‍රකාශනයන්ද, අතර අරගලයේදී මෙම කම්කරුවන් පුළුල් කොටසකගේ පක්ෂපාතිත්වය දිනා ගැනීම සඳහා වන අරගලය වැදගත් මූලයක් වනු ඇත. අධිරාජ්‍යවාදී රටවල දී මාක්ස්-ලෙනින්වාදී පක්ෂය කම්කරු පංතියේ ධනේශ්වරකරණයවූ කොටස් අතර වැඩකරගෙන යාම නොතකා නොසිටිය යුත් අතරම එහි කටයුතු ප්‍රධාන වශයෙන්ම කම්කරුවන්ගේ ඉතාම විප්ලවීය විභවයන්ගෙන් යුත් කොටස් මත පදනම් කළ යුතුය.

කම්කරු පංතියේ අනෙකුත් ස්තරයන්ට අයත් බහු ජනයාගේ පැවැත්ම සඳහා වන එදිනෙද අරගලයට අවධානය යෙදීමෙන් තොරව විප්ලවීය ව්‍යාපාරයක් ගොඩ නැගීමද එය ජයග්‍රහනය කරා මෙහෙයවීමද අසීරුය. පක්ෂය තමන්ගේ හෝ බහුජනතාවගේ ශක්තීන් ඒවා මත විසුරුවාලීම නොකළ යුතුය. ආර්ථික අරගලය මෙහෙයවීම ආර්ථික වාදය හා සමාන දෙයක් නොවේ. නිර්ධන පංතිය මෙම අරගල, විශේෂයෙන්ම සම්ප්‍රදායික සීමාවන්ගෙන් ඔබ්බට ගමන් කිරීමේ විභවයකින් යුත් අරගල බරපතල ලෙස සැලකිල්ලට ලත යුතුය. මෙහි තේරුම විශේෂයෙන්ම විප්ලවය සඳහා තත්ත්වයන් මෝරා යන විට විප්ලවීය ආස්ථානයක් කරා බහුජනතාවගේ ගමන වඩාත් පහසු කරන අන්දමින් මෙම අරගල සමග සබඳතාවෙන් යුතුව වැඩ කටයුතු කරගෙන යායුතු බවය.

මාක්ස්-ලෙනින්වාදී පක්ෂය කම්හල් කොමියුනිස්ට්වාදයේ බලකොටු බවට හරවනු යන ලෙනින්ගේ හඬගෑම ඉටුකරලීමට ප්‍රයත්න දැරිය යුතුය. මෙය විප්ලවයට සූදානම් වීම සඳහා වන වැදගත් දේශපාලන ප්‍රශ්නයක් පමණක්ම නොවේ, නිර්ධන පංතියේ සන්නද්ධ අරගලය සමග ද වැදගත් සම්බන්ධයක් ඇති ප්‍රශ්නයකි.

අධිරාජ්‍යවාදී රටවල මාක්ස්-ලෙනින්වාදී පක්ෂ විප්ලවීය බහුජන ක්‍රියාමාර්ගයක් විකාශනය කිරීම හා ක්‍රියාවට නැගීම ඔස්සේ විප්ලවීය බහුජනතාව අතරට ගැඹුරට මුල් අදින්නේ නැතිනම් එවිට විප්ලවීය තත්ත්වයන් උපයෝගී කර ගැනීමේ ප්‍රයත්නයක් බරපතල ලෙස දුර්වලවනු ඇත. සමස්තයක් වශයෙන් ගත්කල බොල්ෂෙවික් පක්ෂය විසින් සංවර්ධනය කරන ලද හා ලෙනින් විසින් සම්පිණ්ඩනය කරන ලද උපක්‍රම හා වැඩ කිරීමේ ශෛලිය මූලික මගපෙන්වීමක් ලෙස තවමත් වලංගුව පවතී. එසේ වුවද විප්ලවීය බහුජන ක්‍රියා මාරගයක් හා වැඩ ශෛලියක් සංවර්ධනය කිරීම පිණිස අධිරාජ්‍යවාදී රටවල මාක්ස්-ලෙනින්වාදීහු අරගලයේ හා සංවිධානයේ "නියම" ආකෘතීන් පිළිබඳ සම්ප්‍රදයික ප්‍රඥාව හා එවැනි සිද්ධාන්ත සියල්ල පසකට දමා තත්කාලීන අධිරාජ්‍යවාදයේ සුවිශේෂ ලක්ෂණ හා බහුජනයා විසින් දියත් කරනු ලැබ ඇති අරගලයන්ගේ ස්වභාවය විශ්ලේෂණය කරගෙන විප්ලවීය භාවිතය සඳහා වාසිදයක නව භූමි අත් කර ගැනීමටද අරගලයේ හා බහුජන සංවිධානයන්ගේ නව ආකාරයන් සංවර්ධනය කිරීමටද ක්‍රියා කළ යුත්තාහ.

ලෙනින් එය ඊසා විචිත්‍රව ප්‍රකාශයට පත්කර ඇත්තාසේ "කොමියුනිස්ට් පරමාදර්ශකයා වෘත්තිය සමිති ලේකම්වරයෙකු නොව <u>ජනතාවගේ නායකයෙකු</u> විය යුතුය."

මාක්ස්-ලෙනින්වාදී පක්ෂය තමන් ප්‍රධාන වශයෙන් නිර්ධන පංතියේ ඉතාමත්ම විප්ලවීය විභවයකින් යුත් කොටස් මත පදනම් කරගත යුතු අතරම සුළු ධනේශ්වර මූලයන්ද ඇතුළුව ජනගහනයේ අනෙකුත් කොටස් අතර ද විප්ලවීය කටයුතු මුදුන් පමුණුවා ගැනීමට ප්‍රයත්න දැරිය යුතුය.

අධිරාජ්‍යවාදී රටවල් කිපයකට වඩා වැඩි ගණනක නිර්ධන පංති විප්ලවයට ඉතා වාසිදයක විය හැකි තවත් සාධකයක් වන්නේ මේ මෑගයින්ගේ උදරයන් තුළම පීඩිත ජාතීන්ගේ හා ජාතික සුළු ජනකොටස්වල පැවතීමයි. බොහෝවිට, ඉහත සඳහන් කළ පරිදි මෙම ජාතිකත්වයන්ගෙන් එන නිර්ධනීන් විශාල සංඛ්‍යාවක් ඒවායේ තනි, බහුජාතික නිර්ධන පංතියේ වැදගත් කොටසක් සාක්ෂාත් කරයි. එහෙත් මීට අතිරේකව අනෙකුත් පංතීන් හා මේ පීඩිත ජාතිකත්වයෙන් ස්තර ඇතුලත් කර ගන්නා හා වැළඳ ගන්නා වඩා පුළුල් ජාතික ප්‍රශ්නයක් ඇත්තේය. එවැනි තත්ත්වයන් බොහෝවිට මෙම අධිරාජ්‍යවාදී රාජ්‍යයන් තුළ තියුණු ජාතික අරගලයන්ට උපත දී ඇත. ඒවා එහි නිර්ධන පංති පක්ෂ විසින් නියමාකාරයෙන් හසුරවා ගනු ලබන්නේ නම් හා ඒවා එවැනි අරගලවලට සහයෝගය දීම හා යෙදිය හැකි තැන්වල ස්වයං තිරණ අයිතීන් පිළිගැනීම කළ යුතු අතර අධිරාජ්‍යවාදී රාජ්‍යයන් පෙරළා දැමීමේ අරගලයේදී මේ අරගලයන්ට සැලකිය යුත් කාර්යභාරයක් රංගපාන්නට හැකිය.

නැගෙනහිර යුරෝපීය රටවලදී මාක්ස්-ලෙනින්වාදීහු සෝවියට් සමාජ අධිරාජ්‍යවාදයේ ආධිපත්‍යද තමන්ගේම නිළධාරිවාදී ධනේශ්වරයේ රාජ්‍ය බලය පෙරළා දැමීමේ කේන්ද්‍රිය කර්තව්‍යය අවම කිරීමෙන් හෝ නොසලකා හැරීමෙන් තොරව එය විසින් ඉදිරිපත් කරනු ලබන වාස්තවික කාර්යභාරයන්ද සැලකිල්ලට ගනිමින් සමාජවාදී විප්ලවය සඳහා නිවැරදි මුලෝපාය හා උපක්‍රම සකස් කර ගැනීමේ කාර්ය භාරයට මුහුණදී සිටිති.

ලෝක යුද්ධය කරාවූ වත්මන් සංවර්ධනයන්ද එය ඉදිරිපත් කරන අන්තරායන් හා විප්ලවීය අවස්ථාවන් යන දෙකමද අධිරාජ්‍යවාදී රටවල මාක්ස්වාදීන්ට ලෝක යුද්ධය හා විප්ලවය පිළිබඳ ප්‍රශ්නය මත විශාල වැදගත් කමක් රැඳවීමට නියම කරයි. මාක්ස්-ලෙනින්වාදී පක්ෂය අධිරාජ්‍යවාදී යුද සූදානම, විශේෂයෙන්ම "තමන්ගේම" අධිරාජ්‍යවාදී පාලක පංතියේ එල ප්‍රයෝජන හා උපාය උපක්‍රම හෙළිදරව් කළ යුතුය. එය එවැනි යුද්ධයක් ගලා එන්නේ ධනපති සූරාකෑමේම ස්වභාවයෙන්ම බවත් එය අධිරාජ්‍යවාදී අර්ථශාස්ත්‍රයේ හා දේශපාලනයේ අඛණ්ඩත්වයක් බවත් ලෝක විප්ලවයේ ඉදිරි ගමනට පමණක්ම යුද සූදානම්වීම් නවතා එහි මූලාශ්‍රයන්ට පහර දිය හැකි බවත් බහුජනතාවට විදහා පෙන්විය යුතුය. කොමියුනිස්ට්වාදීහු නිර්ධන පංතින් එල ප්‍රයෝජන එම අධිරාජ්‍යවාදී ධනේශ්වරයේ එල ප්‍රයෝජන සමඟ අනන්‍ය කිරීමට දරන සෑම ප්‍රයත්නයකටම එරෙහිව තිරසාර ලෙස සටන් වැදිය යුත් අතර පංති විඥාත නිර්ධන පංතින් හා අනෙකුත් අය ජාතික ධජයේ ලේවැකි අධිරාජ්‍යවාදී ස්වභාවය දැකීමට පුහුණු කළ යුත්තාහ.

කොමියුනිස්ට්වාදීහු පීඩිත ජනතාවන්ගේ හා ජාතීන්ගේ අධිරාජ්‍ය විරෝධී අරගලයට එවැනි අරගලයන්ට මාක්ස් ලෙනින්වාදීන් විසින් නායකත්වය නොදෙන විට පවා බහු ජනතාව අතර සහයෝගිතාව ගොඩනැගිය යුත්තාහ. පක්ෂය තිරසාර ලෙස හා සංයුක්ත ලෙස පංතිය ජාත්‍යන්තරවාදීව පුහුණු කළ යුත්තාහ.

ලෝක යුද්ධයේ වර්ධන අනතුර දැන් අධිරාජ්‍යවාදී රටවල බහුජනතාව විසින් තියුණු ලෙස හඟිනු ලැබ ඇත. කොමියුනිස්ට්වාදීහු යුද සූදානම්වීම් වලට එරෙහි බහුජන ව්‍යාපාරයන්ට විශාල අවධානයක් යෙදිය යුතු අතර මෙම ව්‍යාපාර විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න වලට ආමන්ත්‍රණය කළ යුත්තාහ. මාක්ස් ලෙනින්වාදී පක්ෂය මෙම ව්‍යාපාරයන්ගේ විප්ලවීය මූලයන්ට ආධාර කළ යුතු අතර ඒවා තම ශ්‍රේණීන් කරා දිනා ගැනීමට ප්‍රයත්න දැරීමය. පක්ෂය බහුජනතාවගේ යුද විරෝධී මනෝභාවයන් සමග එක්සත් විය යුතු අතරම "සාමව්‍යාපාරයකට" අධිරාජ්‍යවාදී යුද්ධයන් වැළැක්විය හැකිය යන මායාවන්ට, විශේෂයෙන්ම එක අධිරාජ්‍යවාදයක් හෝ අනෙකක්

උදෙසා සෙසු ලෝකයේ විය පැහැදමෙන් යුද්ධයේ ව්‍යාසනය මඟ හැරීමට අපේක්ෂා කිරීමේ ජාතික ජාත්‍යෝත්මවාදී මතයන්ට එරෙහිව සටන් වැදිය යුතුය.

අධිරාජ්‍යවාදී යුද්ධ සූදානවීම් වලට එරෙහි අරගලයේ බහුජනාව සමග එක්සත් වන අතරම මාක්ස් ලෙනින් වාදී පක්ෂය අධිරාජ්‍යවාදී රටවල න්‍යෂ්ටික නිදහස් කලාප සඳහා වන ඉල්ලීම්, අධිරාජ්‍යවාදී හවුල් අහෝසි කිරීම් මායාකාරී මතයක් වැනි ඒවා ඉදිරිපත් කිරීම හෝ ඒවාට කොමියුනිස්ට්වාදීහු අධිරාජ්‍යවාදය ලෝක යුද්ධය උපදවන බව සියලුම අධිරාජ්‍යවාදී පාලක පංතීන් මානව වර්ගයාට එරෙහි මේ අපරාධ සඳහා සූදානම් වීමෙහි පටලැවී සිටින බව සහ එකම සැබෑ විසඳුම වැටී ඇත්තේ "මධ්‍යස්ථභාවය" කරාවන මායාකාරී හා අවසාන වශයෙන් ප්‍රතිගාමී ප්‍රයත්නයන්ගෙන් තුල නොව විප්ලවය තුල බව බහු ජනතාව අනවරතව අවධාරණය කර දැක්විය යුතුය.

මාක්ස්-ලෙනින්වාදී පක්ෂය විප්ලවය එලෙස ලෝක යුද්ධය නැවැත්වීමට සමත් නොවන්නේනම් අධිරාජ්‍යවාදීන්ගේ දුර්වලතාවෙන් වාසි අත්පත් කරගැනීමෙහිලා ගොඩනැගීමට එය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව මෙහෙයවීමට හා අධිරාජ්‍යවාදී යුද්ධය සිවිල් යුද්ධයකට භාරවීම සඳහා ප්‍රයත්න දැරීමට තමාවම හා විප්ලවීය නිර්ධන පංතිය සූදානම් කිරීමට කටයුතු කළ යුතුය. සියලු අධිරාජ්‍යවාදී රටවලදී මාක්ස්-ලෙනින්වාදීන් විසින් විප්ලවීය පරාජයවාදී ආස්ථානය යොදගනු ලැබිය යුතුය. අධිරාජ්‍යවාදී රටවල කොමියුනිස්ට් පුවත්පත් නිර්ධන පංති විප්ලවය සූදානම් කිරීමේදී විශේෂයෙන්ම වැදගත් කාර්යභාරයක් රඟපායි. පුවත්පත පක්ෂයේ සාමූහික ප්‍රචාරකයෙකු, උද්ඝෝෂකයකු හා සංවිධායකයෙකු ලෙස ගොඩනැගිය යුතුය.

සංවර්ධිත ධනපති රටවල මාක්ස්-ලෙනින්වාදීහු ඔවුන්ගේ ශ්‍රේණි තුළ සංශෝධනවාදයේ හා ප්‍රතිසංස්කරණවාදයේ විනාශකාරී බලපෑමට එරෙහිව දිගටම සටන් කිරීමේ කාර්යභාරයට මුහුණදී සිටිති. මෙය කිරීමේ යතුර ලෙස පවතින්නේ ඔක්තෝබර් විප්ලවයට සූදානම් වීමේ හා නායකත්වය දීමේ මාර්ගයේදී ලෙනින් විසින් සංවර්ධනය කරන ලද මූලධර්ම උදෙසා සටන් වැදීමය. ඒ අතරම මාක්ස්-ලෙනින්වාදීහු අතීත අත්දැකීම් සම්පිණ්ඩනය කළ යුත්තාහ; සිද්ධාන්තවාදයට එරෙහිව සටන් වැදිය යුත්තාහ: මූලධර්මවලදී ස්ථිරසාර හා උපක්‍රමවලදී නම්‍ය විය යුත්තාහ: පසුගිය දශක කිහිපය පුරා අධිරාජ්‍යවාදී රටවල සිදුවූ සංවර්ධනයන් පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදෙමින් ඒවායින් ගලා එන විප්ලවීය මූලෝපායේ තවදුර සංවර්ධනය භාරගත යුත්තාහ.

## මාක්ස්-ලෙනින්වාදීන්ගේ දෘෂ්ඨිමය, දේශපාලනමය සහ සංවිධානමය එක්සත් බව උදෙසා

කොමියුනිස්ට් ව්‍යාපාරය ජාත්‍යන්තර ව්‍යාපාරයකි, ජාත්‍යන්තර ව්‍යාපාරයේ පමණක් විය හැක්කකි. සත්තකින්ම විද්‍යාත්මක සමාජවාදයේ දියත් කිරීමේදීම, කොමියුනිස්ට් ප්‍රකාශනය "සියලු රටවල කම්කරුවනි, එක්වව් ! යයි ප්‍රකාශ කළේය. ඔක්තෝබර් විප්ලවයේ සාර්ථකත්වයක් සමග කොමියුනිස්ට් ජාත්‍යන්තරය ගොඩනැගීම සහ ලෝකගෝලයේ සෑම මුල්ලක් කරාම මාක්ස්-ලෙනින්වාදයේ තදන්තර පැතිරයාම මගින් කම්කරු පංතීන් ජාත්‍යන්තර එක්සත්භාවය වඩාත් වැඩි ගැඹුරු අර්ථයක් ගත්තේය.

අද, මාක්ස්-ලෙනින්වාදීන්ගේ ශ්‍රේණි අතර ගැඹුරු අර්බුදයක් මැද්දේ ජාත්‍යන්තර එක්සත්භාවයේ අවශ්‍යතාවය හා නව ජාත්‍යන්තර සංවිධානයක් සඳහා වන අවශ්‍යතාවය හදිසි කරුණක් වශයෙන් දැනී ඇත.

ගෝලීය මට්ටමක් මත තමන්ගේම සංවිධානය ගොඩනැගීමේදී ජාත්‍යන්තර නිර්ධන පංතිය සාධනීය හා නිෂේධනීය යන දෙවර්ගයේම අත්දැකීම් සමුච්චය කරගෙන තිබේ. ලෝක පක්ෂයක් පිළිබඳ සංකල්පය සහ කොමින්ටර්නයේ අධිමධ්‍යගතකරණයේ ප්‍රතිඵලය ඇගයීමකට ලක්කළ යුතුය. එලෙස එම කාලපරිච්ඡේදයේදී මෙන්ම පළමුවන, දෙවන හා තුන්වන ජාත්‍යන්තරයන්ගේ සාධනීය මුදුන්පත් කරගැනීම් වලින් යෝග්‍ය, පාඩම් උකහාගත හැකිය. එලෙසම ජාත්‍යන්තර මට්ටමේ මාක්ස්-ලෙනින්වාදී බලවේගයන්ගේ සංවිධානාත්මක එක්සත්භාවය ගොඩනැගීමේදී අත්‍යවශ්‍ය නායක කාර්යභාරය රඟපෑම ප්‍රතික්ෂේප කිරීම කරා ඔවුන් මෙහෙයවාලු කොමින්ටර්නයේ නිශේධනීය පැති සම්බන්ධයෙන් ගත් චීන කොමියුනිස්ට් පක්ෂයේ දැඩි ප්‍රතික්‍රියාව ඇගයීමට ලක්කිරීමද අත්‍යවශ්‍යය.

ලෝක ඉතිහාසයත් වත්මන් සන්ධිස්ථානයක් ජාත්‍යන්තර නිර්ධන පංතිය තමන්ගේම සංවිධානයක්, අතීතයේ වටිනා අත්දැකීම් උකහා ගනිමින් මාක්ස්වාදයේ-ලෙනින්වාදයේ මාඕ සේතුං චින්තනයේ මත පදනම්වූ නව ආකාරයක ජාත්‍යන්තරයෙත් ගොඩනැගීමේ අභියෝගය භාරගත යුතුව තිබේ. එලෙසම පැරිස් කොමියුනිස්ට්වරුන්ගේ සිට දෙව්ලොව කැළඹීමට නිර්භීතවූ ෂැංහයි නිර්ධන පංති කැරලිකරුවන් දක්වා අපේ පූර්වගාමීන් දැක්වූ විප්ලවීය නිර්භීත භාවයෙන් යුතුව මෙම අරමුණ ජාත්‍යන්තර නිර්ධන පංතිය හා ලෝකයේ පීඩිතයන් හමුවේ නිර්භීත ලෙස ප්‍රකාශයට පත්කළ යුත්තේය, "කළ නොහැක්කාවූ" කොමියුනිස්ට් ලෝකයක් ගොඩනැගීමට අදිටන් කරගත යුත්තේය.

එවැනි සංවිධානයක් ගොඩනැගීමේ ක්‍රියාවලිය පෙනෙන්නට තිබෙන පරිදි නම් දිග්ගැස්සුණු එකක් වනු ඇත.

මේ සම්බන්ධයෙන් මාක්ස්-ලෙනින්වාදීන් මුහුණ දෙන ඉතාමත්ම තීරණාත්මක කාර්යභාරය වන්නේ අද දවසේ ලෝකයේ සංකීර්ණ යථාර්ථයට හා එය ඉදිරිපත් කරන අභියෝගයන්ට අනුකූල වන්නාවූ පොදු ක්‍රියාමාර්ගයක් නිවැරදි හා ජීවසම්පන්න සංවිධානමය ආකෘතියක් සකසා ගැනීමය.

එවැනි නව ජාත්‍යන්තරයක කටයුත්ත වනු ඇත්තේ අත්දැකීම් සම්පිණ්ඩනය දිගටම කරගෙන යෑම හා ගැඹුරුකිරීම, එය බිහිකළ පදනම මත පොදු ක්‍රියා මාර්ගය සංවර්ධනය කිරීම සම සමස්ථ මාර්ගෝපදේශක දේශපාලන මධ්‍යස්ථානයක් ලෙස සේවය කිරීමය. මෙම කාර්යභාරයන් මාක්ස්-ලෙනින්වාදීන්ගේ දෘෂ්ඨිමය හා දේශපාලනමය එක්සත්භාවය මත පදනම්වූ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයේ ආකෘතියක් අවශ්‍ය බවට පත්කරයි. එහෙත් ඊට එවැනි ජාත්‍යන්තර සංවිධානයක ශාඛාවන් ලෝක විප්ලවය සූදනම් කිරීමේ හා වේගවත් කිරීමේදී සෑම පක්ෂයකම කොටස් පිළිබඳ අර්ථයෙන් එක එක රටේ විප්ලවයට නායකත්වය දීමේ සමාන අයිතිය හා වගකීම තිබෙන විවිධ පක්ෂ වනු ඇති බැවින් තනි රාජ්‍යයක පක්ෂයක් කටයුතු කරන ස්වභාවයෙන්ම කටයුතු කළ නොහැකිය.

දෙවන සම්මේලනයේදී මාක්ස්-ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන විසින් මුදුන්පත් කරගත් දෘෂ්ඨිමය හා දේශපාලන එක්සත්භාවයේ හා මේරීමේ මට්ටම සලකා බැලීමේදී ඔවුහු ඉහතින් සඳහන් කළ ඉහළ කාර්යභාරයන් සම්පූර්ණ කිරීමේ දිශාවේදී පහත සඳහන් මූලික පියවර ගත යුත්තාහ.

01 ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය ප්‍රතිනිර්මාණය කිරීමේදී සජීවී අවියක් ලෙස ජාත්‍යන්තර සඟරාවක් සංවර්ධනය කළ යුතුය. එය එක විටම විශ්ලේෂණයේ හා දේශපාලන විවරණයේ අවයවයක් මෙන්ම ජාත්‍යන්තර ව්‍යාපාරයේ ප්‍රශ්න විවාද කෙරෙන සංසදයක් යන දෙකම විය යුතුය. එය හැකිතරම් භාෂා රාශියකට පරිවර්තනය කළ යුතු අතර මාක්ස්-ලෙනින්වාදී පක්ෂවල ශ්‍රේණීන් හා අනෙකුත් විප්ලවීය බලවේග අතර උද්යෝගිමත් ලෙස බෙද හැරිය යුතුය. මාක්ස්-ලෙනින්වාදී පක්ෂ සඟරාව සමග නිතිපතා අදහස් හුවමාරු කරගත යුතු අතර ලිපිවලින් හා විවේචනවලින් දයක විය යුතුය.

02 නව මාක්ස්-ලෙනින්වාදී පක්ෂ ගොඩනැගීමට ආධාර කිරීම හා පවතින ඒවා ශක්තිමත් කිරීම ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ පොදු කාර්යභාරයකි. මෙම තීරණාත්මක කාර්ය මුදුන් පමුණුවා ගැනීමේදී විවිධ රටවල මාක්ස්-ලෙනින්වාදීන්ට ආධාර කිරීම පිණිස සමස්ථයක් ලෙස ජාත්‍යන්තර ව්‍යාපාරය වෙනුවෙන් ක්‍රම විධි සොයා ගත යුතුය.

03 මාක්ස්-ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන විසින් ඒකාබද්ධ හා සම්බන්ධීකරණයෙන් යුත් අරගල ගෙනයනු ලැබිය යුතුය. මැයි 1 කටයුතු එක්සත් සටන් පාඨ යටතේ ගෙනයා යුතුය.

04 විවිධ මාක්ස්-ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන වෙනස්කම් සම්බන්ධ ප්‍රතිපත්තිමය අරගලය දිගටම ගෙනයන අතරම ජාත්‍යන්තර සම්මේලන වලදී පිළිගන්නා ලද හා මෙම පක්ෂ විසින් එකඟ වන ලද දේශපාලන ක්‍රියාමාර්ගය හා තීරණ ක්‍රියාවට නැගිය යුතුය.

05 සියලුම මාක්ස්-ලෙනින්වාදී පක්ෂ හා සංවිධාන ඔවුන්ගේ හැකියාවේ මිම්ම තුළ කොමියුනිස්ට්වාදීන්ගේ එක්සත් බව වැඩි දියුණු කිරීමෙහිලා කළයුතු කාර්යභාරයන්ට මූල්‍යමය හා ප්‍රායෝගික වශයෙන් දයක විය යුතුය.

06 කොමියුනිස්ට්වාදීන් දෘෂ්ඨිමය, දේශපාලනමය හා සංවිධානමය සමගිය වැඩි දියුණු කිරීමේ සමස්ත ක්‍රියාවලියට, කොමියුනිස්ට් ව්‍යාපාරය සඳහා පොදු ක්‍රියාමාර්ගයක් සඳහා කෙටුම්පත් යෝජනාව සූදනම් කිරීමද ඇතුළත්ව නායකත්වය දීම සඳහා අන්තරවාර කමිටුවක් කළලමය දේශපාලන මධ්‍යස්ථානයක පිහිටුවිය යුතුය.

********************************************************

ප්‍රත්පත්තිමය අරගලයක් ඔස්සේ මුදුන්පත් කරගත් මාක්ස්-ලෙනින්වාදීන්ගේ වඩා ඉහළ දෘෂ්ඨිමය හා දේශපාලන සමගියේ මට්ටම මත පදනම් වූ විප්ලවීය ජාත්‍යන්තර ව්‍යාපාරයේ ව්‍යවස්ථාව ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය උදෙසා අත්‍යන්තයෙන්ම වැදගත් පියවරක් නියෝජනය කරයි. එහෙත් ලෝකයේ විෂයමූල සංවර්ධනයේ ග්‍රහණය කරගැනීම සඳහා වන ගමනේ අවශ්‍යතාවය තවමත් දෘශ්‍යමානව තිබේ. සියලු රටවල බහුජනතාවගේ විප්ලවීය අරගලය සැබෑ විප්ලවීය නායකත්වයක් ඉල්ලා හඬගාමින් සිටී. සැබෑ මාක්ස්-ලෙනින්වාදී

බලවේගයන්ට තනි තනි රටවල ලෝක පරිමාණයක් මත ස්ථාවර වීම සඳහා හා ඔවුන්ගේ සමගියේ මට්ටම නගාලීම සඳහා වන අරගලය ඔවුන් දිගටම ගෙන යද්දී පවා එවැනි නායකත්වයක් සැපයීමේ වගකීම ඇත්තේය. මේ ආකාරයෙන් නිවැරදි දෘෂ්ඨිමය හා දේශපාලන ක්‍රියාමාර්ගය නව සොල්දදුවන් ඉදිරියට ගෙනෙනු ඇති අතර ලෝකයේ සද බලගතු ද්‍රව්‍යමය බලවේගයක් බවට පත්වනු ඇත. කොමියුනිස්ට් ප්‍රකාශනයේ වචන අද ඒ තරමටම පැහැදිලිව නින්නාද වෙයි: "නිර්ධනීන්ට ඔවුන්ගේ යදම් මිස නැතිවීමට දෙයක් නැත. ඔවුන්ට දිනාගැනීමට ලොවක් ඇත."

1984 මාර්තු
විප්ලවීය ජාත්‍යන්තර ව්‍යාපාරය
[Revolutionary International Movement (RIM)]